Śabdánuśásanaya

OR

THE GRAMMAR OF THE SINHALESE LANGUAGE

BY MUDALIYÁR SIMON DE SILVA.

Translator to the Department of Public Instruction.

Approved by the Director of Public Instruction.

ශබ්දානුශාසනය

හෙවත්

සිංහලභාෂාවේ ව්‍යාකරණය.

ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුවේ

සයිමොන් ද සිල්වා මුදලිතැන විසින් සම්පාදනයකරනලදී.

ප්‍රසිද්ධ ඉගැන්වීමේ ඩිරැක්ටර්තුමා විසින්

පිළිගන්නාලදී.

1901.

Sabdanusasanaya

OR

THE GRAMMAR OF THE SINHALESE LANGUAGE

BY MUDALIYÁR SIMON DE SILVA.

Translator to the Department of Public Instruction.

Approved by the Director of Public Instruction.

ශබ්දානුශාසනය.

හෙවත්

සිංහලභාෂාවේ ව්‍යාකරණය.

ප්‍රසිද්ධ ඉගැන්වීම් දේපාර්තමේන්තුවේ

සයිමන් ද සිල්වා මුදලිතැන විසින් සම්පාදනයකරනලදී.

ප්‍රසිද්ධ ඉගැන්වීමේ ඩිරෙක්ටර් තුමා විසින්

පිළිගන්නාලදී.

1901.

THE OPINION OF A. VAN CUYLENBURG ESQ.
INSPECTOR OF SCHOOLS.

I am glad to find that a practical Sinhalese Grammar is at last in prospect.

The Sidat-Sangarawa and the lesser manuals of later pandits seemed to me of very little help to the Student of Modern Sinhalese. • In spite of them all controverted points of orthography &c., gave scope for the bitterest wrangling. Mr. Silva's book, however, aims at the elucidation of many of these and kindred points and can safely be relied on as an ultimate Court of Appeal for the settlement of some of the controversies which have been waged so bitterly between the pandits of this country.

The large number of examples given in support of his definitions forms a very pleasing feature of the book.

I wish it all success and that is saying very little for the labour and research brought to bear on its compilation.

A. van Cuylenburg,
Inspector of Schools.

COLOMBO, April 30th, 1897.

CONTENTS.—පටුන.

		පිට.
	ප්‍රාරම්භය	1
1.	සිංහලභාෂාව	2
2.	ශෝධ්‍ය සහ එහි විභාග	2
3.	අක්ෂරයන්ගේ නම් කියන විධිය	4
4.	ස්වර හා ව්‍යඤ්ජන	5
5.	ව්‍යඤ්ජනයන් හා ප්‍රාණාක්ෂරයන් ගැලපෙන ක්‍රමය	6
6.	ව්‍යඤ්ජනාරූඪවූ ප්‍රාණාක්ෂරයන් වෙනුවට යොදන සලකුණු	6
7.	ස්වරයන්ගේ විශෙෂ විභාග	7
8.	ලඝු ගුරු විනාසය	8
9.	ව්‍යඤ්ජනයන්ගේ විශෙෂ විභාග	9
10.	වර්ගාක්ෂරයෝ	9
11.	අක්ෂරයන්ගේ උත්පත්තිස්ථාන	10
12.	කරණය	11
13.	අක්ෂරයන්ගේ උත්පත්තිස්ථාන හා කරණ	12
14.	සංයුක්තවර්ණ	13
15.	මිශ්‍රසිංහලභාෂාවේ බොහෝකොට ව්‍යවහාරවන සංයුක්තවර්ණ	13
16.	ඌනමාත්‍ර අනුනාසිකාක්ෂරය	14
17.	වර්ණයන්ගේ ප්‍රයෝග	14
18.	හකාරවිනිශ්චය	18
19.	සන්ධි	20
19a.	ශුද්ධසිංහල සන්ධි	21
19b.	සංස්කෘත සන්ධි	25
20.	අනුනාසිකාක්ෂර	29
21.	නකාරය	32

		පිට.
22.	ණකාරය	35
23.	ළකාර ලකාරයන්ගේ විභාග	38
24.	ළකාරය (ශුද්ධසිංහල)	39
25.	ලකාරය	43
26.	ශ, ෂ, ස	46
27.	ශකාරය	46
28.	ෂකාරය	47
29.	සකාරය (සංස්කෘත;)	48
28.	සකාරය (ශුද්ධසිංහල)	49
30.	ඌනවාත අනුනාසිකාක්ෂරය	51
31.	නාමපද	52
32.	ලිඞ්ගභේදය	53
33.	සඞ්ඛ්‍යාභේදය	56
34.	නාමවිභක්ති	60
35.	විභක්තිප්‍රත්‍යය	61
36.	පදසිද්ධි	61
37.	නාම වරනැගිල්ල	72
38.	සර්වනාම	81
39.	සමාසපද	84
40.	ප්‍රත්‍යාන්තනාම	89
41.	අව්‍යයපද	91
42.	අකර්මකධාතු සහ සකර්මකධාතු	91
43.	විකර්මකධාතු	92
44.	ක්‍රියා	92
45.	ත්‍රෛකාලික ක්‍රියා	93
46.	ක්‍රියාවන්ගේ පදසිද්ධිය	94
47.	කරධාතුවෙන් සිද්ධවූ කෘත්‍රිම ත්‍රෛකාලිකක්‍රියා ..	95
48.	ආශීර්වාදක්‍රියා	96
49.	විධික්‍රියා	96
50.	විධික්‍රියා ප්‍රත්‍යයයෝ	97
51.	අසම්භාවනක්‍රියා	97
52.	ප්‍රයෝජ්‍යක්‍රියා	99

		පිට.
53.	පූර්වක්‍රියා	100
54.	මිශ්‍රක්‍රියා	101
55.	කතෘක්‍රියා සහ කර්මක්‍රියා	102
56.	නිරුත්සාහක්‍රියා	104
57.	ගුණවාචකක්‍රියා	105
58.	උපසර්ග පද	107
59.	නිපාත	108
60.	ක්‍රියා විශේෂණ	109
61.	නිෂ්පන්න තත්සම, තද්භව	109
62.	උක්ත කර්තෘ සහ අනුක්ත කර්තෘ	120
63.	උක්තකර්මය සහ අනුක්තකර්මය	121
64.	කර්තෘපදය හා කර්තෘකාරකපදය	122
65.	කර්මාර්ථපදය සහ කර්මක්‍රියා	125

ශබ්දානුශාසනය.

ප්‍රාරම්භය.

1. භාෂාවක ශබ්දයන් පිළිබඳ යහපත් ව්‍යවහාරය උගන්වන්නාවූ ශාස්ත්‍රය ව්‍යාකරණ නම් වේ.

ශාස්ත්‍රය යනු විධිවූ පරිද්දෙන් ගෙනහැර දක්වන උපදෙශ සමූහයකි. එබැවින් භාෂාවක නිවැරදි ලෙස ලියන කියන ක්‍රමය දක්වන්නාවූ උපදෙශ ඒ භාෂාවේ ව්‍යාකරණය වේ.

භාෂාතොමෝ කියනු ලබන්නාවූද ලියනු ලබන්නාවූද ශබ්දයන්ගෙන් යුක්තය. කියනුලබන ශබ්ද නම් අදහස් හඟවන ව්‍යක්ත වචනයි. ලියනුලබන ශබ්ද නම් ඒ වචනයන්ම හඟවන්නාවූ සටහනි, හෙවත් අක්ෂර රූපයෝයි.

භාෂාවක ඇතිතාක් ශබ්ද ඒ ව්‍යවහාර කරනු ලබන ප්‍රකාරයෙන් සංක්ෂෙපවූ වර්ග ගණනාකට කොටස්කළ හැකිය. ස්වල්පවශයෙන් පදරූපය වෙනස්කිරීමෙන් අර්ථ වෙනස්කළ හැකිවූ ශබ්දද බොහෝය.

බොහෝසෙයින් ශබ්දයන්ගේ ප්‍රයෝජනය අසම්බන්ධවූ [ශුදකලාවූ] පදරූපයන් ව්‍යවහාරකිරීමෙන්

නොව නියම පිළිවෙළින් පද ගළපා වාක්‍ය සිද්ධකිරී මෙන් වන්නේය.

2. ව්‍යාකරණයතෙමේ අක්ෂරවිභාගය, පදවිධිය, වාක්‍යරචනායයි ත්‍රිවිධ වේ.

I. අක්ෂරයන්ගේ ප්‍රභේද දැක්වීම අක්ෂරවිභාග නම් වේ.

II. පදභේද, විභක්තිකාරක, පදව්‍යුත්පත්ති, යනාදිය දැක්වීම පදවිධි නම් වේ.

III. විධිවූ පරිද්දෙන් පද සම්බන්ධකොට වාක්‍ය සිද්ධකිරීම වාක්‍යරචනා නම් වේ.

1. අක්ෂරවිභාගය.

1. සිංහල භාෂාව.

3. සිංහලභාෂාව අමිශ්‍රසිංහලය මිශ්‍රසිංහල යයි දෙවැදෑරුම්.

මාගධසංස්කෘතාදි භාෂාන්තරශබ්ද හා මිශ්‍ර නුවූ සිංහලභාෂාව අමිශ්‍රසිංහල හෙවත් ශුද්ධසිංහල නම් වේ. භාෂාන්තරශබ්ද හා මිශ්‍රවූ ඒ භාෂාව මිශ්‍රසිංහල නම් වේ.

සිංහල ගද්‍යපද්‍යබන්ධන ශුද්ධසිංහලභාෂාවෙන් කරනුලැබේ. බොහෝ වාසගම්පොත්වලද කථාව්‍යවහාරයේද මිශ්‍ර සිංහලභාෂාව වේ.

2. හෝඩිය සහ එහි විභාග.

4. භාෂාවක ව්‍යවහාර වන අක්ෂරයන් හඳුන්වන පිළිවෙළ හෝඩි නම් වේ.

අමිශ්‍රසිංහලභාෂාව ලියන කියන කල ශුද්ධසිංහල හෝඩියට අයිති අක්ෂර පමණක් ව්‍යවහාර කෙ

රෙති; මිශ්‍රසිංහලභාෂාව ලියන කියන කල ඒ අක්ෂරයන් හා සංස්කෘත මාගධ ශෝබිවලට අයිති අක්ෂර ව්‍යවහාර කෙරෙත්.

5. ශුද්ධසිංහල ශෝබියට අයිති අක්ෂරයෝ දෙතිසෙකි.

ඔව්හු:—

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ,
ක ග ජ ට ඩ ණ ත ද න ප බ ම
ය ර ල ව ස හ ළ (අ)ං—යන මොහුය.

ඇ ඈ දෙක අ ආ දෙකේ මාත්‍රාවෘද්ධියෙන් සෑදේයයි සැලකී මෙන් සිදත්සඟරා කතෘහු ඒ දෙක අක්ෂරසඞ්ඛ්‍යාවට ඇතුළත් නොකළෝය.

6. සංස්කෘත ශෝබියට අයිති අක්ෂරයෝ එකුන්පනසෙකි. ඔව්හු:—

අ ආ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඓ
ඔ ඖ (අ)ං (අ)ඃ,
ක ඛ ග ඝ ඞ—ච ඡ ජ ඣ ඤ—ට ඨ ඩ ඪ ණ—
ත ථ ද ධ න—ප ඵ බ භ ම—
ය ර ල ව, ශ ෂ ස හ—යන මොහුය.

7. මාගධභාෂාවේ අක්ෂරයෝ එක්සාලිසෙකි.

ඔව්හු:—

අ ආ ඉ ඊ උ ඌ එ ඔ,
ක ඛ ග ඝ ඞ—ච ඡ ජ ඣ ඤ—ට ඨ ඩ ඪ ණ—
ත ථ ද ධ න—ප ඵ බ භ ම—
ය ර ල ව ස හ ළ (අ)ං, යන මොහු වෙත්.

8. මිශ්‍ර සිංහලභාෂාව ලියන කියන කල ව්‍යවහාරවන අක්ෂරයෝ සිව්පනසෙකි. ඔව්හු:—

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඒ ඓ
ඔ ඕ ඖ (අ)ං (අ)ඃ,

ක ඛ ග ඝ ඞ—ච ඡ ජ ඣ ඤ—ට ඨ ඩ ඪ ණ—
ත ථ ද ධ න—ප ඵ බ භ ම—
ය ර ල ව ශ ෂ ස හ ළ, යන මොහුය.

මිශ්‍ර සිංහලභාෂාව ලියන කියන කල ව්‍යවහාර වන යට දැක්වූ අක්ෂරයන් අතුරෙන් ඇ, ඈ, දෙක සිංහලට මුත් සංස්කෘතට හෝ මාගධියට හෝ නැත. ඍ, ඎ, ඏ, ඐ, ඓ, ඖ, ශ, ෂ, (අ)ඃ, යන අකුරු නවය සංස්කෘතට මුත් මාගධියට හෝ ශුද්ධ සිංහලට හෝ නැත. හ්‍රස්ව එ ඔ දෙක සිංහලෙහිද මාගධියෙහි කිසිතැනකද මුත් සංස්කෘතට නැත. ඛ, ඝ, ඡ, ඣ, ඨ, ඪ, ථ, ධ, ඵ, භ, ඞ, ච, ඤ, යන අක්ෂර ශුද්ධසිංහලට නැත.

පද්‍යබන්ධනයේ ශුද්ධසිංහලභාෂාවට ච, ඤ, යන අක්ෂරද ගද්‍යබන්ධනාදියෙහි ශුද්ධසිංහලභාෂාවට ච, ඤ, දෙක හා මහාප්‍රාණ අක්ෂරද කිසි තැනෙක ලැබේ.

බුදුගුණාලංකාරයෙහි

"පඝග තුරු නා දේ
ගජසෙන් කුම නා දේ"
"මැදහත්ලෙස පැව ති
එරජ ළිව්වවී නිරිඳු නම් වෙති" යනුද

සිඛ වැළඳුන් විනිස, ප්‍රුලසි, මෙවුන් ධම්, සටා, භගිරිනකය, අගාසලමෙවන්, යනාදි ශුද්ධසිංහල ව්‍යවහාර නිදර්ශනයි.

3. අක්ෂරයන්ගේ නම් කියන විධිය.

9. අක්ෂරයක නම කියනකල ඒ අක්ෂරයෙන් පරව 'කාර' ශබ්දය යොදනුලැබේ.

'අකාර'යයි කීකල අයන්නද 'ආකාර'යයි කීකල ආයන්නද 'කකාර'යයි කීකල කයන්නද ගැනේ. නමුත් වර්ණශබ්දය යොද අවර්ණයයි කිවහොත් අ, ආ, දෙකද, ඉවර්ණයයි කිවහොත් ඉ, ඊ, දෙකදැයි සවර්ණද ගණවේ.

ප්ලුතයත් සමග අ ආ අ—ඉ ඊ ඉ.--යනාදීන් සවර්ණවූ ස්වර තුනක් වර්ණශබ්දයෙන් වාච්‍ය බව සංස්කෘත වෛයාකරණයෝ කියත්. වර්ණශබ්දය බොහෝසෙයින් ස්වරාක්ෂරයෙකින් පරව යෙදේ.

4. ස්වර හා ව්‍යඤ්ජන.

10. අක්ෂරයෝ ස්වර ව්‍යඤ්ජන වශයෙන් ද්විවිධවෙත්.

ශුද්ධසිංහලහෝඩියේ අයන්න පටන් ඕයන්න දක්වා ඇති අක්ෂරයෝ ස්වර නම් වෙති, ප්‍රාණාක්ෂර නමුදු වෙත්; කයන්න පටන් ළයන්න දක්වා ඇති අක්ෂරයෝද අනුස්වාරය හෙවත් බින්දුවද ව්‍යඤ්ජන නම් වෙති, ගාත්‍රාක්ෂර නමුදු වෙත්.

සංස්කෘතහෝඩියේ අයන්න පටන් ඖයන්න දක්වා ඇති අක්ෂරයෝ ස්වරනම්හ; කයන්න පටන් හයන්න දක්වා ඇති අක්ෂරයෝද අනුස්වාරයද විසර්ජනීයය හෙවත් බින්දු දෙකද ව්‍යඤ්ජන නාම්හ.

මාගධ හෝඩියේ අයන්න පටන් ඔයන්න දක්වා ඇති අක්ෂරයෝ ස්වරනම්හ, කයන්න පටන් ළයන්න දක්වා ඇති අක්ෂරයෝද නිග්ගහිතය හෙවත් බින්දුවද ව්‍යඤ්ජනනාම්හ.

11. ස්වරයෝ හුදකලාවත් සුවසේ උච්චාරණය කරනුලැබෙති, හුදකලා ව්‍යඤ්ජනයෙන් එවැනි සුබෝච්චාරණයෙක් නොවේ.

හෝඩියෙහි ව්‍යඤ්ජනයෝ සුවසේ උච්චාරණය සඳහා පළමුවෙනි ප්‍රාණාක්ෂරයවූ අ යන්න ආරූඪ කොට දක්වන ලදහ. ප්‍රාණාක්ෂරයකින් තොරවූ ව්‍යඤ්ජනය සුවසේ ශබ්දනොකට හැකිවූ හල් අකුරක් වේ. හල් යනුද ව්‍යඤ්ජනාක්ෂරයන්ටම නමෙති.

5. ව්‍යඤ්ජනයන් හා ප්‍රාණාක්ෂර ගැළපෙන ක්‍රමය.

ක්+අ= ක	ක්+ඍ= කෘ
ක්+ආ= කා	ක්+ඎ= කෲ
ක්+ඇ= කැ	ක්+එ= කෙ
ක්+ඈ= කෑ	ක්+ඒ= කේ
ක්+ඉ= කි	ක්+ඓ= කෛ
ක්+ඊ= කී	ක්+ඔ= කො
ක්+උ= කු	කා+ඕ= කෝ
ක්+ඌ= කූ	ක්+ඖ= කෞ
ක්+ඏ= කෟ	ක්+අං= කං
ක්+ඐ= කෟෟ	ක්+අඃ= කඃ

6. ව්‍යඤ්ජනාරූඪවූ ප්‍රාණාක්ෂරයන් වෙනුවට යොදන සලකුණු.

ප්‍රාණාක්ෂරය.	සලකුණ.	කියන නාමය
ආ	ා	ඇලපිල්ල
ඇ	ැ	හ්‍රස්ව මාත්‍රාංශය
ඈ	ෑ	දීඝ මාත්‍රාංශය
ඉ	ි	ඉස්පිල්ල
ඊ	ී	දීඝ ඉස්පිල්ල
උ	ැ හෝ ු	පාපිල්ල
ඌ	ෑ හෝ ූ	දීඝ පාපිල්ල
ඏ	ෟ	ඇලපිල්ල සහිත ගැටය
ඐ	ෟෟ	ඇලපිලිදෙක සහිත ගැටදෙක
ඍ	ෘ	ගයනුකිත්ත
ඎ	ෲ	ගයනුකිත්ත හා ගැටය
එ	ෙ	කොම්බුව
ඒ	ෙ–් හෝ ේ	දීඝ කොම්බුව
ඓ	ෛ	කොම්බු දෙක
ඔ	ෙ–ා	කොම්බුව හා ඇලපිල්ල
ඕ	ෙ–ෝ	දීඝ කොම්බුව හා ඇලපිල්ල
ඖ	ෙ–ෟ	කොම්බුව හා ගයනුකිත්ත

අ යන්නට සලකුණක් නොමැත්තේය. ව්‍යඤ්ජනයේ හල් බැව්හි සලකුණ පහකළ කලැ එහි අයන්න විද්‍යමාන වේ. ු ූ යනු ක ග ත හ ර ශ යන අක්ෂරයන්ගේ පාපිලි වශයෙන්ද ු ූ යනු සෙසු ව්‍යඤ්ජනයන්ගේ පාපිලි වශයෙන්ද යොදත්.

7. ස්වරයන්ගේ විශෙෂ විභාග.

12. ස්වරයෝ හ්‍රස්ව දීර්ඝ වශයෙන් ද්විවිධ වෙත්.

ශුද්ධ සිංහල හෝඩියේ අ ඇ ඉ උ එ ඔ යන මොහු හ්‍රස්වයෝය හෙවත් ලුහුඬු මාත්‍රා ඇත්තාහු වෙත්. ආ ඈ ඊ ඌ ඒ ඕ යන මොහු දීර්ඝයෝය.

සංස්කෘත හෝඩියේ අ ඉ උ ඍ ඏ යන මොහු හ්‍රස්වයෝය; ආ ඊ ඌ ඎ ඐ ඒ ඓ ඔ ඖ යන මොහු දීර්ඝයෝය.

සිංහල භාෂාවේ මිශ්‍රවන පාලි සංස්කෘත ශබ්දයන්හි ඇතුළත්වූ එ ඔ දෙක දීර්ඝ ශබ්ද ඇත්තේවේ; දෙශය, දොෂය, යනාදියෙහි මෙනි. ශුද්ධ සිංහල ශබ්දයන්හි ඒ දෙක දීර්ඝ ලකුණක් නැතිවිට හ්‍රස්වවම කියවේ; දෙය, දොස, එළුවා, ඔරුව, යනාදියෙහි මෙනි.

පාලි භාෂාවෙහි එ ඔ දෙක දීර්ඝ නමුත් සංයොගයකින් පූර්වයෙහි සිටිකල කිසිතැනෙක හ්‍රස්වවද කියවේ. එත්ථ, ඔට්ඨො, යනාදියෙහි මෙනි.

13. ඒ ඕ දෙක එ ඔ දෙක වෙනුවට විකල්පයෙන් ලියනුලැබේ.

මිශ්‍ර සිංහල භාෂාවේ පාලි සංස්කෘත වචන ලියන කල දීර්ඝ උච්චාරණය ඇති **එ ඔ** වෙනුවට **ඒ ඕ** යන අක්ෂරදෙකද විකල්පයෙන් ලියත්.

උදාහරණ:—දෙවිය—දේවිය; දොෂය—දෝෂය.

14. අ, ඇ, ඉ, උ, එ, ඔ, යන වර්ණ සය හ්‍රස්ව දීර්ඝ ප්ලුත වශයෙන් තුන්ආකාරයෙකින් කියත්.

ඒක මාත්‍රාවක් ඇත්තේ හ්‍රස්ව නම් වන්නේය; මාත්‍රා දෙකක් ඇත්තේ දීර්ඝයයි; මාත්‍රා තුනක් ඇත්තේ ප්ලුතයයි; අර්ධ මාත්‍රාවක් ඇත්තේ [කේවලවූ] ගාත්‍රාක්ෂරයයි.

මාත්‍රාවක් නම් ඇසිපිය හෙළන පමණ කාලයකි. හ්‍රස්ව, දීර්ඝ, ප්ලුත, තුන ක්‍රමයෙන් මෙසේ දතයුතුයි:

අ, ආ, අ—; ඇ, ඈ, ඇ—; ඉ, ඊ, ඉ—;
උ, ඌ, උ--; එ, ඒ, එ;—; ඔ, ඕ ඔ—;

මෙහි ප්ලුතය දුරට ඇසෙන පරිද්දෙන් කැඳවා ශබ්දකිරීමෙහි ව්‍යවහාරයි. ප්ලුතයට වෙනම අක්ෂර රූපයක් නැති බැවින් එය හෝඩියේ අක්ෂර සංඛ්‍යාවට නොගැනේ.

8. ලඝු ගුරු වින්‍යාසය.

15. හ්‍රස්වවූ ස්වරය ලඝු නම් වේ, දීර්ඝවූ ස්වරය ගුරු නම් වේ.

හ්‍රස්ව දීර්ඝ ස්වරයන් අල් අකුරුවලට ආරූඪවූවත් ඒ ලඝු ගුරු බැව් නොවෙනස් වේ. ඒ මෙසේය,-ක, කැ, කි, කු, කෘ, කෟ, කෙ, කො, යන මොහු ලඝුයි. කා, කෑ, කී, කූ, කෲ, කෳ, කේ, කෛ, කෝ, කෞ, යන මොහු ගුරුයි. අනුස්වාරය, විසර්ජනීයය, සංයෝගය, අස්වරව්‍යඤ්ජනය, යන මෙයින් පූර්වව සිටි හ්‍රස්වයද ගුරුවේ. ඒ මෙසේය:—සං, සඃ, සත්‍ය, සත්, යන මොහු ගුරු නම් වෙත්.

ප්‍රස්තාරයෙහි ⌒ මෙසේ වක්‍රවූ රේඛාවක් ඇත්තේ ගුරු අක්ෂරය වේ;—මෙසේ ඍජු දීර්ඝ රේඛාවක් ඇත්තේ ලඝු අක්ෂරය වේ.

උදාහරණ:— ලඝු ගුරු

— — — — — — ⏑ ⏑ ⏑

ද ද ගි ගි ණී ය ආ ගා මින්

ලඝු ගුරු ඇඳීම.

— — — — ⏑ ⏑ — — — — — — — — ⏑

මි තු රු තු මෝ දුක් සැ ප දෙ කො ගි ම පැ ව ති

— — — — ⏑ ⏑ ⏑ — — — ⏑ — ⏑

බි තු සි තු යම් රූ මෙන් පි වු නො පා වි ති

9. ව්‍යඤ්ජනයන්ගේ විශේෂ විභාග.

16. සංස්කෘතභාෂායේ ව්‍යඤ්ජනයන් අතුරෙන් කකාරය පටන් මකාරය අන්තකොට ඇති අක්ෂර පඤ්චවිංශතිය පසක් පසක් බැගින් වර්ගයෝ වෙති. එව්හු ස්පර්ශාක්ෂර නමුදු වෙත්.

වර්ගයෝ වනාහි ඒ ඒ වර්ගයන්ගේ මුලකුරු වශයෙන් කවර්ගය, චවර්ගය, ටවර්ගය තවර්ගය, පවර්ගය, යනාදී නම් ලබන්නාහුය.

10. වර්ගාක්ෂරයෝ.

කවර්ග:—ක ඛ ග ඝ ඞ
චවර්ග:—ච ඡ ජ ඣ ඤ
ටවර්ග:—ට ඨ ඩ ඪ ණ
තවර්ග:—ත ථ ද ධ න
පවර්ග:—ප ඵ බ භ ම

17. යකාරාදි අටදෙන අන්තඃස්ථය ඌෂ්මයයි විභේද වෙත්.

අන්තඃස්ථ:—ය ර ල ව
ඌෂ්ම:—ශ ෂ ස හ

18. ව්‍යඤ්ජනයෝ ඝොෂයෝය අඝොෂයෝ යයි විවිධ වෙත්.

වර්ගීයන් සම්බන්ධව සිටි ප්‍රථම ද්විතීයාක්ෂරද ශ ෂ ස යන තුනද විසර්ජනීයද අඝොෂයෝය. සෙස්සෝ ඝෝෂයෝ වෙත්.

අඝොෂයෝ:—ක ඛ ච ඡ ට ඨ ත ථ ප ඵ ශ ෂ ස (අ)ඃ,
ඝොෂයෝ:—ග ඝ ඞ ජ ඣ ඤ ඩ ඪ ණ ද ධ න බ
භ ම ය ර ල ව හ ළ (අ)ං

11. අක්ෂරයන්ගේ උත්පත්තිස්ථාන.

16. අක්ෂරයෝ කණ්ඨාදි ස්ථානයන්හි උපදිත්.

කවර්ගීයද අ ආ ඇ ඈ හ (අ)ඃ යන මොහුද කණ්ඨය උත්පත්තිස්ථානකොට ඇතිහෙයින් **කණ්ඨජ** නම් වෙත්.

චවර්ගීයද ඉ ඊ ය ශ යන මොහුද තාල්ල උත්පත්තිස්ථානකොට ඇතිහෙයින් **තාලුජ** නම් වෙත්.

ටවර්ගීයද ඍ ඎ ර ෂ ළ යන මොහුද මූර්ධන උත්පත්තිස්ථානකොට ඇතිහෙයින් **මූර්ධජ** නම් වෙත්.

තවර්ගීයද ඏ ඐ ල ස යන මොහුද දන්තයන් උත්පත්තිස්ථානකොට ඇතිහෙයින් **දන්තජ** නම් වෙත්.

පවර්ගීයද උ ඌ යන මොහුද ඔෂ්ඨවය (දෙතොල) උත්පත්තිස්ථානකොට ඇතිහෙයින් **ඔෂ්ඨජ** නම් වෙත්.

එ ඒ ඓ යන මොහු කණ්ඨය හා තාල්ල උත්පත්තිස්ථානකොට ඇතිහෙයින් **කණ්ඨතාලුජ** නම් වෙත්.

ඔ ඕ ඖ යන මොහු කණ්ඨය හා ඔෂ්ඨයන් උත්පත්තිස්ථානකොට ඇතිහෙයින් **කණ්ඨෞෂ්ඨජ** නම් වෙත්.

වකාරයතෙම දන්තයන් හා ඔෂ්ඨයන් උත්පත්තිස්ථානකොට ඇතිහෙයින් **දන්තෞෂ්ඨජ** නම් වේ.

ඞ ඤ ණ න ම යන මේ වර්ගාන්ත අක්‍ෂරයෝ තමන් තමන්ට කී ස්ථාන හා නාසිකාව උත්පත්තිස්ථානකොට ඇතිහෙයින් **අනුනාසිකාක්‍ෂරයෝ**යයි කියනු ලැබෙත්.

අනුස්වාර නම්වූ බින්දුතෙම නාසිකාවෙන් උපදී.

මේ තනි බින්දුව මැතක පටන් පෙළට සමව ලියතත් පුරාණ සිංහල ලිපිවල හා නාගර කාම්බෝජ ද්‍රවිඩ ආදි පොත්පත්වලත් පෙළට උඩින් ලීම ව්‍යවහාරයි. උඩින් ලියන තනි බින්දුව අනුස්වාර නම් වන බව "ශිරෝබින්දුරනුස්වාරඃ" යන්නෙන් පැහැදිලිව පෙනේ. එහෙයින් බින්දුව උඩින් ලියන සිරිත සංස්කෘත වෛයාකරණයන්ගේ සංඥාවට ඉතා එකඟවේ.

12. කරණය.

20. **අක්‍ෂරෝත්පත්තියට ඉවහල් වන තැන් කරණ නම්.**

තල්ලේ උපදින අක්‍ෂරයන්ට දිවමැද කරණය වේ; මුදුනෙන් උපදින අක්‍ෂරයන්ට දිවඅග ලඟ කරණය වේ; දන්තයන්හි උපදින අක්‍ෂරයන්ට දිවඅග කරණය වේ; කණ්ඨය ආදි අනිකුදු ස්ථානයන්හි උපදින අක්‍ෂරයන්ට ඒ ඒ ස්ථානම කරණ වේ.

13. අක්ෂරයන්ගේ උත්පත්තිස්ථාන හා කරණ.

අක්ෂර	උත්පත්තිස්ථාන	කරණ
ක ඛ ග ඝ අ ආ ඇ ඈ හ අඃ	කණ්ඨය (උගුර)	උගුර
ච ඡ ජ ඣ ඤ ඉ ඊ ය ශ	තල්ල	දිව මැද
ට ඨ ඩ ඪ ඍ ඎ ර ෂ ළ	මුදුන	දිව අග ලඟ
ත ථ ද ධ ඏ ඐ ල ස	දත්	දිව අග
ප ඵ බ භ උ ඌ	තොල්	තොල්
එ ඒ ඓ	උගුර සහ තල්ල	උගුර සහ තල්ල
ඔ ඕ ඖ	උගුරසහ තොල්	උගුරසහ තොල්
ව	දත් සහ තොල්	දත් සහ තොල්
ඞ	උගුර සහ නාසය	උගුරසහ නාසය
ඤ	තල්ලසහනාසය	දිව මැද
ණ	මුදුනසහ නාසය	දිව මැද ලඟ
න	දත් සහ නාසය	දිව අග
ම	තොල් සහ නාසය	තොල්
ං	නාසය	නාසය

14. සංයුක්තවර්ණ.

21. යම් ස්වර රහිත ව්‍යඤ්ජනයෙක් ඉදිරියෙහි ව්‍යඤ්ජනයක් හා සමග බැඳේද ඒ සංයුක්ත නම් වේ.

සංයුක්තවර්ණ ලිමෙහිදී බොහෝසෙයින් ඒ අකුරුදෙකින් එකක අංශයක් පමණක් දක්නාලැබේ.

15. මිශ්‍රසිංහලභාෂාවේ බොහෝකොට ව්‍යවහාරවන සංයුක්තවර්ණ.

ක් + ව = ක්‍ව	ර් + ම = ර්‍ම
ක් + ෂ = ක්‍ෂ	ඞ් + ග = ඟ
ග් + ධ = ග්‍ධ	ඤ් + ච = ඤ්‍ච
ජ් + ඤ = ජ්‍ඤ	ඤ් + ජ = ඦ
ට් + ඨ = ට්‍ඨ	ණ් + ඩ = ඬ
ත් + ථ = ත්‍ථ	න් + ථ = න්‍ථ
ත් + ව = ත්‍ව	න් + ද = ඳ
ද් + ධ = ද්‍ධ	න් + ධ = න්‍ධ
ද් + ව = ද්‍ව	ම් + බ = ඹ
ක් + ය = ක්‍ය	ච් + ච = ච්‍ච(පාළි)
ක් + ර = ක්‍ර	ඩ් + ඩ = ඩ්‍ඩ ,,

හල් අකුරකින් පරව බැඳෙන යකාරයේ සලකුණ (්‍ය) යංශ නම් වේ. හල් අකුරකින් පරව බැඳෙන රකාරයේ සලකුණ (්‍ර) රකාරාංශ නම් වේ. ස්වර සහිත ව්‍යඤ්ජනයකින් පූර්වයෙහි සිටින හල් රකාරයේ සලකුණ (ර්‍) රේඵ නම් වේ.

22. පූර්වයෙන් සිටි [හල්] රකාරය හා සංයුක්ත වන ව්‍යඤ්ජනය විකල්පයෙන් ද්විත්වවේ.
උදාහරණ:—වර්ග—වර්ග්ග, ධර්ම—ධර්ම්ම,

23. [හල්] රකාරයෙන් පරවූ මහාප්‍රාණාක්ෂරයක් ද්විත්වවීමේදී පූර්වරූපය අල්පප්‍රාණ වේ.
උදාහරණ:—අර්ථ—අර්ත්ථ, වර්ධන—වර්ද්ධන.

16. ඌන මාත්‍ර අනුනාසිකාක්ෂරය.

24. පාලිසංස්කෘතභාෂාවල නොමැති ඌන මාත්‍ර අනුනාසිකාක්ෂරයෙක් ශුද්ධසිංහලෙහි ඟ ඬ ඳ ඹ යන අක්ෂරයන්හා බැඳේ

එය ඟ යන්න හා බැඳුණුකල අනුස්වාරයාගේද, ඬ යන්න හා බැඳුණුකල ණකාරයාගේද, ඳයන්න හා බැඳුණුකල න කාරයාගේද, ඹ යන්න හා බැඳුණුකල මකාරයාගේද ඌනමාත්‍රායයි සැලකිය යුතුයි: ගඟ, හඬ, සඳ, බඹ යනු පිළිවෙළින් ං, ණ, න, ම, යන සතරදෙනාගේ ඌනමාත්‍රයෝ වෙත්. ඞ කාර ඤ කාර දෙදෙනාගේ ඌනමාත්‍රොච්චරණයක් නොපෙනේ. සංයුක්තවර්ණ අතුරෙන් සඤ්ඤක ග කාරයද ඹ කාරයද පාලිසංස්කෘත වචන මධ්‍ය යෙහිත් ලීම පුරාණ ලිපිආදියෙන් පෙනේ. එවැනි තැනදී ඟ යනු ඞග මෙන් හෙවත් ඞ යනු බැදි ග යන්න මෙන්ද ඹ යනු ම යනු බැදි බ යන්න මෙන්ද සැලකිය යුතුයි. එබැවින් සිඞ්ගාර-සිඟාර, අම්බර-අඹර, යන දෙයාකාර ලිපියම උච්චාරණයෙහි එකාකාර වෙයි.

මිශ්‍රසිංහලභාෂාවේ අන්තර්ගතවන පාලිසංස්කෘත වචන යන්හි හල් අකුරු බොහෝකොට පර ව්‍යඤ්ජනයන් හා බැඳ ලියනුලැබේ; ශුද්ධසිංහල වචනයන්හි ඒ වෙන්ව ලියත්.

උදාහරණ:—

පාලිසංස්කෘත —අන්තරය, උත්තර, ලජ්ජා;
ශුද්ධසිංහල.—බල්ලා, කොක්කු, වැද්ද;

17. වර්ණයන්ගේ ප්‍රයොග.

25. ලොපය, ආදෙශය, ආගමය, පූර්වරූපය, පර රූපය, විකාරරූපය, විපර්‍ය්‍යාසය, වෘද්ධිය, හානියයි වර්ණයන්ගේ ප්‍රයොග නවවැදෑරුම්.

(1) ලෝපය.

26. වර්ණයන්ගේ අනුච්චාරණය ලොප නම් වේ.

ශබ්දයන්ගේ මුල මැද අග යන තුන්තන්හිම වර්ණයෝ ලොප් වන්නාහුය. අනාත් යනු නාත් කියාද මහාකාසුප් යනු මහසුප් කියාද පාද යනු පා කියාද වේ. සමහර ශබ්දවල ගාත්‍රාක්ෂරය ලොප්වී එහි තුබූ ස්වරය පමණක් ඉතිරිවේ. හිර— ඉර, හිහුරු—ඉහුරු යනාදියෙහි මෙනි. ඇතම් ශබ්දවල හකාරය ලොප්ව ස්වරය ශෙෂව මුලින් සිටි ගාත්‍රාක්ෂරයේ ස්වරය හා එක්ව දීඝීවේ. පහන—පාන, සහාළු—සාළු, පහත—පාත, යනාදීයෙහි මෙනි.

(2) ආදෙශය.

27. වර්ණයක් ලොප්කොට ඒ ස්ථානයට අන්‍ය වර්ණයක් පැමිණවීම ආදෙශ නම් වේ.

දඹුකම් යනු දඹුවම් කියාද, රජ යනු රද කියාද යුගළ යනු යුවළ කියාද වේ. මෙහි ක යන්න වෙනුවට ව යන්නද, ජ යන්න වෙනුවට ද යන්නද, ග යන්න වෙනුවට ව යන්නද, ආදෙශයි.

(3) ආගම.

28. වර්ණයක් ලොප්නොකොට ඒ වර්ණය වෙන අන්‍ය අක්ෂරයක් පැමිණවීම ආගම නම් වේ.

උදාහරණ:—නි+අවුල්—නිරවුල්, වි+අවුල්—වියවුල්. මෙහි නි අවුල් යන්නෙහි අකාරය ආශ්‍රයකොට රකාරාගමයෙන් නිරවුල් යන්නද, වි අවුල් යන්නෙහි අකාරය ආශ්‍රයකොට යකාරය පැමිණවීමෙන් වියවුල් යන්නද සිඬයි.

(4) පූර්වරූපය.

29. ශබ්දයක යම් ව්‍යඤ්ජනාක්ෂරයෙක් ඊට පූර්වයෙන් සිටි ව්‍යඤ්ජනාක්ෂරයාගේ රූපය ගනී නම් එය පූර්වරූප නම් වේ.

සිත්+කම්, ගෙත්+කම්, යන මෙහි පරවූ කකාර යන් පූර්වයෙන් සිටි තකාරයන්ගේ රූපය ලත්කල සිත්තම් ගෙත්තම් කියා වේ. මෙසේම ඇත්+හල, අස්+හල, කම්+හල, යනාදී තන්හි හකාරයටද පූර්වයෙන් සිටි තකාර සකාර මකාරයන්ගේ රූපය ලැබීමෙන් ඇත්තල, අස්සල, කම්මල, යනාදිය සිද්ධවේ.

(5) පරරූප.

30. ශබ්දයක යම් ව්‍යඤ්ජනාක්ෂරයෙක් ඊට පරව සිටි ව්‍යඤ්ජනාක්ෂරයාගේ රූපය ගනී නම් එය පර රූප නම් වේ.

උදාහරණ:—ලිප්+ගල=ලිග්ගල, දුක්+පත්=දුප්පත්.

මෙහි ලිප්+ගල යන්නෙහි පරව සිටි ගයන්නේ රූපය පූර්වවූ පයන්නට ලැබී ලිග්ගල කියාද; දුක්+පත් යන්නෙහි පරව සිටි පයන්නේ රූපය පූර්වවූ කයන්නට ලැබී දුප්පත් කියාද සිදුවේ.

(6) ද්විත්වරූපය.

31. එකම අක්ෂරයාගේ හෝ පදයාගේ හෝ රූප දෙකක් කිරීම ද්විත්වරූප නම් වේ.

ගොපල්+ආ යන්න ගොපල්ලා කියාද, උතුස්+ආ යන්න උතුස්සා කියාද, ල යනු ස යනු ද්විත්වවීමෙන් සිද්ධයි; කියා, ලියා, යනාදී තන්හි කිය කියා, ලිය ලියා, යනාදීන් පදයන්ගේ ද්විත්වය වේ.

(7) අක්ෂරවිපර්‍ය්‍යාසය.

32. ශබ්දයක අක්ෂරයන්ගේ පෙරළීම [මාරුවීම] විපර්‍ය්‍යාස නමි.

ස්වරයක් මාරුවීම පිලිවිපර්‍ය්‍යාසයයි. පුත්-පිත්, උපද-ඉපද, යනාදියෙහි මෙනි. ව්‍යඤ්ජනයක් මාරුවීම වර්‍ණවිපර්‍ය්‍යාසයයි. දහවල්—දවහල්, රුහිර—හුරිර, සයන—සහන, යනාදියෙහි මෙනි.

(8) වෘද්ධිය.

33. වෘද්ධි නම් මාත්‍රාවන්ගේ වෘද්ධියයි.

උවරණ යනු උවාරණ කියාද, නවම් යනු නවාම් කියාද එකමාත්‍රාවූ වකාරස්ථ අකාරය දීර්‍ඝකොට මාත්‍රා දෙකක් ඇත්කිරීම මාත්‍රාවෘද්ධියට උදාහරණයි.

(9) හානිය.

34. හානි නම් මාත්‍රාවන්ගේ හානියයි.

දංග යනු දග කියාද, සේගුණෙන් යනු සෙගුණෙන් කියාද වේ. මෙහි දංග යන්නෙහි ං යන අනුනාසිකාක්ෂරයේ මාත්‍රාංශයක් හානිවීමෙන් දග කියාද, සේගුණෙන් යන්නෙහි සේයන්නේ මාත්‍රා දෙකක් ප්‍රමාණවූ දීර්‍ඝ ඒ යන්න එක් මාත්‍රාවක් ප්‍රමාණවූ හ්‍රස්ව එ යන්න වීමෙන් සෙගුණෙන් කියාද වේ.

මාත්‍රාවෘද්ධිය හා මාත්‍රාහානිය බොහෝකොට කාව්‍යබන්ධනයෙහි පෙනේ.

යට දැක්වූ ලොප ආදෙශ ආදී ව්‍යාකරණවිධි ශබ්දධර්‍මයෙන් හෝ ඡන්දස් හේතුවෙන් හෝ කටයුත්තේය.

18. හකාරවිනිශ්චය.

35. හකාරය වනාහි ආදේශ හකාරය ආගම හකාරය ප්‍රකෘතිහකාරයයි ත්‍රිවිධ වේ.

(1) ආදේශ හකාරය.

36. සකාරයට ආදේශවූ හකාරය ආදේශ හකාර නම්.

සිංහල භාෂාවේ සකාරසහිත බොහෝ ශබ්දවල සකාරය වෙනුවට කිසි විටෙක හකාරය ව්‍යවහාර කෙරෙත්. මේ හකාරයට ආදේශහකාරයයි කියත්.

උදාහරණ:—

සැම	—හැම	සිස්	—හිස්
සැකි	—හැකි	සිඳි	—හිඳි
සැළි	—හැළි	සිටි	—හිටි
සැමි	—හැමි	සිතු	—හිතු
සකාර	—හකාර	සුදු	—හුදු
සටහන්	—හටහන්	සේ	—හේ
සසුන්	—හසුන්	සොබනා	—හොබනා
සවා	—හවා	පසන්	—පහන්

සකාරයට හකාරාදේශය හැම තන්හිම යෝග්‍ය නොවේ. සුර (දිව්‍ය), සවන (සර්වඥ), සද (ශබ්ද), යනාදිය හුර, හවන, හද, යනාදිවශයෙන් හකාරාදේශ කොට ව්‍යවහාර කළහොත් විරුද්ධාර්ථ හැඟෙන්නේය. එබැවින් ආදේශහකාරයද පණ්ඩිතයන්ගේ ව්‍යවහාරානුසාරයෙන් දත යුතුයි.

සකාරයට හකාරාදේශ වනු මිස හකාරයට සකාරාදේශයක් නොපෙනේ. එබැවින් **බොහෝ** යන්නට **බොසෝ** කියා හෝ **මහත්මා** යන්නට **මසත්මා** කියා හෝ ව්‍යවහාරකිරීම යෝග්‍ය නොවේ.

(2) ආගමහකාරය.

27. ශබ්දයකට අමුතුවෙන් වැටෙන ස්වර සහිත හකාරය ආගමහකාර නම් වේ.

හකාරයක් ආගමවූ කල්හි ඊට මුලින් සිටි දීර්ඝ ස්වරය හ්‍රස්ව වන්නේය.

උදාහරණ:—

කාබාන —කහබාන	නිදීස—නිදහස්
මාල් —මහල්	දවල් —දහවල්
දෝත —දෙහොත	කේලි—කෙහෙලි

ශබ්දයක හකාරය ලොප්වූකල ඊට මුලින් සිටි ලුහුඬු ස්වරය දීර්ඝ වන්නේය. මහගම—මාගම, මහතොට—මාතොට වහල්—වාල්, යනාදියෙහි මෙනි.

මාගධ සංස්කෘත ශබ්දයන්ගෙන් භින්නවූ සමහර සිංහල ශබ්දවල මාතෘ ශබ්දයේ නොමැති හකාරයෙක් දක්නාලැබේ. මෙද ආගමහකාරසඞ්ඛ්‍යාවට ගැනේ.

උදාහරණ:—

ධම්ම —දහම්	ඝාන —ගහන්
බ්‍රහ්ම —බහස්ම	සිද්ධත්ථ —සිදුහත්
අස්සුධාර—ඇස්දහර	සද්ධා —සැදැහැ
මධ්‍යස්ථ —මැදහත්	කම්මට්ඨාන —කමටහන්
ධ්‍යාන —දහන්	අජ්ඣාසය —අදහස්
රාජධානි —රජදහන්	අන්තරධාන—අතුරුදහන්
සද්ධම්ම —සදහම්	සණ්ඨාන —සටහන්

මේ හකාරය අමුතුව හකාරයක් නොව මුල් ශබ්දයේ මහාප්‍රාණාක්ෂරයෙහි අන්තර්ගතවූ හකාරයයි. මහාප්‍රාණාක්ෂරය වනාහි අල්පප්‍රාණාක්ෂරයක් හා සමග හකාරය සංයෝගවන්නාක් මෙන් සිද්ධවන අක්ෂරයකි.

උදාහරණ:—ක්+හ්+අ=ඛ, ග්+හ්+අ=ඝ.

(3) ප්‍රකෘතිහකාරය.

38. ප්‍රකෘතියෙන්ම සිටි හකාරය ප්‍රකෘතිහකාර නම් වේ.

කිසි ශබ්දයක හකාරයෙක් ආදෙශ වශයෙන් හෝ ආගම වශයෙන් හෝ නොපැමිණ ස්වභාවයෙන්ම දක්නාලැබේ. එබඳු හකාරය ප්‍රකෘතිහකාර නම් වේ. හඩ, හළ, හුණු, හැඟි, හුරු, හිමි, පහර, මහත්, හද, යනාදී ශබ්දවල හකාරය මුල් ප්‍රකෘතියේ පටන්ම ඇතිහෙයින් ප්‍රකෘතිහකාරයි.

සමහර හකාරසහිත ශබ්දයන්ගේ හකාරය ලොප්වී ප්‍රාණස්වරය පමණක් ශෙෂවේ. හඩ යන්න අඩ කියාද, හද යන්න අද කියාද, හිඟුරු යන්න ඉඟුරු කියාද, කිසි තැනෙක දක්නාලැබේ.

අඳුන් (අඤ්ජන,) ඇඳ (අඤ්නය කොට), අරා (ආරූඪ වැ), අලු (ආලොක), අලුත් (අභිනව). අද (අද්‍ය), ඉදි (සෘජු), ඔද (ඔජස්), එළි (එළක), ඔලු (ශිර්ෂ), අලු (භස්ම), යනාදී ශබ්ද හකාර ලොප්වීමෙන්වූ ශබ්ද නොව ප්‍රකෘතියෙන්ම ප්‍රාණස්වර සහිත ශබ්දයි.

මාගධ සංස්කෘත හකාරසහිත කිසි ශබ්දයක් සිංහලට හිනතාවීමේදී හකාරය ලොප්වේ. හකාරරහිත කිසි ශබ්දයක හකාරය ආගම වේ.

හස්ත ශබ්දයෙන් භිනතාවූ අත් ශබ්දයද, අස්ත ශබ්දයෙන් හිනතාවූ හත් ශබ්දයද, මීට නිදර්ශනයි.

19. සන්ධි. (සඳෑ).

39. අතරක් නැතිලෙස පූර්ව අපර වර්ණයන්ගේ ගැළපීම සන්ධි නම් වේ.

ගැළපීම ස්වභාවකොට ඇති ශබ්ද දෙකක් වෙන් වෙන්ව කීම කනට අමිහිරිය. ඒ දෙබෙය වැළැක්

වීව පිණිය පූර්ව ශබ්දයේ කෙළවර අක්‍ෂරයාගේ හෝ අපර ශබ්දයේ ප්‍රථමාක්‍ෂරයාගේ හෝ මේ දෙදෙනාගේම හෝ පෙරළිමෙන් වර්ණ දෙකක් ගළපනුලැබේද ඒ සන්ධානය සන්ධි නම් වේ.

40. මිශ්‍රසිංහලභාෂාවේ සන්ධික්‍රම සිංහලක්‍රමය, සංස්කෘතක්‍රමයයි විප්‍රකාරයි.

19a. ශුද්ධසිංහල සන්ධි.

(1) පූර්වස්වරලොප සන්ධිය.	(පෙරසරලොප් සඳ)
(2) පරස්වරලොප සන්ධිය.	(පරසරලොප් සඳ)
(3) ස්වර සන්ධිය.	(සරසඳ)
(4) ස්වරාදෙශ සන්ධිය.	(සරදෙස් සඳ)
(5) ගාත්‍රාදෙශ සන්ධිය.	(ගතාදෙස් සඳ)
(6) පූර්වරූප සන්ධිය.	(පෙරරූ සඳ)
(7) පරරූප සන්ධිය.	(පරරූ සඳ)
(8) ගාත්‍රාක්‍ෂරලොප සන්ධිය.	(ගතකුරුලොප් සඳ)
(9) ආගම සන්ධිය.	(අගම් සඳ)
(10) ද්විරූප සන්ධිය.	(දෙරූ සඳ)යනාමේය.

(1) පූර්වස්වරලොප සන්ධිය.

41. පූර්වස්වරය ලොප්කොට පරස්වරය ගාත්‍රාක්‍ෂරය කරා පමුණුවා ගැළපීමෙන්වූ සන්ධිය පූර්වස්වරලොපසන්ධි නම් වේ.

සුවණ+ඇති යනු සුවණැති නියා සන්ධිවේ. මෙහි සුවණ යන ශබ්දයේ ණකාරයෙහිවූ අයන්න පූර්වස්වරයයි. එය ලොප්කළ කල්හි සුවණ්+ඇති නියාවේ. ඉන්පසු පරස්වරයවූ ඇයන්න ණ් යන ගාත්‍රාක්‍ෂරය කරා පැමිණවූ කල්හි සුවණැති නියා වේ.

මෙපරිද්දෙන්ම යන+එන යනු යඑන කියාද, දින+ඉසුරු යනු දිනිසුරු කියාද, හිගුරු+අල යනු හිගුරල කියාද සන්ධිවේ.

(2) පරස්වරලොප සන්ධිය.

42. පරස්වරය ලොප්වීමෙන් ගැළපෙන සන්ධිය පරස්වරලොපසන්ධි නාම් වේ.

පඬි+උතුමා යනු පඬිතුමා කියා සන්ධිවේ. මෙහි උතුමා යන වචනයේ උයන්න පරස්වරයයි. එය ලොප්කළ කල්හි පඬිතුමා කියා වචනදෙක ගැළපේ.

මෙපරිද්දෙන්ම රජ+උතුමා යනු රජතුමා කියාද, මුනි+ඉදු යනු මුනිඳු කියාද සන්ධිවේ.

(3) ස්වර සන්ධිය.

43. ස්වරලොපයක් නැතිවම ස්වරය ගාත්‍රාක්ෂරයට පැමිණීමෙන් ගැළපෙන සන්ධිය ස්වරසන්ධි නාම් වේ.

පස්+ඇස් යන ශබ්දදෙක පසැස් කියා සන්ධිවේ. මෙහි පර ශබ්දයේ ඇ යන ස්වරය පෙර ශබ්දයේ ස් යන ගාත්‍රාක්ෂරයට පැමිණුණුකල පසැස් කියා වේ.

පින්+ඇති යනු පිනැති කියාද සුරන්+ඉදු යනු සුරනිඳු කියාද සන්ධිවීම මෙකියනලද ක්‍රමයෙන් වේ.

(4) ස්වරාදෙශ සන්ධිය.

44. ස්වරයක් ආදෙශවීමෙන් ගැළපෙන සන්ධිය ස්වරාදෙශසන්ධි නාම් වේ.

සන්ධිකළ යුතු ස්ථානයෙහි සිටි අ ඉ වෙනුවට එ යන ස්වරයද අ උ වෙනුවට ඔ නොහොත් ඕ යන

ස්වරයද ආදෙශකිරිමෙන් ශබ්ද දෙකක් ගළපනු ලැබේද ඒ සන්ධානය ස්වරාදෙශසන්ධියයි කියත්.

මහ+ඉසුරු යනු මෙහෙසුරු කියා සන්ධිවේ. මහ ඉසුරු කියා සිටි කල්හි පූර්ව ශබ්දයේ පරස්වරයවූ අ යන්නද අපර ශබ්දයේ පූර්වස්වරයවූ ඉ යන්නද ලොප් කොට එයන්න ආදෙශකළ කල්හි මහෙසුරු කියා වේ. නැවත පිලිපෙරළිවිමෙන් මෙහෙසුරු කියා වේ.

මහ+උර යනු මොහොර කියා සන්ධිවේ. මහ+උර කියා සිටි කල්හි අ උ ලොප්කොට ඔ ආදෙශකළ කල්හි මහොර කියා වෙයි. නැවත පිලිපෙරළිකළ කල්හි මොහොර යන පදසිද්ධය වේ. ලඹ+උරා යනු ලඹෝරා කියා සන්ධිවිම අ උ ලොප්ව ඕ ආදෙශවීමෙන් වන්නේය.

(5) ගාත්‍රාදෙශ සන්ධිය.

45. ගාත්‍රාක්ෂරයක් ආදෙශවීමෙන් ගැළපෙන සන්ධිය ගාත්‍රාදෙශසන්ධි නම් වේ.

දඹු+කම්, ගිනි+කම් යන වචනවල ககාරයන් ලොප්කොට වකාර යකාර ආදෙශකළ කල්හි දඹුවම්, ගිනියම්, යනු සිධවේ.

බුදු+සරණ යන්නෙහි දකාරයේ ස්වරය ලොප් කොට තකාරය ආදෙශකළ කල්හි බුත්සරණ කියා වේ. හෙබ+තොට යන්නෙහිද බකාරයේ ස්වරය ලොප්කොට ප යනු ආදෙශකළ කල්හි හෙප්තොට කියා වේ.

(6) පූර්වරූප සන්ධිය.

46. අපර ශබ්දයේ මූලකුර පූර්ව ශබ්දයේ අග කුර හා සමාන රූප ගැනීමෙන් ගැළපෙන සන්ධිය පූර්වරූපසන්ධි නම් වේ.

අත්+කම්, වත්+කම්, ගෙත්+කම්, විස්+කම් යන මොහු අත්තම්, වත්තම්, ගෙත්තම්. විස්සම් කියා සන්ධිකරනුලැලෙත්.

(7) පරරූප සන්ධිය.

47. පූර්ව ශබ්දයේ අගකුර අපර ශබ්දයේ මුල කුර හා සමාන රූප ගැනීමෙන් හැලපෙන සන්ධිය පරරූප සන්ධි නම් වේ.

ලක්+ගල කියා සිටි කල්හි පෙර පෙදෙහි ක යන්න පසු පෙදෙහි ගයන්ගේ රූපය ගෙන ලග්ගල කියා සන්ධිවේ.

(8) ගාත්‍රාක්ෂර ලොප සන්ධිය.

48. ගාත්‍රාක්ෂරයක් ලොප්වීමෙන් ගැලපෙන සන්ධිය ගාත්‍රාක්ෂර ලොපසන්ධි නම් වේ.

අඹ+මල් යනු අම්මල් කියා සන්ධිවේ. මෙහි අඹ යන්හෙහි බකාරය ප්‍රාණාක්ෂරයත් සමග ලොප්කොට එහි අඹ් අනුනාසිකාක්ෂරයට මාත්‍රාවෘඩිකළ කල්හි අම්මල් කියා සන්ධිවේ. මෙපරිද්දෙන්ම නෙළුඹ්+මල් යනු නෙළුම්මල් කියාවේ.

(9) ආගම සන්ධිය.

49. ගාත්‍රාක්ෂරයක් ආගමවීමෙන් ගැලපෙන්නේ ආගමසන්ධි නම් වේ.

පුන+උත් යනු පුනරුත් කියා සන්ධිවේ. මෙහි පසු පෙදෙහි මූලකුරවූ උකාරය ආශ්‍රයකොට රකාරය ආගම වේ. පිරි+අත් යනු පිරියත් කියාද, තුනු+අග යනු තුනුවග කියාද, සිවු+අග යනු සිවුරග කියාද පසු පෙදෙහි ප්‍රාණාක්ෂරයන් ආශ්‍රයකොට යකාර වකාර රකාරයන් ආගමවීමෙන් පදසිඩිය වේ.

(10) විරූප සන්ධිය.

50. පූර්ව ශබ්දයේ අග සිටි ස්වරය ලොප්කොට ගාත්‍රාක්ෂරයට විරූප ඉපදවීමෙන් ගැළපෙන්නේ විරූපසන්ධි නම් වේ.

වැලි+අවුරු යන්න වැල්ලවුරු කියා සන්ධිවේ. මෙහි වැලියන්තෙහි ලකාරයේ ස්වරය ලොප්කොට විත්ව කළ කල්හි වැල්ල්+අවුරු කියා වේ. නැවත අකාරය හල් ලකාරය කරා පැමිණවූ කල්හි වැල්ලවුරු කියා සන්ධිවේ. මෙපරිද්දෙන්ම හෙළිලි+අඹු යන්න හෙළිල්ලඹු කියාද තුලු+එව් යන්න තුල්ලෙව් කියාද සන්ධිවේ.

19b. සංස්කෘත සන්ධි.

51. මිශ්‍රසිංහල භාෂාවෙහි ව්‍යවහාරවන සංස්කෘත වචන සංස්කෘත ව්‍යාකරණ ක්‍රමයෙන් සන්ධිකරනුලැබේ.

52. සමාන ස්වර දෙකක් පූර්වපද පරපද සිටි කල ඒ දෙක එක්ව එක දීර්ඝ ස්වරයක් වන්නේය.

උදාහරණ:—

අ + අ = ආ	:	පරම	+	අර්ථ	=	පරමාර්ථ
අ + ආ = ආ	:	යුද්ධ	+	ආයුධ	=	යුද්ධායුධ
ආ + අ = ආ	:	යථා	+	අවකාශ	=	යථාවකාශ
ආ + ආ = ආ	:	මහා	+	ආත්ම	=	මහාත්ම
ඉ + ඉ = ඊ	:	මුනි	+	ඉන්ද්‍ර	=	මුනීන්ද්‍ර
ඉ + ඊ = ඊ	:	මුනි	+	ඊශ්වර	=	මුනීශ්වර
ඊ + ඉ = ඊ	:	සුධී	+	ඉන්ද්‍ර	=	සුධීන්ද්‍ර
ඊ + ඊ = ඊ	:	පෘථිවී	+	ඊශ්වර	=	පෘථිවීශ්වර
උ + උ = ඌ	:	ධාතු	+	උපසර්ග	=	ධාතූපසර්ග

උ + ඌ = ඌ: සින්ධු + ඌර්මි = සින්ධූර්මි
ඌ + උ = ඌ: ශරයූ + උදක = ශරයූදක
ඌ + ඌ = ඌ: ශරයූ + ඌර්මි = ශරයූර්මි
ඍ + ඍ = ඎ: පිතෘ + ඍණ = පිතෲණ
ඎ + ඎ = ඎ: කෲ + ඎකාර = කෲකාර

52. පූර්ව පර අවර්ණ ඉවර්ණ දෙක එක්ව එකාර බවට පැමිණේ.

උදාහරණ:—

අ + ඉ = ඒ: උප + ඉන්ද්‍ර = උපේන්ද්‍ර
අ + ඊ = ඒ: ගණ + ඊශ්වර = ගණේශ්වර
ආ + ඉ = ඒ: ජිහ්වා + ඉන්ද්‍රිය = ජිහ්වේන්ද්‍රිය
ආ + ඊ = ඒ: ලඞ්කා + ඊශ්වර = ලඞ්කේශ්වර

54. පූර්ව පර අවර්ණ උවර්ණ දෙක එක්ව ඔකාර බවට පැමිණේ.

උදාහරණ:—

අ + උ = ඕ: හිත + උපදේශ = හිතෝපදේශ
අ + ඌ = ඕ: ධන + ඌන = ධනෝන
ආ + උ = ඕ: මහා + උත්තම = මහෝත්තම
ආ + ඌ = ඕ: ගඞ්ගා + ඌර්මි = ගඞ්ගෝර්මි

55. අවර්ණ ඍවර්ණ දෙක එක්ව අර් හෝ ආර් යන රූපයට පැමිණේ.

උදාහරණ:—

අ + ඍ = අර්: දේව + ඍෂි = දේවර්ෂි
ආ + ඍ = අර්: මහා + ඍෂි = මහර්ෂි
අ + ඍ = ආර්: ශීත + ඍත = ශීතාර්ත

56. අවර්ණය හා එකාරයද අවර්ණය හා ඓකාරයද දෙක එක්ව ඓකාර බවට පැමිණේ.

උදාහරණ:—

අ + එ —ඓ: ගුණ + එකත්ව —ගුණෛකත්ව
අ + ඓ—ඓ: සකල + ඓශ්වර්ය—සකලෛශ්වර්ය
ආ + එ —ඓ: සදා + එකත්ව —සදෛකත්ව
ආ + ඓ—ඓ: සංඥා + ඓක්‍ය —සංඥෛක්‍ය

57. අවර්ණය හා ඔකාරයද අවර්ණය හා ඖකාරයද දෙක එක්ව ඖකාර බවට පැමිණේ.

උදාහරණ:—

අ + ඔ —ඖ: නව + ඔදන —නවෞදන
ආ + ඖ—ඖ: මහා + ඖෂධ—මහෞෂධ

58. අසමාන ස්වරයකින් පූර්වයෙහි සිටි ඉවර්ණය යකාර බවට පැමිණේ.

උදාහරණ:—

අති + අපි —අත්‍යපි
ප්‍රති + ආසනන —ප්‍රත්‍යාසනන
ප්‍රති + උත්තර —ප්‍රත්‍යුත්තර
අති + ඌන —අත්‍යූන
ප්‍රති + එක —ප්‍රත්‍යෙක
අති + ඓශ්වර්ය—අත්‍යෛශ්වර්ය
දධි + ඔදන —දධ්‍යොදන
මහි + අඞ්ගණ —මහ්‍යඞ්ගණ
නදී + ආදි —නද්‍යාදි

59. අසමාන ස්වරයකින් පූර්වයෙහි සිටි උවර්ණය වකාර බවට පැමිණේ.

උදාහරණ:—

මනු+අන්තර=මන්වන්තර
අනු+ඉත =අන්විත
අනු+එෂණ =අන්වේෂණ
සාධු+ආසන =සාධ්වාසන

60. අසමාන ස්වරයකින් පූර්වයෙහි සිටි ඍකාරය රකාර බවට පැමිණෙ.

උදාහරණ:—

පිතෘ +අපි =පිත්‍රපි
නප්තෘ+ආදි=නප්ත්‍රාදි

61. ඝෝෂාක්ෂරයකින් පූර්වයෙහි සිටි අඝෝෂාක්ෂරයහට එම වර්ගයේ ඝෝෂාක්ෂරයෙක් ආදේශ වේ.

උදාහරණ:—

වාක්+අපි =වාගපි
අච් +අන්ත=අජන්ත
ෂට් +වර්ග =ෂඩ්වර්ග
තත්+ගුණ =තද්ගුණ
අප් +ජ =අබ්ජ

62. තාලුජාක්ෂරයකින් පූර්වයෙහි සිටි දන්තජාක්ෂරය තාලුජ බවට පැමිණේ.

උදාහරණ:—

සත්+චරිත්‍ර=සච්චරිත්‍ර
සත්+ජන =සජ්ජන

63 මූර්ධජාක්ෂරයකින් පූර්වයෙහි සිටි දන්තජාක්ෂරය මූර්ධජ බවට පැමිණේ.

උදාහරණ:—තත්+ටීකා—තට්ටීකා

64. පූර්ව පර තකාර ශකාර දෙක සන්ධිවීමේදී තකාරයට චකාරද ශකාරයට ඡකාරද ආදෙශ වේ. විකල්පයෙහෙසින් කිසි තැනෙක ශකාරයට ඡාදෙශ නොවේ.

උදාහරණ:—{ තත්+ශිෂ්‍ය—තච්ඡිෂ්‍ය
තත්+ශිෂ්‍ය—තච්ශිෂ්‍ය

20. අනුනාසිකාක්ෂර.

65. අනුනාසිකාක්ෂරයන්ගේ ප්‍රයොගය භාෂාන්තරක්‍රමය ස්වභාෂාක්‍රමය යි විවිධ වේ.

මිශ්‍ර සිංහල භාෂාවේ ව්‍යවහාරවන මාගධ සංස්කෘත ශබ්දවල අනුනාසිකාක්ෂර යෙදීම ඒ භාෂා පිළිබඳ ව්‍යාකරණ පරිද්දෙන් වේ. ශුද්ධ සිංහල භාෂාවේ අනුනාසිකාක්ෂර සිංහලභාෂා රීතියට අනුව යොදනු ලැබේ.

(1) (මාගධ සංස්කෘත) භාෂාන්තර ක්‍රමය,

66. වර්ගාක්ෂරයක් හා සමග පූර්වව බැඳෙන අනුනාසිකාක්ෂරය ඒ වර්ගයේම වර්ගාන්ත අනුනාසිකය වේ.

ඞ යන්න කවර්ගයේ අක්ෂරයන් හා පූර්වව බැඳේ. එසේම ඤ්, ණ්, න්, ම්, යන මොහු පිළිවෙළින් තාලුජ, මූර්ධජ, දන්තජ, ඔෂ්ඨජ, වර්ගවල අක්ෂරයන් හා පූර්වව බැඳෙත්.

උදාහරණ:—

ඞ්	ඤ්	ණ්	න්	ම්
ලඞ්කා	වඤ්චක	කණ්ටක	දන්ත	සම්පන්න
ශඞ්කා	සඤ්ජනන	කණ්ඨ	ග්‍රන්ථ	සම්ඵුල්ල
ජඞ්ඝා	සඤ්ජාත	දණ්ඩ	නන්ද	සම්බන්ධ
ගඞ්ගා	සඤ්ඣා	ෂණ්ඪ	අන්ධ	සම්භව
සඞ්ඝ	සඤ්ඤ	ෂණ්ණවති	භින්න	සම්මත

67. ය, ර, ල, ව, ශ, ෂ, ස, හ යන අක්‍ෂරයන්ට පූර්වයෙන් අනුස්වාරයම අනුනාසික වශයෙන් ලැබේ. වර්ගාන්ත අනුනාසිකයෙක් නොලැබේ.

උදාහරණ:—සංයුක්ත, සංරාජ, සංලක්‍ෂණ, සංවත්සර, අංශ, දංෂ්ට්‍රා, හංස, සිංහ.

අනුස්වාරයද කිසිවිටෙක වර්ගාන්ත අනුනාසිකයන් වෙනුවටද විකල්පවශයෙන් යෙදේ.

උදාහරණ:—ලඞ්කා—ලංකා, සඤ්චාර—සංචාර, ගඞ්ගා—ගංගා, සඞ්ඝ—සංඝ, සඤ්චය—සංචය, යනාදියයි.

68. ඍ, ර, ෂ, යන අක්‍ෂරයන් කෙරෙන් පරවූ නකාරයට ණකාරාදේශ වේ.

උදාහරණ:— ඍණ මරණ කෘෂ්ණ
තෘණ ප්‍රණාම දක්‍ෂිණ

69. ඍ, ර, ෂ, යන අක්‍ෂරයක් හා දන්තජ අනුනාසිකාක්‍ෂරය අතරට ස්වර, කවර්ග, පවර්ග, හකාර, යකාර, වකාර, යන මේ අක්‍ෂර පැමිණියේ නමුදු ඒ අනුනාසිකාක්‍ෂරය මූර්ධජ වේ.

උදාහරණ:—විතකීණ තෘපණ ග්‍රහණ
ප්‍රගුණ ප්‍රමාණ ප්‍රයාණ
දපීහ රෝහිණී ශ්‍රවණ

70. ඍ, ර, ෂ, යන මේ අක්ෂරයන් හා නකාරය අතරම තාලුජ හෝ දන්තජාක්ෂරයක් පැමිණියේ නම් අනුනාසිකාක්ෂරය මූර්ධජ නොවේ.

උදාහරණ:—

රචනා	ප්‍රශ්න	ප්‍රාර්ථනා
දුර්ජන	දර්ශිත	මර්දන
රඤ්ජන	කාශීන	වර්ධන

71. සමාස පදයන්හි * මූල පදයේ ඍ, ර, ෂ යන අක්ෂරයන් නිසා පරපදයේ නකාරයට ණකාරාදේශ බොහෝසෙයින් නොවේ.

උදාහරණ:—

ගෘහ + උපවන = ගෘහොපවන
දෙවදරු + වන = දෙවදරුවන
ත්‍රි + භුවන = ත්‍රිභුවන
ධර්ම + නීති = ධර්මනීති
විෂ + නාශන = විෂනාශන

කිසිතැනෙක නිත්‍ය වශයෙන්ද විකල්ප වශයෙන්ද එසේ ණකාරාදෙශ වේ.

උදාහරණ:—ශර + වන = ශරවණ; ඉක්ෂු + වන = ඉක්ෂුවණ යනාදි නිත්‍යයි.

දූර්වා + වන = දූර්වාවණ — දූර්වාවන; වදරී + වන = වදරීවණ — වදරීවන; යනාදි විකල්පයි.

---

* සමාසපදනම් වෙන වෙන ශබ්දදෙකක් එකශබ්දයක්සේ ගැලපීමෙන් සෑදෙන පදයි.

72. ඍ වර්ණාදි ණත්වනිමිත්ත නැති ශබ්දයන්හි ණකාරය ප්‍රකෘතියෙන් වන්නේය.

සමහර සංස්කෘත ශබ්දයන්හි ණත්ව යට නිමිත්ත වූ ඍ, ර, ෂ, යන අක්ෂර නැතිවත් ණකාරය දක්නාලැබේ. ඒ ප්‍රකෘති ණකාර නම් වේ.

උදාහරණ:—කල්‍යාණ, කුණප, කෝණ, ගණ, ගුණ, ගණිකා, පාණි, පුණ්‍ය, මණි, මාණික්‍ය, ලවණ, වාණ, වාණිජ්‍ය, වීණා, යනාදියයි.

(2) ස්වභාෂාක්‍රමය.

21 නකාරය.

73. ශුද්ධසිංහල ශබ්දයන්ගේ නකාරය තත්සම වශයෙන්ද තද්භව වශයෙන්ද ආදේශ වශයෙන්ද බොහෝසෙයින් යෙදේ.

(1) තත්සම නකාරය.

74. මාතෘශබ්දයේ නකාරය හා සමානව යෙදෙන නකාරය තත්සම නකාර නම්.

උදාහරණ:—

සංස්කෘත.	මාගධ.	සිංහල.
අග්නි	ගිනි	ගිනි
ඝන	ඝන	ගන (වලාකුළ)
ජන	ජන	දන (සත්ව)
ධන	දන	දන (වස්තු)
මනු	මනු	මනු (එනම් රජ)
වන	වන	වන (අරණ්‍යය)
ස්තන	ථන	තන (පයොධර)

මාගධාදි භාෂාවකින් සිංහලට භිනනවූ ශබ්දයක්හුගේ ප්‍රකෘතිය කවරේද යත්හු ඒ ශබ්දය තවත් ශබ්දයකට මුලින් යොදා එක ශබ්දයක්සේ ගළපා පදයක් සිඩකිරීමෙන් දූන ගතහැකිවේ, රිවිදින, රිව්රැස, යනාදි පදයන්හි රිවි කියාම සිටීන බැවින් රවි ශබ්දයෙන් බිදී ආ සිංහලශබ්දප්‍රකෘතිය රිවියයි පෙනේ. ගිනිදූල්, ගනතල්, දනකැත්, දතපති, මනුරජ, වනවීල්, තනකිරි, යන මේ පදයන්හි පූර්වවූ ගිනි, ගන, දන, දත, මනු, වන, තන, යන මේ ශබ්දද මුල් ප්‍රකෘති බව සැලකිය යුතුයි

(2) තද්භව නකාරය.

75. මාතෘශබ්දයේ නකාරයෙන් බිඳීඑන නකාරය තද්භව නකාරනම්.

මාතෘශබ්දයේ ස්වර-සහිත නකාරය අන්‍ය ස්වරයක් ආරූඪව හෝ හලන්තව හෝ සිංහලට යෙදේ නම් ඒ තද්භවනකාර නම් වේ. ඌන යනු උනු කියා අසමාන ස්වර සහිතවද දන යනු දත් කියා හලන්තවද යෙදෙන්නාක්මෙනි.

උදාහරණ:—

සංස්කෘත.	මාගධ.	සිංහල.
උද්‍යාන	උය්‍යාන	උයන්
කනක	කනක	කනා (රත්රන්)
ග්ලාන	ගිලාන	ගිලන්
නයන	නයන	නුවන්
ලශුන	ලසුන	ලූනු
නාල	නාල	නල
පානීය	පානීය	පැන්
මනුෂ්‍ය	මනුස්ස	මිනිස්
රත්න	රතන	රුවන්
———	ගිම්හාන	ගිමන්

(3) ආදෙශ නකාරය.

76. මාගධශබ්දයේ ණකාරය නසා එම ස්ථානයට පත්වන්නාවූ නකාරය ආදෙශ නකාර නම් වේ.

ණකාරය උපධාකොට ඇති සංස්කෘත මාගධ ශබ්ද සිංහලට හිනානාවිටදී හලන්තව බිඳුණේ නම් ඒ හල්වූ ණකාරයට නකාරාදෙශ වේ. වෙණු ශබ්දය පළමුකොට වෙණ් කියා හිනානාවූ කල්හි නැවත වෙන් කියා සිඩවන්නාක්මෙනි.

උදාහරණ:—

සංස්කෘත.	මාගධ.	සිහල.
ආපණ	ආපණ	ඇවන්
කර්ණ	කණ්ණ	කන්
ත්‍රීණි (පද)	තීණි (පද)	තුන්
පර්ණ	පණ්ණ	පන්
වර්ණ	වණ්ණ	වන් (පැහැය)

හලන්ත ශබ්දයන්ගේ අන්තයෙහි සිටි දන්තජ නකාරයට ස්වරයක් ආරූඪවූ කල්හිද දන්තජවම සිටී. එය මූර්ධජ බවට පැමිණීමට විධානයක් එළු වියරණෙහි නොපෙනේ. පුරාතන මහා පණ්ඩිතයන්ගේ පද්‍යබන්ධනාදියෙහිද මේ දන්තජ ආදෙශ නකාරය සුප්‍රකාශවම පෙනේ.

සැළලිහිණි අස්නෙහි.

උන්නෙනාව බරණ සිවුසැට ඔවුන්නුත් පැල ද
වේනුමෙන් පසක් උන්සඳ සිහසුන් මැ ද
මන්නුරජකුලෙන් පැවතෙන පිළිවෙළ නොසි ද
ශනු අවසරය එනිරිඳු සිරිපතුල් වැ ද

මනහර නා මෙනෙවියනිද ලවැලිපි ට
ගෙන මිණි වෙණ තත් නියගින් මැද රුව ට
කණනෙහෙව කියන බුදුගුණ ගී මියුරුකො ට
සැපාගෙව කැලණි ගඟබඩ මද කලක් සි ට

මෙහි වෙන් ශබ්දයෙන් සිඩවූ 'වේනු' යන පදයෙහිද කන් ශබ්දයෙන් සිඩවූ 'කන' යන පදයෙහිද දන්තජ නකාරයම ව්‍යවහාරකළ බව එළි සව්වීමෙන් පෙනේ.

22. ණකාරය.

77. ණකාරය බොහෝසෙයින් තත්සම වශයෙන්ද තද්භව වශයෙන්ද වේ.

(1) තත්සම ණකාරය.

78. මාතෘශබ්දයේ ණකාරය හා සමානව යෙදෙන ණකාරය තත්සම නම්.

මූර්ධජ ණකාරය උපධාකොට ඇති සංස්කෘත මාගධ ශබ්ද සිංහලට ස්වරානුගව බිඳෙනකල මාතෘශබ්දගත ස්වරසහිත ණකාරයම යෙදේනම් ඒ තත්සම ණකාර නම්. පාණ යන ශබ්දය පණ කියා සිංහලට බිඳෙනකල මාතෘශබ්දයේ ස්වරසහිත ණකාරය හිතන ශබ්දයෙහිද සමානව යෙදෙන්නාක්මෙනි.

උදාහරණ:—

සංස්කෘත.	මාගධ.	සිංහල.
කිඞ්කිණී	කිංකිණී	කිකිණි
ගණ	ගණ	ගණ (සමූහය)
වර්ණ	වණ්ණ	වණ (අක්ෂර)
ව්‍රණ	වණ	වණ (තුවාල)
තෘණ	තිණ	තණ
භාණ	භාණ	බණ
මණි	මණි	මිණි

ලේඛකප්‍රයෝගයෙහි තත්සම ණකාරය.

ලෙසින් තව තව ප ණ
රකිනා බුදුන්ගේ බ ණ
පමණනොකළැකි ගු ණ
ලොවට පින්කෙත්ව සිටි සඟග ණ

(2) තද්භව ණකාරය.

79. අන්‍ය ස්වරයක් ආරූඪව තිබෙන ණකාරය තද්භව ණකාර නම්.

මාතෘශබ්දගත ස්වර සහිත ණකාරය අන්‍ය ස්වරයක් ආරූඪව තිබේනම් ඒ තද්භව ණකාරයයි කියනු ලැබේ. ලොණ ශබ්දය දුණු තියා අන්‍ය ස්වර යුක්ත ණකාරවත්ව අසමානව යෙදෙන්නාක් මෙනි.

සංස්කෘත.	මාගධ.	සිංහල.
උෂ්ණ	උණ්හ	උණු
බ්‍රාහ්මණ	බ්‍රාහ්මණ	බමුණු
ලක්ෂ්ණ	ලක්ඛණ	ලකුණු
විණා	විණා	වෙණ
චූර්ණ	චුණ්ණ	සුණු

ජේකප්‍රයොගයෙහි තද්භව ණකාරය.

අනතුරු දුණු බමු ණු
රජුවෙතට වුත් සකුණු
ඔසවා අත දකු ණු
කියා මෙතෙපුල් තොසින් සපිරු ණු

80. සංස්කෘත මාගධ දෙකේ ණකාර නකාරයන්ගේ විශෙෂයක් ඇතිකල්හි සිංහල ශබ්දය මාගධිය අනුවයේ.

ප්‍රාකෘතවූ දෙශමාගධීය සිංහලභාෂාවේ මව්භාෂාව බැවින් සිංහලශබ්දයන්ගේ ණකාර නකාර මාගධියට එකභවන පරිද්දෙන්ම යෙදීම ජේ ප්‍රයොගයෙහි සිඩයි.

සංස්කෘත.	මාගධ.	සිංහල.
ඥාන	ඤාණ	නැණ, නුවණ
ජානු	ජාණු	දණ
ෆේන	ෆේණ	පෙණ

ඝ්‍රාණ	ඝාන	ගහන
ශ්‍රවණ	සවන	සවන්
නිර්වාණ	නිබ්බාන	නිවන්

සිංහල තත්සම තද්භව ණකාර නකාරයන් මෙසේ මාගධියට අනුරූපව යෙදීම පුරාතන ව්‍යක්ත පණ්ඩිතයන්ගේ පද්‍යබන්ධන යෙන්ද සුප්‍රකාශ වේ.

කාව්‍යශේඛරයෙහි.		ගුත්තිලෙහි.	
ග දෙස්ද නුනුව	ණ	ගිමනලෙස පවනි	න්
මණුරූ දුසිරිත් නොපව	ණ	නිවන බවදුක් නිවනි	න්
උසුන් මුල්කළ නැ	ණු	සවන දිව සවනි	න්
ඇතිවවැජබෙනසේක මුනිමෙ	ණ	සවණකර ඒ නැඟි යහනි	න්

සංස්කෘත මාගධ දෙක්හි ණකාර නකාරයන්ගේ වෙනස කරණකොට නැණ ආදී යටකී සිංහල ශබ්දවල ණකාර නකාරයන් විකල්පකොට සලකා ඇතම්තැනෙක කිසිවිටෙක නැණ, දණ, පෙණ, ගහණ, සවණ, නිවණ. කියා මූර්ධජ ණකාරද කිසිවිටෙක නැන, දන, පෙන, ගහන, සවන, නිවන, කියා දන්තජ නකාරද යොදත්. ඒ වනාහි ජේකප්‍රයෝගානුගත නොවේ.

81. මාගධ සංස්කෘත දෙක්හි මූර්ධන්‍ය ණකාරය මුල්කොට ඇති ශබ්දයක් (නාමයක්) නොලැබේ. ශුද්ධසිංහලභාෂාවෙහි වනාහි කිසිවිටෙක ලැබේ.

ඍණයට නාම්වූ මාගධ 'ඉණ' ශබ්දයෙන් ශුද්ධසිංහලව බිඳුණු 'ණය' ශබ්දය මූර්ධන්‍යාදිව යෙදේ, ණය, ණයගැති, ණයහිමි, යනාදීය වේ. මේ ණය ශබ්දය මෙකල දන්ත්‍යාදි කොට ලියත නමුත් ඒ ශාස්ත්‍රක්‍රමයට නොයෙදේ. මෙහි තත්සම මූර්ධන්‍ය ණකාරයම යෙදීම ජේකප්‍රයෝගයෙනි පැනෙන හෙයිනි.

82. ණකාර නකාරයන් වෙනස්වීමෙන් කිසි විටෙක අර්ථයන්ගේද වෙනස් බව වේ.

උදාහරණ:—

සංස්කෘත,	මාගධ.	සිංහල.
උෂ්ණ	උණ්හ	උණු (දහවත්)
ඌන	ඌන	උනු, උන් (අඩුවූ)
කාණ	කාණ	කණ (එකැස් කණා)
කර්ණ	කණ්ණ	කන්, කන (සවන)
කනක	කනක	කනා (රත්රන්)
ගණ	ගණ	ගණ (සමූහය)
ඝන	ඝන	ගන (සාන්ද්‍ර, වලාකුළ)
තෘණ	තිණ	තණ (තණකොළ)
තෘෂ්ණා	තණ්හා	තණ (ඇශාව)
ස්තන	ථන	තන (පයොධර)
ජානු	ජාණු	දණ (දණහිස)
ජන	ජන	දන (සත්ව)
ධන	ධන	දන (වස්තුව)
වර්ණ	වණ්ණ	වණ (අක්ෂර)
ව්‍රණ	වණ	වණ (තුවාල)
වර්ණ	වණ්ණ	වන්, වන (පැහැය)
වන	වන	වන (අරණ්‍ය)
ප්‍රාණ	පාණ	පණ (ප්‍රාණය)
පුනඃ	පුන	පන (නැවත)
රණ	රණ	රණ (යුද්ධය)
ස්වර්ණ	සොණ්ණ	රන්, රන

23. ළකාර ලකාරයන්ගේ විභාග.

(මාගධ සංස්කෘත.)

83. මිශ්‍ර සිංහල භාෂාවේ ලැබෙන සංස්කෘත මාගධ ශබ්දවල ලකාර ළකාරයන් යෙදීම ඒ භාෂාවල නියමය පරිද්දෙන් වන්නේය.

'සිංහල' යන සංස්කෘත ශබ්දයෙහි දන්තජ ලකාරය වේ. 'සීහළ' යන මාගධ ශබ්දයෙහි මූර්ධජ ළකාරය වේ. මේ මාගධ ප්‍රකෘතියෙන් සිහළ, හෙළ, හෙළු, එළු, යන ශබ්දරූප ශුද්ධසිංහලට බිඳී ආබව පෙනේ. මේ ශබ්ද මිශ්‍රසිංහල භාෂාවේ ව්‍යවහාරකරනකල ලකාර ළකාර දෙක මාරුකොට 'සිංහළ' කියා හෝ 'සීහල' කියා හෝ ලිවීම ශාස්ත්‍රක්‍රමයට නොයෙදේ. 'ප්‍රවාල' යන සංස්කෘත ශබ්දය ප්‍රවාළ කියා හෝ 'පවාළ' යන මූර්ධජ ළකාරවත් මාගධ ශබ්දය පවාල කියා හෝ ලියයුතු නොවේ: දන්තජ ලකාර සහිත මාගධ ශබ්ද මූර්ධජ ළකාර කොටද ලියයුතු නොවේ.

24· ළකාරය. (ශුද්ධසිංහල)

84. ශුද්ධසිංහලභාෂාවේ ළකාරය තත්සම වශයෙන්ද තද්භව වශයෙන්ද ආදේශ වශයෙන්ද නිෂ්පන්න වශයෙන්ද යෙදේ.

(1) තත්සම ළකාරය.

85. මාතෘශබ්දයේ ළකාරයට සමානව යෙදෙන ළකාරය තත්සම ළකාර නමි.

උදාහරණ:—

සංස්කෘත.	මාගධ.	සිංහල.
ඛෙට	ඛෙළ	කෙළ
දරිද්‍ර	දළිද්ද	දිළිඳු
ද්‍රවිඩ	දමිළ	දෙමළ
නාලි	නාළි	නැළි
වඩවා	වළවා	වෙළඹ

මෙහි මාතෘ ශබ්දය මාගධ කොට සැලකිය යුතුයි.

(2) තදභව ළකාරය.

86. අන්‍ය ස්වරයක් ආශ්‍රිතව සිඳෙන ළකාරය තද්භව ළකාර නමි.

මාතෘශබ්දයේ ස්වර සන්ත ළකාරය කියිවිටෙක අන්‍ය ස්වරයකින් යුක්තව සිංහලට බිඳේ. ඒ ළකාරයට තද්භව ළකාරයයි කියනුලැබේ.

උදාහරණ:—

සංස්කෘත.	මාගධ.	සිංහල.
අරාල	අළාර	ඇළ
ක්‍රීඩා	කීළා	කෙළි
ක්ෂුල්ල	චූළ	සුළු
ගරුඩ	ගරුළ	ගුරුළු
චූඩාමණි	චූළාමණි	සිළුමිණ
දාඩිම	දාළිම	දෙළුම්
දෘඩ	දළ්හ	දළ
ප්‍රවාඩ-ප්‍රවාල	පවාළ	පබළු
මූඪ	මූළ්හ	මුළා
විඩාල	බිළාල	බළල්
ෂොඩශ	සොළස	සොළොස්

මාතෘශබ්ද මාගධයෙකාට සැලකිය යුතුයි.

(3) ආදේශ ළකාරය.

87. මාතෘශබ්දයේ අන්‍ය මූර්ධජාක්ෂරයකට ආදේශවූ ළකාරය ආදේශ ළකාර නමි.

උදාහරණ:—

සංස්කෘත.	මාගධ.	සිංහල.
කණ්ට	කාකාට	කාකුළු
කවාට, කපාට	කාවාට	කවුළු

කටු	කටු	කැළි
කට	කට	කැළි
කුක්කුට	කුක්කුට	කුකුළු
කොට්	කොටි	කොළ
ඝට	ඝට	කළ
දංෂ්ට්‍රා	දඨා	දළ
නට	නට	නළු
පරිපාටි	පටිපාටි	පිළිවෙළ
පෘථිවි	පඨවි	පොළොව්, පොළෝ
ප්‍රථම	පඨම	පළමු
ප්‍රති-	පති-පටි-	පිළි-
ප්‍රතිමා	පටිමා	පිළිම
ප්‍රතිපත්ති	පටිපත්ති	පිළිවෙත්

(4) නිෂ්පන්න ළකාරය.

88. ර, හ, යනාදි අක්ෂර යොගයක් නිසා හෝ නොනිසා හෝ ශිෂ්ට ව්‍යවහාරයෙහි යෙදෙන ළකාරය නිෂ්පන්න ළකාර නම්.

මාගධ සංස්කෘතාදි ශබ්දයකින් භින්නවූ සිංහල භාෂාවෙහිම ප්‍රකටවූ බොහෝ ශබ්දයන්හිද රකාර හකාරද නිමිත්තක් බලාද නොබලාද ළකාරය යෙදේ.

උදාහරණ:—රළ, රැළි, රාළ, රිළ, කෝරළ, හෙළි, මුළු, ඔළ මොළ, යනාදියයි.

89 සංස්කෘත මාගධ දෙක්හි ලකාර ළකාර යන්ගේ විශෙෂයක් ඇතිකල්හි සිංහල ශබ්දය මාගධියට අනුරූපව සිටි.

සංස්කෘතයෙහි ලකාරය වෙනුවට කිසිවිටෙක මාගධියෙහි ළකාරය යෙදේ එබඳු ශබ්දයන්ගෙන් භින්නවූ සිංහලෙහිද මූර්ධජ ළකාරය ඡේක ප්‍රයොගයෙහි යෙදේ.

උදාහරණ:—

සංස්කෘත.	මාගධ.	සිංහල
ඵලක	ඵළක	එළි
කලභ-කරභ	කළභ	කළඹ (තාරුණ්‍යහස්තියා)
කාල	කාළ	කළු (පැහැය)
කාලාගුරු	කාළාගුරු	කළු අගිල්
කාලාඞ්ග	කාළඞ්ග	කළඹ (වැසිවලාකුළ)
ක්ෂුල්ල	චූළ	සුළු
ගොල	ගොළ	ගුළි
නාඩි-නාලි	නාළි	නාළි
නාලි	නාළි	නැළි

90. සංස්කෘත සෝබියේ දන්තජ ලකාරය මූර්ධජ ස්ථානීයවද යෙදේ.

සංස්කෘතභාෂාවේ මූර්ධජ ළකාරයක් නොමැති බැවින් මූර්ධජාක්ෂරය වෙනුවටද දන්තජ ලකාරයම යෙදේ. **ඵලක**, ගොල, **නාලි**, යනාදි සංස්කෘත ශබ්දවල ලකාරය මූර්ධජ ස්ථානීයකොට සැලකිය යුතුයි. මක්නිසාද ඒ ශබ්ද **ඵර්**, **ගුඩ්**, **නඩ්**, යනාදි ධාතුන්ගෙන් සිද්ධව එහි ලකාරය ර්, ඩ්, ඩ්, යන මූර්ධජාක්ෂරයන් වෙනුවට සිටින හෙයිනි. මේ ධාතුන්ගෙන් සිද්ධවූ ඵළක, ගොළ, නාළි, යන මාගධ ශබ්දයන්හි මූර්ධජ ළකාරය පෙනේ. එහෙයින් එයින් භින්නවූ එළි, ගුළි, නැළි, යන සිංහල ශබ්දයන්හිද මූර්ධජ ළකාරයම විය යුතුයි. මෙහි ළකාරය විකල්පකොට ගතනොහැකි බැවින් එලු, ගුලි, නැලි, කියා ලිවීම ශාස්ත්‍රක්‍රමයට නොයෙදේ

91. මාගධ සංස්කෘත දෙක්හි මූර්ධන්‍ය ළකාරය මුල්කොට ඇති නාමයක් නොලැබේ, ශුද්ධසිංහලෙහි කිසිතැනෙක ලැබේ.

හෘදයවාචකවූ මාගධ 'හදය' ශබ්දයට ආදෙශ යෙන් සිද්ධවූ 'හළ' යන්නෙහි හකාරය ලොප්වී 'ළ' නිසා සිංහලට බිඳුණු කල්හි මූර්ධන්‍ය ළකාරය මුලට යෙදේ. මේ ළ ශබ්දය සමහරු දන්ත්‍යාදිකොට යොදත්. නමුත් මූර්ධන්‍යාදිකොට යෙදීම පිළිගත යුතු පුරාණ ලිපිආදියෙන් පෙනේ. මේ ළ ශබ්දය හළ යන්නෙන් සිද්ධවූ බව 'දෙළදුක' (දෙහළ දුක්ඛ), මනදෙළ (මනොදෙහද), යහළු (සුහද), යනාදීන් පෙනේ.

92. ශුද්ධසිංහලභාෂාවේ ලකාරය තත්සම වශයෙන්ද තද්භව වශයෙන්ද ආදෙශ වශයෙන්ද නිෂ්පන්න වශයෙන්ද වන්නේය.

(1) තත්සම ලකාරය.

93. මාතෘශබ්දයේ ලකාරයට සමානව යෙදෙන ලකාරය තත්සම ලකාර නම්.

උදාහරණ:—

සංස්කෘත.	මාගධ	සිංහල.
අඞ්ගුලි	අඞ්ගුලි	ඇඟිලි
කාලිඞ්ග	කාලිඞ්ග	කාලිඟු
තූල	තූල	තූල
ජල	ජල	දල
මූල	මූල	මූල
මූල, මූල්‍ය	මූල	මිල

(2) තද්භව ලකාරය.

94. අන්‍ය ස්වරයක් ආරූඪව බිඳෙන ලකාරය තද්භව ලකාර නම්.

සංස්කෘත.	මාගධ.	සිංහල
ආලොක	ආලොක	අලු
උත්පල	උප්පල	උපුල්

නිර්මල	නිම්මල	නිමල්
නීල	නීල	නිල්
ශිල	සිල	සිල්, සුදු
——	මහල්ලක	මහලු

(3) ආදෙශ ලකාරය.

95. අන්‍යඅක්ෂරයකට ආදේශවූ ලකාරය ආදෙශ ලකාරනාම්.

මාගධ 'වන' ශබ්දය විල් කියාද 'සිඛා' ශබ්දය සිලු කියාද සිංහලට බිදේ. මෙහි ලකාරය ආදෙශ ලකාර නම් වේ.

පද නතාශයෙහි හල් 'ළ' කාරයට ලකාරාදෙශ වේ. මාගධ ලලාට ශබ්දය පළමුකොට නලළ් කියා කිනාවූකල්හි නැවත නලල් කියා වේ. කෙවට්ට ශබ්දය පළමුකොට කෙවුළ් කියා කිනාවූකල්හි නැවත කෙවුල් කියා වේ. මේ ආදී තන්හි ලකාරයද ආදෙශ ලකාරයයි සලකනුලැබේ.

(4) නිෂ්පනන ලකාරය.

96. තත්සම වශයෙන් හෝ තද්භව වශයෙන් හෝ ආදෙශ වශයෙන් හෝනොව සිංහල ශබ්දයන්හිම ප්‍රකෘතියෙන් සිටි ලකාරය නිෂ්පනන ලකාර නම්.

උදාහරණ:—විල්, ගැල්, වෙල්, කැලෑ, අල, යනාදියයි.

97. ළකාර ලකාර වෙනස්වීමෙන් අර්ථයන් ශේද වෙනස් බව වේ.

උදාහරණ:—

සංස්කෘත.	මාගධ.	සිංහල.
ආසන්න	ආසන්න	අසල (සමීප)
ආචරිත	ආචරිත	අසළ (පුරුදුකළ)
ආශ්‍රිත	ආසිත	අසළ (ඇසුරුකළ)
කාල	කාළ	කළු (අඳුරුපැහැය)
කල්‍ය	කල්ල	කලු (උදාපත්)
කාල	කාල	කල (කාලය)
කාන්තා	කන්තා	කල (අඟනාව)
ඝට	ඝට	කළ (කළගෙඩිය)
කූට	කූට	කුළ (ශිඛරය)
කුල	කුල	කුල (වංශය)
දංෂ්ට්‍රා	දාඨා	දළ (දන්තවිශේෂය)
දෘඪ	දළ්හ	දළ (දැඩි)
දල	දල	දල (පත්‍ර)
ජල	ජල	දල (දිය)
——	දාඨිකා	දැළි (උඩු රැවුල)
ජාල	ජාල	දැල් (දැල)
——	ජල්ල	දැලි (රජස්, මල)
නට	නට	නළ (නටන්නා)
නාල	නාල	නාල (කුහර සහිත දණ්ඩ)
අනිල	අනිල	නල (වාතය)
භට	භට	බළ (යුධකරන්නා)
බල	බල	බල (ශක්තිය)
ප්‍රකට	පාකට	පළ (ප්‍රකාශ)
ඵල	ඵල	පල (ගෙඩි, ප්‍රයොජන)
මාල්‍ය	මාල්‍ය	මල් (පුෂ්පය)
මල	මල	මල (සෙවදදිය)
මෘත	මත	මළ (මැරුණු)
ආවාට	ආවාට	වළ (මිට්තැන)

සංස්කෘත.	මාගධ.	සිංහල.
වන	වන	වල,වල් (අරණ්‍යය)
චූඩා	චූළා	සිළු (කිරීට)
ශිඛා	සිඛා	සිලු (ප්‍රදීපාදීන්ගේ ශිඛා
ක්‍ෂුල්ල	චුල්ල-චූළ	සුළු (කුඩා)
ශීල	සීල	සුලු (සවභාවය)

26. ශ, ෂ, ස.

98. ශකාර ෂකාර සකාරයෝ ඒ ඒ භෂාවන්හි නියමය පරිද්දෙන් යොදනු ලැබෙත්.

ශ, ෂ, ස, යන අක්ෂර තුනම සංස්කෘත භාෂායෙහි ලැබෙයි. මාගධ සිංහල දෙක්හි සකාරය පමණක් ලැබේ.

27. ශකාරය.

99. චකාර ශකාරයන්ට පූර්වයෙහි ශකාරය සංයොග වේ. ෂකාර සකාරයෝ සංයොග නොවෙත්.

උදාහරණ:—ආශ්චර්‍ය්‍ය, දුශ්චරිත, නිශ්චය, නිශ්චල, පශ්චාත්තාප, පශ්චිම, දුශ්ශීල, නිශ්ශඞ්කා, නිශ්ශබ්ද, නිශ්ශෙෂ, යනාදියයි.

100. ශකාරය ප්‍රකෘතියෙන්ද වන්නේය.

උදාහරණ:—

ශක්ති	ශිෂ්‍ය	ශොභන	ත්‍රිංශත්
ශක්‍ර	ශිඛී	ශ්‍රද්ධා	දශදිශා
ශත	ශිල	ශ්‍රමණ	පිශාච
ශබ්ද	ශුද්ධ	ශ්‍රවණ	ප්‍රකාශ
ශයන	ශුභ	ශ්‍රීමත්	ප්‍රදෙශ
ශස්‍ය	ශූන්‍ය	ශ්‍රෙෂ්ඨ	මිශ්‍ර
ශාඛා	ශූර	ශ්ලෙෂ	යශස්

ශාන්ති	ශෘඞ්ග	ශ්ලොක	රශ්මි
ශාලා	ශෙඛර	ශ්වාස	වශග
ශාස්ත්‍ර	ශෙෂ	ශ්වෙත	විශාල
ශික්ෂා	ශෛල	කශා	විශිෂ්ට
ශිඛර	ශොක	කුශල	විශෙෂ
ශිථිල	ශොධන	කෘශ	විශ්වාස
ශිව	ශොණි	කෙශ	ස්පර්ශ

28. ෂකාරය.

101 ට, ඨ, ණ, යන අක්ෂරයන්ට පූර්වයෙහි ෂකාරය සංයොග වේ. ශකාර සකාරයෝ සංයොග නොවෙත්.

උදාහරණ:—

ඉෂ්ට	අධිෂ්ඨාන	උෂ්ණ
කාෂ්ට	ඔෂ්ඨ	කෘෂ්ණ
කුෂ්ඨ	ධර්මිෂ්ඨ	තුෂ්ණීම්භූත
තුෂ්ට	කාෂ්ඨ	තෘෂ්ණා
දුෂ්ට	නිෂ්ඨා	විෂ්ණු

102. ක, ර, යන අක්ෂරයන්ගෙන් පරව බොහෝසෙයින් ෂකාරය සංයොගවේ.

උදාහරණ:—අක්ෂ, අක්ෂි, අක්ෂර, ආරක්ෂා, දක්ෂ, වෘක්ෂ, යක්ෂ, ක්ෂෙත්‍ර, ශීර්ෂ, වර්ෂ, වර්ෂා, සර්ෂප, යනාදී යසි.

දර්ශන ස්පර්ශ යනාදියෙහි ෂකාරය සංයොග නොවේ.

103. කිසිතැනෙක සකාරයට ෂකාරය ආදෙශවේ.

කිසියම් ශබ්දයක සකාරය ඊට මුලින් ගැළපෙන අන්‍ය ශබ්දයක් නිසා ෂකාර බවට පැමිණේ.

උදාහරණ:—

වි + සම = විෂම
සු + සම = සුෂම
නි + සද්‍යා = නිෂද්‍යා
ප්‍රති + සේධ = ප්‍රතිෂේධ

104. ෂකාරය ප්‍රකෘතියෙන්ද වන්නේය

උදාහරණ:—

ඊෂත්	කෝෂ	භාෂා	රෝෂ
උෂ්ම	ශෝෂ	භූෂණ	විභීෂණ
ඍෂි	තුෂාර	මහිෂ	විෂ
ඖෂධ	දෝෂ	මුෂල	වෘෂභ
කෂාය	පාෂාණ	මේෂ (රාශි)	ශේෂ
කෘෂි	පෝෂණ	යුෂ්මද්	ඝෝෂ

28. සකාරය. (සංස්කෘත)

105. සාමාන්‍යයෙන් ත, ථ, න, යන අක්ෂරයන් හා සමග සකාරය සංයෝග වේ, ශකාර ෂකාරයෝ සංයෝග නොවෙත්.

උදාහරණ:—

උත්සඟී	අස්ත	ස්තම්භ	ස්නාන
උත්සව	ප්‍රස්තාව	ස්තුති	ස්නායු
උත්සාහ	මස්තක	ස්ත්‍රී	ස්නාත
චිකිත්සා	වස්ත්‍ර	ස්ථවිර	ස්නිග්ධ
මත්ස්‍ය	විස්තර	ස්ථාන	ස්නුත
වත්සර	වස්තු	ස්ථිර	ස්නේහ

නිපාතන:—ප්‍රශ්නආදී කිසි ශබ්දයක නකාරය හා සමග සකාරය නොව ශකාරය සංයෝග වේ.

29. සකාරය. (ශුද්ධසිංහල)

106. ශුද්ධසිංහලභාෂාවේ සකාරය බොහෝ සෙයින් තත්සම වශයෙන්ද තද්භව වශයෙන්ද ආදේශ වශයෙන්ද ලැබේ.

(1) තත්සම සකාරය.

107. මාතෘශබ්දයේ සකාරය භින්න ශබ්දයෙහිත් සමානස්වරව යෙදේද ඒ තත්සම සකාර නම් වේ.

සංස්කෘත.	මාගධ.	සිංහල.
සර්ව	සබ්බ	සව්
සද	සද	සද
සම්බන්ධ	සම්බන්ධ	සබඳ
සුඛ	සුඛ	සුව
සුගන්ධ	සුගන්ධ	සුවඳ
ප්‍රසන්න	පසන්න	පසන්
සේනා	සේනා	සෙන්

(2) තද්භව සකාරය.

108. අසමාන ස්වරයකින් යුක්තව ඞිදීඑන ස කාරය තද්භව සකාර නම් වේ.

සංස්කෘත.	මාගධ.	සිංහල.
ශඞ්කා	සංකා	සැක
ශ්‍රද්ධා	සද්ධා	සැදැහැ
ශ්‍රාවස්ති	සාවත්ථි	සැවැත්
ශාසන	සාසන	සසුන්
පරිශුද්ධ	පරිසුද්ධ	පිරිසිදු
වර්ෂා	වස්සත	වැසි

(3) ආදේශ සකාරය.

109. මාතෘශබ්දයේ චකාර ඡකාරයන්ට ආදේශවූ සකාරය ආදේශ සකාර නම් වේ.

සංස්කෘත.	මාගධ.	සිංහල.
චක්‍ර	චක්ක	සක
චම්පක	චම්පක	සපු
චණ්ඩාල	චණ්ඩාල	සැඬොල්
චාප	චාප	සැව්
චරණ	චරණ	සරණ
චක්‍රවාට	චක්කවාට	සක්වළ
චණ්ඩ	චණ්ඩ	සැඬ
චරිත	චරිත	සිරිත්
ඡේක	ඡේක	සේ
ක්ෂණ	ඡණ	සැණ
ඡත්‍ර	ඡත්ත	සත්
ජීර්ණ	ජිණ්ණ	සුන්

30. ඌනමාත්‍ර අනුනාසිකාක්ෂරය.

(16 හා සම්බන්ධයි.)

110. ශුද්ධසිංහල ශබ්දයන්ගේ ඌනමාත්‍ර අනුනාසිකාක්ෂරය වනාහි බොහෝසෙයින් මාතෘශබ්දයේ අනුනාසිකාක්ෂරයක ඌනමාත්‍රයෙක් වේ.

සංස්කෘත.	මාගධ.	සිංහල.
අඞ්ගාරි	අංගාරි	අඟුරු
තුඞ්ග	තුංග	තුඟු
මණ්ඩල	මණ්ඩල	මඬල
කුණ්ඩල	කුණ්ඩල	කොඬොල්

සංස්කෘත.	මාගධ.	සිංහල.
අඤ්ජන	අඤ්ජන	අඳුන්
ඉන්දු	ඉන්දු	ඉඳු
අන්ධ	අන්ධ	අඳ
ගන්ධ	ගන්ධ	ගඳ
ආම්‍ර	අම්බ	අඹ
තුම්බ	තුම්බ	තුඹු

111. ග, ජ, ද, බ, යන අක්ෂරයන්ට කිසිවිටෙක ඌනමාත්‍ර අනුනාසිකාක්ෂරයෙක් ආදෙශවේ.

පදඅන්තයෙහි සිටිවූ ග, ජ, ද, බ, යන අක්ෂර යන්ගෙන් යුක්තවූ මාගධාදි ශබ්ද ශුද්ධසිංහලට භින්නාවීමේදී කිසිවිටෙක පූර්වයෙන් සිටි හල් ව්‍යඤ්ජනය ලොප්වී ඌනමාත්‍ර අනුනාසිකාක්ෂරයෙක් පර ව්‍යඤ්ජනය හා සමග සංයොගවේ. ජකාරාන්ත ශබ්ද යන්ගේ පර ජකාරය දකාර බවට පැමිණේ. දළිද්ද යන මාගධ ශබ්දයේ පූර්ව වූ හල් දකාරය ලොප්වී පර දකාරයට ඌනමාත්‍ර අනුනාසිකාක්ෂරයෙක් සංයොගවූ කල්හි දළිඳ කියා වේ. නැවත පිලිපෙරළි වීමෙන් දිළිඳු කියා පද සිද්ධය වේ.

උදාහරණ:—

සංස්කෘත.	මාගධ.	සිංහල
කාලාම්බු	කාළම්බු	කාළඹ
දරිද්‍ර	දළිද්ද	දිළිඳු
ප්‍රසිද්ධ	පසිද්ධ	පසිඳු
වාණිජ	වණිජ්ජ	වෙණඳ—වෙළඳ
මාර්ග	මග්ග	මග—මං

2 වෙනි කාණ්ඩය.

II. පද විධිය.

112. පදභෙද, විභක්තිකාර්‍ය, පදව්‍යුත්පත්ති, යනාදිය දක්වීම පදවිධි නම්වේ.

පදනම් අර්‍ථ ප්‍රකාශකරන ශබ්දයි. සිංහලභාෂාවේ ශබ්දයෝ නාම, ආඛ්‍යාත, උපසර්‍ග, නිපාත යන පද සතරකට බෙදෙත්.

31. නාමපද

113. නාමපද නම් ලිඞ්ග, විභක්ති, වචන, ලත් ශබ්දයෝය.

උදාහරණ:—මිනිසා, මව්, පුටු, මුහුද.

114. ජාති, ද්‍රව්‍ය, ගුණ, සංඥා, ක්‍රියා සි නාම ශබ්දයෝ පඤ්චවිධ වෙත්.

(1) නොයෙක්දෙනා එකාකාරයෙන් හඟවන් නාඩු නාමය ජාති නම් වේ: දෙව්, මිනිස්, වඳුරු, ගොන්, අශ්ව, යනාදියයි.

(2) ගුණයකින් යුක්ත දේවලට කියන නාම ද්‍රව්‍යනාම නම් වේ. පොත්, වැලි, ගල්, යනාදියයි.

(3) ද්‍රව්‍යයක පිහිටි ලක්‍ෂණයක් දක්වන්නේ ගුණශබ්ද නම් වේ. කළු, දිගු, තද, රළු, හොඳ, නොහොඳ, යනාදියයි.

(4) පණවනලද නාමය සංඥා නම් වේ. රජසිංහ, ශ්‍රීවර්‍ධන, කොළඹ, මැණික්සාමි, යනාදියයි.

(5) ක්‍රියාවක් කරන්නා හෝ ක්‍රියා මාත්‍රය හඟවන ශබ්ද ක්‍රියාශබ්ද නම් වේ.

(a) ක්‍රියාවක් කරන්නා හඟවන ශබ්ද අපීක්‍රියා නාම් වේ. බලන්නා, බලන්නේ, බලනුයේ; යනාදියයි.

(b) ක්‍රියාව පමණක් හඟවන ශබ්ද භාවක්‍රියා නාම් වේ. කීම, කියනු, කරනු යනාදියයි.

115. නාමයෝ ලිඞ්ගභෙද, සඞ්ඛ්‍යාභෙද, විභක්තිභෙද, ඇත්තාහු වෙත්.

32. ලිඞ්ගභෙදය.

116. නාම ශබ්දයෝ පුංලිඞ්ගය, ස්ත්‍රීලිඞ්ගය, නපුංසකලිඞ්ගය, යන ලිඞ්ගත්‍රයකට බෙදෙත්.

සංස්කෘතභාෂාවේ නාමශබ්දයෝ පුංලිඞ්ගය, ස්ත්‍රීලිඞ්ගය, නපුංසකලිඞ්ගය, යන ලිඞ්ගත්‍රයකට බෙදෙත්. නමුත් ශුද්ධ සිංහලභාෂාවේ පුංලිඞ්ග නපුංසකලිඞ්ග දෙක්හි විශෙෂ ව්‍යවහාරයක් නැති හෙයින් නපුංසකලිඞ්ගයට ඇතුළත් සිංහල ශබ්ද පුංලිඞ්ග ව්‍යවහාරයෙන් යෙදිය යුතුවේ.

117. පුරුෂලක්ෂණයෙන් යුත් සත්වයන් කියන ශබ්ද පුංලිඞ්ග නාම් වේ.

උදාහරණ:—මිනිස්, ගොන්, යනාදියයි.

118. ස්ත්‍රීලක්ෂණයෙන් යුත් සත්වයන් කියන ශබ්ද ස්ත්‍රීලිඞ්ග නාම් වේ.

උදාහරණ:—අඹු, දූ, නැසිනි, යනාදියයි.

119. බොහෝසෙයින් ප්‍රකෘතියට ආ ප්‍රත්‍යය යෙදීමෙන් පුංලිඞ්ග ශබ්දයද ඊ ආදි ප්‍රත්‍යයන් යෙදීමෙන් ස්ත්‍රීලිඞ්ග ශබ්දයද සෑදේ.

උදාහරණ:—

ප්‍රකෘතිය	පුංලිඞ්ග	ස්ත්‍රිලිඞ්ග
ඇඳුරු	ඇඳුර	ඇඳුරි
ඇත්	ඇතා	ඇතිනී
ඌරු	ඌරා	ඊරි
කුකුළු	කුකුළා	කිකිළි
දශ	දශයා	දශි
බමුණු	බමුණා	බැමිණී
මහණ	මහණා	මෙහෙණී
මුනුබුරු	මුනුබුරා	මිනිබිරි
යක්	යකා	යකිනී
යහළු	යහළුවා	යෙහෙළි
වලස්	වලහා	වැලහිණී
සප්	සපා	සැපිනී
හස්තින්	හස්තියා	හස්තිනී

කොරා–කෙර, මහල්ලා–මැහැල්ල, හොරා–හෙර, මේ–මෝ, තෙම–තොමෝ, මූ–මෑ, ඌ–ඈ, යනාදිය පණකුරු ආදෙශවිමෙන් වන්නේය.

120. ප්‍රකෘතියෙන් පරව ස්ත්‍රිවාචක අන්‍ය ශබ්දයක් යෙදීමෙන්ද ඇතම් ශබ්දයන්ගේ ස්ත්‍රිලිඞ්ගය කියත්.

ප්‍රකෘතිය	පුංලිඞ්ග	ස්ත්‍රිලිඞ්ග
එළු	එළුවා	එළුදෙන්
ගුරුළු	ගුරුළා	ගුරුළුදෙන්
මුව	මුවා	මුවදෙන්
මෘග	මෘගයා	මෘගධෙනුව
සිංහ	සිංහයා	සිංහධෙනුව

දෙන්යනු ශුද්ධසිංහල ශබ්දයන්ගෙන් පරවද ධෙනු යනු සංස්කෘත මාගධ ශබ්දයන්ගෙන් පරවද යෙදෙත්.

121. ඇතම් ප්‍රාණීන්ගේ පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග එකිනෙකට වෙනස් වචනයන් ගෙන් කියත්.

පුංලිඞ්ග	ස්ත්‍රීලිඞ්ග	පුංලිඞ්ග	ස්ත්‍රීලිඞ්ග
අශ්ව	වෙළඹ	මයිල්	නෑදි
ගොන්	දෙන්	මිනිස්	ගෑනු
පිය	මව්	මොනර	සෙබඩ
පුත්	දූ	රජ	බිසෝ
පුරුෂ	ස්ත්‍රී	සැමි	අඹු

122. අප්‍රාණීවාචක ශබ්දයෝ පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග නපුංසක ලිඞ්ගයන තුන් ලිඞ්ගයටම බෙදෙත්.

අප්‍රාණී ශබ්දයන්ගේ ලිඞ්ගය මාගධ සංස්කෘත ශාස්ත්‍රාඥ සාරයෙන් දත යුතුයි.

උදාහරණ:—

(1) පුංලිඞ්ගශබ්ද.

සංස්කෘත	මාගධ	සිංහල
ආකාශ	ආකාස	අහස්
ග්‍රාම	ගාම	ගම්
චන්ද්‍ර	චන්ද	සඳ
සූර්ය	සූරිය	හිර

(2) ස්ත්‍රීලිඞ්ගශබ්ද.

කථා	කතා	කතා
තාරා	තාරා	තරු
නිශා	නිසා	නිසා
ප්‍රඥා	පඤ්ඤා	පැණ
ලඞ්කා	ලඞ්කා	ලක්

(3) නපුංසක ලිඞ්ගශබ්ද

සංස්කෘත.	මාගධ.	සිංහල.
ගෘහ, ගෙහ	ගෙහ, ගහ	ගෙ
ජීවිත	ජීවිත	දිවි
නගර	නගර	නුවර
හෘදය	හදය	හද, අද

123. අර්ථක්‍රියා ශබ්දද ගුණශබ්දද ඊං ප්‍රත්‍යය ලැබීමෙන් ස්ත්‍රී අර්ථය ප්‍රකාශකෙරේ.

පුංලිඞ්ග.	ස්ත්‍රීලිඞ්ග	පුංලිඞ්ග.	ස්ත්‍රීලිඞ්ග
යන්තා යන්නෙ යන්තුයෙ	යන්ති	කොමලා ගොරා	කොමලී ගොරී
කාරන්තා කාරන්තෙ කාරන්තුයෙ	කාරන්ති	සුරතලා සුද්ද	සුරතලී සුද්දී

124. භාවක්‍රියා ශබ්ද පුංලිඞ්ගාර්ථයෙහි වන්නේය. නිපාත පද සහ උපසර්ග පදයෝ ලිඞ්ග මුක්තවෙත්,

33. සඞ්ඛ්‍යාභෙදය.

125. එක් සත්වයකු හෝ එක් දෙයක් ප්‍රකාශ කරන වචන එකවචන නම් වේ. ඊට වැඩි ගණනක් ප්‍රකාශකරන වචන බහුවචන නම් වේ.

පුංලිඞ්ග එකවචනයෙහි බොහෝසෙයින් ආ ප්‍රත්‍යයද බහුවචනයෙහි ඕ, හු, උ, යනුද වෙත්.

ප්‍රකෘතිය.	එකවචන.	බහුවචන.
සතුරු	සතුරා	සතුරෝ
මිනිස්	මිනියා	මිනිස්හු, මිනිස්සු
බමර	බමරා	බමරු

සතුරු ශබ්දයෙන් පරව 'අ' ප්‍රත්‍යය කළ කල්හි සතුරු+අ යන්නු වේ. පූර්වස්වරලෝප විධියෙන් සන්ධිකළ කල්හි සතුරා කියා ඒකවචනය සිද්ධවේ. එසේම ඕ ප්‍රත්‍යය කළ කල්හි බහුවචනයෙහි සතුරු ඕ කියාවේ. පූර්වස්වරලෝප විධියෙන් සන්ධිකළ කල්හි සතුරෝ යන්නුවේ.

ප්‍රාණවාචක ස්වරාන්ත ශබ්දයන්ට බහුවචනයෙහි ඕ, හු, උ, යන ප්‍රත්‍යයෝද හලන්ත ශබ්දයන්ට හු ප්‍රත්‍යයද බොහෝ සෙයින් යෙදෙත්. කුකුළු—කුකුළෝ, මිනිස්—මිනිස්හු, මිනිස්සු, බමර—බමරු, යනාදියෙහි මෙනි.

126. ස්ත්‍රීලිඞ්ග ඒකවචනයෙහි බොහෝසෙසින් අ, ප්‍රත්‍යයද බහුවචනයෙහි ඕ, හු, උ, යන ප්‍රත්‍යයෝද වෙත්.

ප්‍රකෘතිය.	ඒකවචන.	බහුවචන.
අඹු	අඹුව	අඹුවෝ
දෙන්	දෙන	දෙන්හු, දෙන්නු
ලඳ	ලඳ	ලන්දු

අඹු ශබ්දයෙන් පරව 'අ' ප්‍රත්‍යය කළ කල්හි අඹු+අ කියා වේ. වකාරගම කළ කල්හි අඹු+ව්+අ කියා වේ. හල් වකාරයට අකාරය ආරූඪකළ කල්හි අඹුව කියා ඒකවචනය සිඬවේ. එසේම ඕ ප්‍රත්‍යය කළ කල්හි අඹුවෝ කියා බහු වචනය සෑදේ.

127. බහුවචනයේ ඕ ප්‍රත්‍යයට පූර්වයෙන් ගෞරව පිණිස ආණු, අණු, ඇණි, යන ප්‍රත්‍යයෝ යොදනුලබත්.

ආණු, අණු, පුංලිඞ්ගික ශබ්දයන් සමගද ඇණි ස්ත්‍රීලිඞ්ගික ශබ්දයන් සමගද යෙදියයුතු වේ.

ප්‍රකෘතිය.	ප්‍රත්‍යයවත්ශබ්දය.	බහුවචනය.
පිය	පියාණ	පියාණෝ
සිටු	සිටාණ	සිටාණෝ
පුත්	පුතාණු	පුතාණුවෝ
මල්	මලණු	මලණුවෝ
මව්—මා	මෑණි	මෑණියෝ
දූ	දුවණි	දුවණියෝ

මේ යට දැක්වූ 'ආණ' ආදි ප්‍රත්‍යයන්ගේ මූලබීජ අප්‍රාණාශී කාක්ෂරය ජේත ප්‍රයෝගයෙහි (පුරාතන ශුඩ ලිපියෙහි) දක්නාලැබේ.

128. 'වර' යනුද එකවචන බහුවචන දෙක් හිම ප්‍රත්‍යයන්ට පූර්වයෙන් ගෞරව පිණිස යොදනු ලබත්.

ප්‍රකෘතිය.	එකවචන.	බහුවචන.
ගුරු	ගුරුවරයා	ගුරුවරයෝ, ගුරුවරු
පඬි	පඬිවරයා	පඬිවරයෝ, පඬිවරු
සිටු	සිටුවරයා	සිටුවරයෝ,සිටුවරු

ගුරු ශබ්දයෙන් පරව ගෞරවාර්ථිත වර ශබ්ද යෙදූ එහි අගට පුංලිඞ්ග එකවචනයට නිසි ආ ප්‍රත්‍යය කළ කල්හි ගුරු + වර + ආ කියාවේ, යකාරාගම කළ කල්හි ගුරු + වර + ය් + ආ කියා වේ. හල් යකාරයට ආකාරය ආරූඪකළ කල්හි ගුරු වරයා කියා සිඬවේ. ඕ, උ, යෙදීමෙන් ගුරුවරයෝ, ගුරුවරු, කියාද සිඬවේ.

129. ප්‍රාණිවාචක ශබ්දයන්ගේ බහුවචනයන් හි කිසිතැනෙක ලා යන ප්‍රත්‍යය යෙදේ.

උදාහරණ:—මාමා—මාමලා; සුඹ, සුඹලා.

130. ඇතම් පුංලිඞ්ග ශබ්දයන්ගේ බහුවචන ප්‍රත්‍යය ලොප්වී ප්‍රකෘති ශබ්දයම බහුවචන මෙන් ව්‍යවහාරවේ.

ප්‍රකෘතිය.	ඒකවචන.	බහුවචන.
නයි	නයා	නයි
හරක්	හරකා	හරක්
නරි	නරියා	නරි

131. අප්‍රාණී ශබ්දයන්ගේ ඒකවචනයට අ ප්‍රත්‍යයද බහුවචනයට වල් ප්‍රත්‍යයද යෙදේ.

ප්‍රකෘතිය.	ඒකවචන.	බහුවචන.
ගෙ	ගෙය	ගෙවල්
පාර	පාර	පාරවල්
කැලෑ	කැලෑව	කැලෑවල්

132. අප්‍රාණී බහුවචනයට නිසි වල් ප්‍රත්‍යය බොහෝ වචනවල ලොප්වී ප්‍රකෘති ශබ්ද බහුවචන මෙන් ව්‍යවහාරවේ.

උදාහරණ:—

ප්‍රකෘතිය.	ඒකවචන.	බහුවචන.
ගල්	ගල	ගල්
ගස්	ගස	ගස්
ගෙඩි	ගෙඩිය	ගෙඩි
පුවු	පුවුව	පුවු
මල්	මල	මල්

මෙකී ගල්වල්, ගස්වල් යනාදි වශයෙන් ව්‍යවහාරව තිබී "වල්" ලොප්වී තිබෙනබව කල්පනාකළයුතුයි. වල් යනු සංස්කෘත "වන" ශබ්දයෙන් බිඳී එන ලද්දකි. කැලෑවට නම්වූ වන ශබ්දය සමූහය හෙවත් රාශිය යන අර්ථ ඇතුව ප්‍රකෘති ශබ්දයේ අගට යෙදීමෙන් බහු අර්ථය ප්‍රකාශකිරීමට ව්‍යවහාරවූබව පෙනේ. වල් ශබ්දය වන ශබ්දයෙන් බිඳී ආබවට වනලතා—වල්ලිය, වනකුක්කුට—වල්කුකුළා, වනවර—වල්සර, යනාදිය උදාහරණවේ.

133. මැනීමෙන් හෝ කිරීමෙන් ප්‍රමාණය ගන්නා ද්‍රව්‍යයන් කියන ශබ්ද බහුවචනයෙහි වෙත්.

උදාහරණ:—වී, හාල්, කිරි, පැණි, වැලි, පස්, හුණු, රන්, රිදී, යනාදියයි.

මේ ශබ්දයන් වගී විශේෂයක් හැඟවීම උවමනාකල්හි කිසිවිටෙක ඒකාර්ථයෙහිද යොදත්. රතු පස, සුදු වැල්ල, යනාදි වශයෙනි.

34. නාම විභක්ති.

134. ප්‍රථමාවිභක්තිය, කර්මවිභක්තිය, කර්තෘවිභක්තිය, කරණවිභක්තිය, සම්ප්‍රදානවිභක්තිය, අවධිවිභක්තිය, සම්බන්ධවිභක්තිය, ආධාරවිභක්තිය, ආලපනවිභක්තිය යි නාම විභක්තිහු නව වැදෑරුම් වෙත්.*

විභක්තිනම් බෙදීමයි. නාමයක් ඒ ඒ අර්ථයට ඒකාර්ථාදි වශයෙන් බෙදන්නෙන් නාම විභක්ති නම් වේ.

* ශුද්ධසිංහල විභක්තිනාම.—පෙරවිබත්, කම්විබත්, කතුවිබත්, කරණවිබත්, සපදන්විබත්, අවදිවිබත්, සබඳවිබත්, අදරවිබත්, අලප්විබත්.

35. විභක්ති ප්‍රත්‍යය.

ඒකවචන.	බහුවචන.
ප්‍රථමා—අ, ආ, ඒ	උ, ඕ, හු, වල්
කර්ම—අ, ආ, උ, හු, ට	අන්, ආන, න්, න, නට, උන්, වල්
කර්තෘ—අ, ආ, උ, හු	අන්, ආන, උන්, න, න්
කරණ—ඉන්, ඉනි, එන්, එනි, නෙන්, නෙනි, නි	ඉන්, ඉනි, එන්, එනි, නෙන්, නෙනි, නි
සම්ප්‍රදාන—අට, ආට, උට, හුට, හට, ට	අන්ට, අනට, ආනට, උන්ට, න්ට, නට,
අවධි—අගෙන්, ආගෙන්, උගෙන්, හුගෙන්, ඉන්, එන්, නෙන්	අන්ගෙන්, ඉන්ගෙන්, උන්ගෙන්, න්ගෙන්, නෙන්
සම්බන්ධ—අගේ, ආගේ, උගේ, හුගේ, අට, උට, ආට, අ, උ, ඇ, හු	උන්ගේ, අන්ගේ, උන්ට, නට, අනට, න්ට, අන්ට, උන්, න්, අන්
ආධාර—ඇ, එහි, ඒ, හි	අන්හි, ඇ
ආලපන—අ, ආ, ඇ, ඒ, ඕ	ඉනි, එනි, නෙනි, නි

36. පදසිද්ධි.

135. ශබ්දයන් හා විභක්ති ප්‍රත්‍යය ගළපා පද සිද්ධකිරීම පස් ආකාරයකින් වන්නේය.

එනම්:—(1) පූර්වස්වරලොපසන්ධිවිධිය.
(2) ස්වර සන්ධිවිධිය.
(3) පූර්වරූප සන්ධි විධිය.
(4) යකාරවකාරාගම සන්ධිවිධිය.
(5) විරූප සන්ධිවිධිය, යන මේ පස් ආකාරයෙනි.

මෙහි ගල්වල්, ගස්වල් යනාදි වශයෙන් ව්‍යවහාරව තිබී "වල්" ලොප්වී තිබෙනබව කල්පනාකළයුතුයි. වල් යනු සංස්කෘත "වන" ශබ්දයෙන් බිඳී එන ලද්දකි. කැලෑවට නම්වූ වන ශබ්දය සමූහය හෙවත් රැසිය යන අර්ථ ඇතුව ප්‍රකෘති ශබ්දයේ අගට යෙදීමෙන් බහු අර්ථය ප්‍රකාශකිරීමට ව්‍යවහාරවූබව පෙනේ. වල් ශබ්දය වන ශබ්දයෙන් බිඳී ආබවට වනලතා—වල්ලිය, වනකුක්කුට—වල්කුකුළා, වනවර—වල්සර, යනාදිය උදාහරණවේ.

133. මැනීමෙන් හෝ කිරීමෙන් ප්‍රමාණය ගන්නා ද්‍රව්‍යයන් කියන ශබ්ද බහුවචීයෙහි වෙත්.

උදාහරණ:—වී, හාල්, කිරි, පැණි, වැලි, පස්, හුණු, රන්, රිදී, යනාදියයි.

මේ ශබ්දයන් වශී විශේෂයක් හැඟවීම උවමනාකල්හි කිසිවිටෙක එකාර්ථයෙහිද යොදත්. රතු පස, සුදු වැල්ල, යනාදි වශයෙනි.

34. නාම විභක්ති.

134. ප්‍රථමාවිභක්තිය, කර්මවිභක්තිය, කර්තෘවිභක්තිය, කරණවිභක්තිය, සම්ප්‍රදානවිභක්තිය, අවධිවිභක්තිය, සම්බන්ධවිභක්තිය, ආධාරවිභක්තිය, ආලපනවිභක්තිය යි නාම විභක්තිහු නව වැදෑරුම් වෙත්.*

විභක්තිනම් බෙදීමයි. නාමයක් ඒ ඒ අර්ථයට එකාර්ථාදි වශයෙන් බෙදන්නෙත් නාම විභක්ති නම් වේ.

---

* ශුද්ධසිංහල විභක්තිනාම.—පෙරවිබත්, කම්විබත්, කතුවිබත්, කරණවිබත්, සපදන්විබත්, අවදිවිබත්, සබඳවිබත්, අදරවිබත්, අලප්විබත්.

35. විභක්ති ප්‍රත්‍යය.

එකවචන.	බහුවචන.
ප්‍රථමා—අ, ආ, ඒ	උ, ඕ, හු, වල්
කර්ම—අ, ආ, උ, හු, ට	අන්, ආන, න්, න, නට, උන්, වල්
කර්තෘ—අ, ආ, උ, හු	අන්, ආන, උන්, න, න්
කරණ—ඉන්, ඉනි, එන්, එනි, නෙන්, නෙනි, නි	ඉන්, ඉනි, එන්, එනි, නෙන්, නෙනි, නි
සම්ප්‍රදාන—අට, ආට, උට, හුට, හට, ට	අන්ට, අනට, ආනට, උන්ට, න්ට, නට,
අවධි—අගෙන්, ආගෙන්, උගෙන්, හුගෙන්, ඉන්, එන්, නෙන්	අන්ගෙන්, ඉන්ගෙන්, උන්ගෙන්, න්ගෙන්, නෙන්
සම්බන්ධ—අගේ, ආගේ, උගේ, හුගේ, අට, උට, ආට, අ, උ, ඇ, හු	උන්ගේ, අන්ගේ, උන්ට, නට, අනට, න්ට, අන්ට, උන්, න්, අන්
ආධාර—ඇ, එහි, ඒ, හි	අන්හි, ඇ
ආලපන—අ, ආ, ඇ, ඒ, ඕ	ඉනි, එනි, නෙනි, නි

36. ප ද සි ද්ධි.

135. ශබ්දයන් හා විභක්ති ප්‍රත්‍යය ගළපා පද සිද්ධකිරීම පස් ආකාරයකින් වන්නේය.

එනම්:—(1) පූර්වස්වරලොපසන්ධිවිධිය.
(2) ස්වර සන්ධිවිධිය.
(3) පූර්වරූප සන්ධි විධිය.
(4) යකාරවකාරාගම සන්ධිවිධිය.
(5) විරූප සන්ධිවිධිය, යන මේ පස් ආකාරයෙනි.

මෙහි ගල්වල්, ගස්වල් යනාදි වශයෙන් ව්‍යවහාරව තිබී "වල්" ලොප්වී තිබෙනබව කල්පනාකළයුතුයි. වල් යනු සංස්කෘත "වන" ශබ්දයෙන් බිඳී එන ලද්දකි. කැලෑවට නම්වූ වන ශබ්දය සමූහය හෙවත් රැසිය යන අර්ථ ඇතුව ප්‍රකෘති ශබ්දයේ අගට යෙදීමෙන් බහු අර්ථය ප්‍රකාශකිරීමට ව්‍යවහාරවූබව පෙනේ. වල් ශබ්දය වන ශබ්දයෙන් බිඳී ආබවට වනලතා—වල්ලිය, වනකුක්කුට—වල්කුකුළා, වන වර—වල්සර, යනාදිය උදාහරණවේ.

133. මැනීමෙන් හෝ කිරීමෙන් ප්‍රමාණය ගන්නා ද්‍රව්‍යයන් කියන ශබ්ද බහුවචීයෙහි වෙත්.

උදාහරණ:—වී, හාල්, කිරි, පැණි, වැලි, පස්, හුණු, රන්, රිදී, යනාදියයි.

මේ ශබ්දයන් වර්ග විශේෂයක් හැඟවීම උවමනාකල්හි කිසිවිටෙක එකවචීයෙහිද යොදත්. රතු පස, සුදු වැල්ල, යනාදි වශයෙනි.

34. නාම විභක්ති.

134. ප්‍රථමාවිභක්තිය, කර්මවිභක්තිය, කර්තෘවිභක්තිය, කරණවිභක්තිය, සම්ප්‍රදානවිභක්තිය, අවධිවිභක්තිය, සම්බන්ධවිභක්තිය, ආධාරවිභක්තිය, ආලපනවිභක්තිය යි නාම විභක්තිහු නව වැදෑරුම් වෙත්.*

විභක්තිනම් බෙදීමයි. නාමයක් ඒ ඒ අර්ථයට එකවචනාදි වශයෙන් බෙදන්නෙන් නාම විභක්ති නම් වේ.

* හුඛසිංහල විභක්තිනාම.—පෙරවිබත්, කම්විබත්, කතුවිබත්, කරණවිබත්, සපදන්විබත්, අවදිවිබත්, සබඳවිබත්, අදරවිබත්, අලප්විබත්.

35. විභක්ති ප්‍රත්‍යය.

එකවචන.	බහුවචන.
ප්‍රථමා—අ, ආ, ඒ	උ, ඕ, හු, වල්
කර්ම—අ, ආ, උ, හු, ට	අන්, ආන, න්, න, නට, උන්, වල්
කර්තෘ—අ, ආ, උ, හු	අන්, ආන, උන්, න, න්
කරණ—ඉන්, ඉනි, එන්, එනි, නෙන්, නෙනි, නි	ඉන්, ඉනි, එන්, එනි, නෙන්, නෙනි, නි
සම්ප්‍රදාන—අට, ආට, උට, හුට, හට, ට	අන්ට, අනට, ආනට, උන්ට, න්ට, නට,
අවධි—අගෙන්, ආගෙන්, උගෙන්, හුගෙන්, ඉන්, එන්, නෙන්	අන්ගෙන්, ඉන්ගෙන්, උන්ගෙන්, න්ගෙන්, නෙන්
සම්බන්ධ—අගේ, ආගේ, උගේ, හුගේ, අට, උට, ආට, අ, උ, ඈ, හු	උන්ගේ, අන්ගේ, උන්ට, නට, අනට, න්ට, අන්ට, උන්, න්, අන්
ආධාර—ඇ, එහි, ඒ, හි	අන්හි, ඇ
ආලපන—අ, ආ, ඇ, ඒ, ඕ	ඉනි, එනි, නෙනි, නි

36. පදසිද්ධි.

135. **ශබ්දයන් හා විභක්ති ප්‍රත්‍යය ගළපා පද සිද්ධකිරීම පස් ආකාරයකින් වන්නේය.**

එනම්:—(1) පූර්වස්වරලොපසන්ධිවිධිය.
(2) ස්වර සන්ධිවිධිය.
(3) පූර්වරූප සන්ධි විධිය.
(4) යකාරවකාරාගම සන්ධිවිධිය.
(5) විරූප සන්ධිවිධිය, යන මේ පස් ආකාරයෙනි.

(1) පූර්වස්වරලොපසන්ධිවිධියෙන් පද සිඩකිරීම.

බමුණුශබ්දයෙන් පරව ප්‍රථමාවිභක්ති එකවචන යේ 'ආ' ප්‍රත්‍යය කළ කල්හි බමුණු+ආ කියා වේ. බමුණු ශබ්දයේ අග උකාරය ලොප්කළ කල්හි බමුණ්+ආ කියා වේ. නැවත ආ ප්‍රත්‍යය ණ් යන ගාත්‍රාක්ෂරය කර පැමිණවූ කල්හි බමුණා කියා ප්‍රථමාවිභක්ති එකවචනය සිඩවේ. මෙසේම බමුණු ශබ්දයට බහුවචනයට නිසි 'ඕ' ප්‍රත්‍යය කළ කල්හි බමුණෝ කියා ප්‍රථමාවිභක්ති බහුවචනය සිඩවේ. බමුණු ශබ්දයේ සෙසු විභක්තිද මෙපරිද්දෙන්ම ණුයන්නේ ස්වරය ලොප්කොට ප්‍රත්‍යයන් යෙදී මෙන් සිඩවන්නේය.

(2) ස්වර සන්ධිවිධියෙන් හා පූර්වරූප සන්ධිවිධියෙන් පද සිඩකිරීම.

ගොන් ශබ්දයෙන් පරව ආ ප්‍රත්‍යය කළ කල්හි ගොන්+ආ කියා සිටී. හල් නකාරයට ආකාරය පැමිණවූවිට ගොනා කියා ප්‍රථමාවිභක්ති එකවචනය සිඩවේ. ගොන් ශබ්දයට බහුවචනයේ හු ප්‍රත්‍යය කළ කල්හි ගොන්+හු කියා වේ. හකාරයට පෙර රූ ලද කල්හි ගොන්නු කියා ප්‍රථමාවිභක්ති පහුවචනය සිඩවේ.

(3) යකාරවකාරාගමවිධියෙන් පද සිඩකිරීම.

සිංහ ශබ්දයෙන් පරව ආ ප්‍රත්‍යය කළ කල්හි සිංහ+ආ කියාවේ. යකාරාගම කළ කල්හි සිංහ+ය්+ආ කියා සිටී. නැවත හල් යකාරයට ආකාර ආරූඪ කළ කල්හි සිංහයා කියා ප්‍රථමාවිභක්ති එකවචනය සිඩවේ. මෙපරිද්දෙන් ඕ ප්‍රත්‍යය කළ කල්හි සිංහයෝ කියා බහුවචනය සෑදේ.

එළු ශබ්දයෙන් පරව සම්ප්‍රදානවිභක්ති ඒකවචන යේ ආට ප්‍රත්‍යය කළ කල්හි එළු+ආට කියා සිටී, වකාරාගම කළ කල්හි එළු+ව්+ආට කියා වේ. හල් වකාරයට ආ පැමිණවූවිට එළුවාට කියා සම්ප්‍රදාන ඒකවචනය සිඩවේ. සෙසු විභක්තිද මෙසේමැයි.

(4) විරූප සන්ධි විධියෙන් පද සිඩකිරීම.

කවුළු ශබ්දයෙන් පරව ආ ප්‍රත්‍යය ලූ කල්හි කවු ළු+ආ කියා වේ. පූර්වස්වරලොප සන්ධි විධියෙන් ක වුළු ශබ්දයේ අග උයන්න ලොප්කළ කල්හි ක වුස්+ආ කියා වේ. හල් සකාරය විරූප කළ කල්හි කවුස්+ස්+ආ කියා වේ. පර සකාරයට ආකාරය පැමිණවූ කල්හි කවුස්සා කියා ප්‍රථමාවිභක්ති ඒක වචනය සිඩවේ. සෙසු විභක්තිද මෙසේමැයි.

(1) ප්‍රථමාවිභක්තිය.

136. අවසාන ක්‍රියාවකින් කියවෙන පදාර්ථ යෙහි ප්‍රථමාවිභක්තිය යෙදේ.

ක්‍රියාවකින් හැඟෙන ප්‍රථමාව උක්තාර්ථයෙහි ප්‍රථමා නම් වේ.

ඒකවචන	බහුවචන
අ, ගස වැඩෙන්නේය	උ, සොරු බඩු ගනිත්
ආ, කුකුළා අඩලයි	ඕ, බල්ලෝ බුරත්
ඒ, බෙළේ බළාමීකෙරේ	හු, පක්ෂිහු පියාසර කරත්
	වල්, ගෙවල් වැටෙත්

ප්‍රථමාවිභක්ති රූප වශයෙන් පුංලිඞ්ග ඒකාර්ථයෙහි තෙම, තෙමේ, යසුද, ස්ත්‍රීලිඞ්ග ඒකාර්ථයෙහි තොම, තොමෝ, යසුද, මේ ලිඞ්ගවලයේම බහුවර්ථයෙහි තුමූ යසුද යොදත්.

උදාහරණ:—

උද්‍යානපාලයතෙම උයනේ ඵල ගෙන රජහට දක් වන්නේය.

ඒ විලයතෙමේ වෛශ්‍රවණ රජ්පුරුවන්ගේ දිය රකු සකු විසින් ලබනලද්දේය.

ඒ පොකුණතොමෝ පස්පියුමෙන් සැදුම්ලද්දීය. බ්‍රාහමණයෝතුමූ කුලධර්මය රකිත්.

137. ලිඞ්ගාර්ථයෙහි ප්‍රථමාවිභක්තිය වේ.

වාක්‍ය සම්බන්ධයක් නැතිව ලිඞ්ගය පමණක් හඟුත්වන නාමපද ප්‍රථමාවිභක්තියෙහි වේ.

උදාහරණ:—මිනිසා, වඳුරා, ඇතින්, බැමිණි ගඟා, දනා දියයි.

(2) කර්මවිභක්තිය.

138. කර්තෲගේ ක්‍රියාවට යටත්වන පදාර්ථය කර්මවිභක්තිය භජනය කෙරේ.

කර්තෲගේ ක්‍රියාවට යටත්වන පදාර්ථය නම් කර්තෲගේ ක්‍රියාව විඳිනු ලබන්නාය, හෙවත් ක්‍රියාව හා බැඳෙන්නාවූ දෙයයි. එය ප්‍රකාශකරන නාමයෙන් පරව කර්මවිභක්තිය යෙදේ.

ඒකවචන	**බහුවචන**
අ, මෙහෙකාරුවා **බත** පිසයි.	අන්, **සතුරන්** ජයගනු.
ආ, රාමරජ **රාවණා** මැරී	ආන, **මොණරාන** නරඹන්නෑ.
උ, හෙතෙම **කුමරු** දකී.	උන්, **මිනිසුන්** නොනස.
හු, මම **රජහු** දුටිමි.	න්, **දුදනන්** දුරුකරනු.
ට, වඳුරෝ **ගසට** නැගෙත්.	නට, **රුක්නට** නැගෙත් වඳුරෝ. [දිය්
	වල්, සොරු **ගෙවල්** බි

139. මුත්, විනා, උදෙසා, නිසා, සඳහා, සේ, මෙන්, අරභයා, යනාදි නිපාතයන් සම්බන්ධවූ නාමපද කර්මවිභක්තියෙහි යෙදේ.

මා මුත් සෙසු කෙනෙක් එළර රජු නොමරත්වා.
මාගේ **දියණියන්** නිසා ආ කෙනෙක් වන.
මෘත ශරීර **ඇත්තක්හු** මෙන් නිශ්චලව සිටියේය.
මළ **එකකු** සේ නිශ්චලව සිටියේය.
ප්‍රඥා **පාරමිතාව** අරභයා මේ ජාතකය වදාළසේක.
මා විනා මේ පැනය අනික් කවරෙක් දනිද.

140. අත්‍යන්ත සංයෝගයෙහිද කර්මවිභක්තිය යෙදේ.

ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, යන මොවුන් හා සමග කාලයාගේ හෝ මාර්ගයාගේ හෝ අනවරත යෝගය අත්‍යන්ත සංයෝග නම් වේ.

සත්අවුරුද්දක් ගෙයි කාඹුට අඹුව කලද
සැතැප්මක් ගොස් ගමට පැමිණියේය.

(3) කර්තෘවිභක්තිය.

141. ක්‍රියාව කරන්නා ප්‍රකාශකරන පදයිය කර්තෘවිභක්තිය භජනයකෙරේ.

එකවචන.	බහුවචන.
අ, **දුව** දුන් අවවාද.	අන්, **දරුවන්** කළ කතා.
ආ, **දික්පිටියා** කී බස්.	ආන, **නරාන** කළ දුසිරි.
උ, **නිරිඳු** කළ සුද.	උන්, **සොරුන්** ගත් ධනය.
හු, **රජහු** කළ පණත.	න, **මිපල්නා** ගත් වෙස්.
	න්, **සතුන්** කළ වරද.

142. කර්තෘවිභක්තියෙන් පරව කිසිවිටෙක 'විසින්' යනු යොදත්.

'විසින්' යනු කර්තෘ විභක්තිය ප්‍රකාශකරන සලකුණක්කොට බොහෝසෙයින් ව්‍යවහාර කරත්.

උදාහරණ:—"ශක්‍රදේවේන්ද්‍රයන් විසින් කුස රජ්ජුරුවන්ට දුන් මැණික අටනකින් එක්වූයේය."

143. සහ, හා, සමග, හා සමග, කැටුව, [එක්ව] යනාදි නිපාතයන් හා සම්බන්ධවන පදවීයෙහිද කර්තෘවිභක්තිය යෙදේ.

බිලිඳුන් සහ ලඳුන්ගෙන."

"දිසාපතු වා **පලුග** හා බිම සිණ."

මමත් මෙ **ළඳුන්** සමග යමි.

"එක් මිණිබිරි කෙල්ලක් **මිත්තණියන්** හා සමග නොනැසී රඳගියාය"

"සුයසි කුමාරයෝ **දෙබෑයන්** කැටුව වනයට ගියාහුය."

(4) කරණවිභක්තිය.

144. ක්‍රියාසම්පාදනයෙහි කර්තෘහට ඉතා උප කාර්වූයේ කරණ නම් වේ.

ක්‍රියාව යමක් උපකාරකොටගෙන කරනුලැබේද එය ප්‍රකාශකරන නාමය කරණවිභක්තියෙන් යුක්ත වේ. ඒකවචන බහුවචන රූප ඒකාකාරයි.

උදාහරණ:—

ඉන්, "අමරදේවී **ඉසින්** දරමිටියක් හා **ගිණින්** පලාතිණක් ඇරගෙන වලින් අවුත් ගෙට වන් නාහුය."

එන්, මෙහෙකරුවා **පොරෙවෙන්** ගස කැපීය.

තෙන්, **මෙත්තෙන්** වෙර නසනු.

නි, "**සිත්නි** හැම්දෙය විමසනු."

ඉනි, "**සමවතිනි** නැගිසිට."
එනි, "කුමරු පළවී යොවුන් **ලකුණෙනි.**"
හෙනි, "**තැත්තෙනි** බව පියව්."

145. **ක්‍රියාවක් කොට නිමවූ කාලය ප්‍රකාශ කරනා පදාර්ථයද කරණවිභක්තියෙහි යෙදේ.**

විඩුවා **තුන්මසකින්** ගෙය තැනුවේය යනාදියයි

146. **උපලක්‍ෂණාර්ථයෙහිද කරණවිභක්තිය වේ.**

යම් ලක්‍ෂණයකින් යුක්තද ඒ ලක්‍ෂණය උපලක්‍ෂණ නම් වේ.

උදාහරණ:—ඒ පුරුෂයා **සසසින්** දවසරි. රජ්ජුරු වෝ **පෙරහරින්** ගමන්කළහ.

(5) සම්ප්‍රදානවිභක්තිය.

147. **දානාදියක් ලබන අය ප්‍රකාශ කරන්නා වූද පිණිස යන නිපාතයට නිසිවූද පදාර්ථය සම්ප්‍රදාන විභක්තිය ගනී.**

එකවචන.	**බහුවචන.**
අට, **ලොවට** වැඩවේ.	අන්ට, **දරුවන්ට** කළ අනාදර.
ආට, **යදියාට** දන් දෙනු.	ආනට, **නාගනට** නිගා
උට, **සොරුට** බැටදෙත්.	නොකරව.
හුට, **වෙළඳහුට** බඩු දේ.	උන්ට, **වෙළඳුන්ට** බඩු දේ.
හට, **රජහට** පඬුරුදෙනු.	අනට, **යදියනට** දන් දේ.
ට, **සැළට** පැන් වත්කරනු.	නට, **සත්නට** වැඩ වේවා.
	න්ට, **රුපුන්ට** පිවු නොදෙව.

පිණිස යන නිපාතය නිසි තැනට අට යන ප්‍රත්‍යය යෙදේ.

උදාහරණ:—සුදයට සැරසුණේය. සුදු පිණිය සැරසුණේය යනා අර්ථයි.*

(6) අවධිවිභක්තිය.

148. ක්‍රියාවගේ පැවැත්මට ඉමක් දක්වන පදාර්ථය අවධිවිභක්තියෙන් යුක්තවේ.

එකවචන.

අගෙන්, **මවගෙන්** බත ලැබේ.
ආගෙන්, **බමුණාගෙන්** ලැබුණු උපදෙස්.
උගෙන්, **සොරුගෙන්** බියවේ.
හුගෙන්, **වෙළඳහුගෙන්** ගත් බඩු.
ඉන්, මිනිසා **ගසින්** වැටේ.
එන්, **පොළවෙන්** නැඟුණු දුම්කඳ.
නොන්, **රැක්නොන්** වැටුණු වඳුරෝ.

බහුවචන.

අන්ගෙන්, **සතුරන්ගෙන්** දුක් ලැබේ.
ඉන්ගෙන්, **ගොවින්ගෙන්** ලැබුණු වී සහල්.
උන්ගෙන්, **මහතුන්ගෙන්** වැඩවේ.
න්ගෙන්, **ස්ත්‍රීන්ගෙන්** ලැබුණු විලවුල්.

149. කර්මවිභක්ත්‍යන්තයෙන් පරවූ තෙක්, දක්වා, යනා නිපාතයෝද අවධිවිභක්ති අර්ථය ප්‍රකාශ කෙරෙත්.

තිරිකුණාමලය දක්වා මහවැලිගඟ ගලාබසී, යනාදියයි.

150. නිර්ධාරණාර්ථයෙහි සමුදයවාචීහු කෙරෙන් අවධිවිභක්තිය යෙදේ.

ජාති, ගුණ, ක්‍රියා, සම්බන්ධිවූ ලක්ෂණයන් කාරණකොට සමූහයකින් එකක් වෙන්කිරීම නිර්ධාරණය නම් වේ.

---

* කරනව, කරන්ම, කරන්නව, යනාදියද මෙයින්ම සිද්ධයි.

උදාහරණ:—පක්ෂීන්ගෙන් පැස්බරා ඉතා මහත් ශරීර ඇත්තෙකි.

මනුෂ්‍යයන් කෙරෙන් රජතෙම උත්කෘෂ්ටයි.

151. කරණාර්ථයෙහිද අවධිවිභක්තිය යෙදේ. වනය **ඇතුන්ගෙන්** ගහනවිය, යනාදියෙහි මෙනි.

(7) සම්බන්ධවිභක්තිය.

152. යමක්හට අයිති දෙයක් කිමෙහි ඒ අයිති තැනැත්තා ප්‍රකාශකරන පදවිය සම්බන්ධ විභක්තිය භජනයකෙරේ.

එකවචන.

අගේ, සජීවා **තිසවගේ** හස්තය ඩැහැගත්තේය.
ආගේ, **සජීයාගේ** පෙණය සම්පූර්ණව තිබේ.
උගේ, **රජුගේ** අණ බලවති.
හුගේ, **වෙළඳහුගේ** බඩු හොරු ගතියත්.
අට, කාවන්තිස් රජ **රුහුණට** අධිපතිවිය.
ආට, **දූගියාට** කවුරු මිතුරුද ?
උට, පැතිස් රජ අශෝක **රජුට** මිතුරුවිය.
අ, '**පබවත** වත තාඹරනට නිගාදින්.'
උ, **කුමරු** මුහුණ බැබලිණි.
හු, **රජහු** අණ නොලඟු.

බහුවචන.

අන්ගේ, **මනුෂ්‍යයන්ගේ** නාමය නොනසී.
උන්ගේ, **සොරුන්ගේ** ධනය සපිරනොවේ.
අන්ට, **කුලුණැතියන්ට** සතුරෝ කවුරුද ?
උන්ට, **මහතුන්ට** පක්ෂ ජනයා දියුණුවේ.
උන්, **බුදුන්** මුදුනට නලක් පෙරළී.
අන්, ඕ **සුරඟනන්** මැද බැබලිණි.
න්, **ගගන්** මැද සඳ දිලිසේ.

153. සමානාර්ථයෙහිද සම්බන්ධවිභක්තිය යෙදේ.

බළලා රූපාකාරයෙන් **කොටියාට** සමානයි.

154. අවධි අර්ථයෙහිද සම්බන්ධවිභක්තිය යෙදේ.

උදාහරණ:—

නුගරුකට උතුරෙහි මහත් තුඹසෙක් ඇත්තේය.

හිමාලය **පර්වතයට** දකුණුදෙසෙහි නේපාල රට පිහිටා තිබේ.

(8) ආධාරවිභක්තිය.

155. කර්තෘහට හෝ කර්මයට හෝ භාරවූ ක්‍රියාව ධරනා පදාර්ථය ආධාරවිභක්තිය භජනයකෙරේ.

ක්‍රියාවගේ පැවැත්මට යම් දෙයක් ආධාරවේද හෙවත් ක්‍රියාවක් යම් ආධාරයෙක්හි පවතීද ඒ ආධාරත්වය ප්‍රකාශකරන නාමය ආධාරවිභක්තියෙන් යෙදේ. "ගවයා වත්තේ ඇවිදී" යන මෙහි ගවයාගේ ක්‍රියාවට හෙවත් ඇවිදීමට ප්‍රතිෂ්ඨාස්ථානය හෙවත් ආධාරය වත්ත බැවින් 'වත්තේ' කියා ආධාරවිභක්තීන් යුක්තවේ.

උදාහරණ:—

ඒකවචන.	**බහුවචන.**
එහි, **අහසෙහි** තරු පෙනෙත්.	අන්හි, පක්ෂීහු නොයෙක් **දිශාවන්හි** පියාසර කෙරෙත්.
ඒ; **එපුරේ** රජෙක් වී.	
හ, **සිත්හි** භය උපදී.	වලැ, ගස්වලැ වඳුරෝ හැසිරෙත්.
ඇ, මම **නුවරැ** උපන්මි.	

156. සම්පාපී කාර ශබ්දයා කෙරෙන්ද ආධාර විභක්තිය වේ.

"දුර්ජනයන් **කෙරෙහි** කවර විශ්වාසයෙක්ද ?" යනාදියෙහි මෙනි.

157. ක්‍රියාව පවත්නේ යම් කාලයක් ඇතුළතද ඒ කාලය ප්‍රකාශකරන පදාර්ථයද ආධාර විභක්තියෙන් යෙදේ.

උදාහරණ:—"ගොන් යකාල **රාත්‍රියෙහි** අවුන් පළමු දවස් ලැයි තැනටම පැමියණියාහුය." යනාදි යයි.

ආධාරවිභක්තිය භාගවන පිණිස කිසිතැනෙක 'දී' යන ප්‍රත්‍යය පදයෙන් අගට යොදනුලැබේ.

උදාහරණ:—"මම මහනුවරදී ඔහු දුටිමි." යනාදියයි.

(9) ආලපනවිභක්තිය.

158. ආමන්ත්‍රණය කරනු ලබන්නා හඟවන පදාර්ථය ආලපනවිභක්තිය භජනයකෙරේ.

උදාහරණ:—

ඒකවචන.	**බහුවචන.**
අ, **සොඳුර** මා බස් අසා	ඉනි, **කිවිනි** සත පලක රව්.
ආ, **මිනිසා** දුසිරි නොකරව.	එනි, **දරුවෙනි** පව්නොකරව්.
ඇ, **දරුවෑ** සිප් උගනුව.	තෙනි, **සත්තෙනි** පින් කරව්.
ඒ, **බිලිඳේ** නැටුම් දක්වනු.	ඊ, **සිත්නි** අවැඩක් නොසිතව්.

37. නාම වරනැඟිල්ල.

159. නාමයක් විභක්තිප්‍රත්‍යයන් හා සමග ගළපා පිළිවෙළින් දැක්වීම වරනැඟීම වේ.

නාමශබ්දයෝ ස්වරාන්තය හලන්තයැයි දෙවැදෑරුම් වෙත්. ප්‍රාණස්වරයක් අන්තකොට ඇති ශබ්ද ස්වරාන්ත නම් වේ. ව්‍යඤ්ජනයක් අන්තකොට ඇති ශබ්ද හලන්ත නම් වේ.

(1) සචේතන ස්වරාන්තශබ්ද.

(1) මොනර ශබ්දය. (අකාරාන්ත පුංලිඞ්ග.)

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	මොනරා	මොනරු
කර්ම.	මොනරා	මොනරුන්
කර්තෘ.	මොනරා	මොනරුන්
සම්ප්‍රදාන.	මොනරාට	මොනරුන්ට
අවධි.	මොනරාගෙන්	මොනරුන්ගෙන්
සම්බන්ධ.	මොනරාගේ	මොනරුන්ගේ
ආධාර.	මොනරාකෙරෙහි	මොනරුන්කෙරෙහි
ආලපන.	මොනරා	මොනරුනි

මොනර ආදි ශබ්ද පූර්වස්වරලෝපසන්ධිවිධියෙන් වරනැඟෙනු ලැබේ.

ප්‍රාණවාචක ශබ්දයන්ගේ ආධාරවිභක්තිය ස්වභාවයෙන් අප්‍රකටයි. එය උච්චමානාහන්හි සම්බන්ධවිභක්තිය කොට එයින් පරව 'කෙරෙහි' යනු යොදා ආධාරාර්ථය හඟවත්. කෙරෙහි යනු සම්පාතීයෙහිවූ කරයන ශබ්දය හා ආධාරවිභක්තිවූ එහි ප්‍රත්‍යය යෙදීමෙන් සිධවන්නේය.

ප්‍රාණවාචක ශබ්දයන්හි කරණවිභක්තියද නොයෙදේ. එය හැඟවුවමනා කල්හි "කරණකොට,' යනු විභක්තිරූපයක් වශයෙන් යොදත්. මොනරා කරණකොට යනාදිවශයෙනි.

(2) ගව ශබ්දය. (අකාරාන්ත පුංලිඞ්ග.)

	එකවචන.	බහුවචන.
ප්‍රථම.	ගවයා	ගවයෝ
කර්ම.	ගවයා	ගවයන්
කර්තෘ.	ගවයා	ගවයන්
සම්ප්‍රදාන.	ගවයාට	ගවයන්ට
අවධි.	ගවයාගෙන්	ගවයන්ගෙන්
සම්බන්ධ.	ගවයාගේ	ගවයන්ගේ
ආධාර.	ගවයාකෙරෙහි	ගවයන්කෙරෙහි
ආලපන.	ගවයා, ගවය	ගවයෙනි

(3) එළු ශබ්දය. (උකාරාන්ත පුංලිඞ්ග.)

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	එළුවා	එළුවෝ
කර්ම.	එළුවා	එළුවන්
කර්තෘ.	එළුවා	එළුවන්
සම්ප්‍රදාන.	එළුවාට	එළුවන්ට
අවධි.	එළුවාගෙන්	එළුවන්ගෙන්
සම්බන්ධ.	එළුවාගේ	එළුවන්ගේ
ආධාර.	එළුවාකෙරෙහි	එළුවන්කෙරෙහි
ආලපන.	එළුවා, එළුව	එළුවෙනි

(4) ගිරා ශබ්දය. (ආකාරාන්ත පුංලිඞ්ග.)

	එකවචන.	බහුවචන.
ප්‍රථම.	ගිරවා	ගිරවු
කර්ම.	ගිරවා	ගිරවුන්
කර්තෘ.	ගිරවා	ගිරවුන්
සම්ප්‍රදාන.	ගිරවාට	ගිරවුන්ට
අවධි.	ගිරවාගෙන්	ගිරවුන්ගෙන්
සම්බන්ධ.	ගිරවාගේ	ගිරවුන්ගේ
ආධාර.	ගිරවාකෙරෙහි	ගිරවුන්කෙරෙන්.
ආලපන.	ගිරවා, ගිරව	ගිරවුනි

ගව එළු ගිරා ආදි ශබ්ද යකාර වකාර ආගමවිධියෙන් ගළපා වරනැගත්.

(5) කවුස්සු ශබ්දය. (උකාරාන්ත පුංලිඞ්ග.)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	කවුස්සා	කවුස්සෝ
කර්ම.	කවුස්සා	කවුස්සන්
කර්තෘ.	කවුස්සා	කවුස්සන්
සම්ප්‍රදාන.	කවුස්සාට	කවුස්සන්ට
අවධි.	කවුස්සාගෙන්	කවුස්සන්ගෙන්
සම්බන්ධ.	කවුස්සාගේ	කවුස්සන්ගේ
ආධාර.	කවුස්සාකෙරෙහි	කවුස්සන්කෙරෙහි
ආලපන.	කවුස්සා	කවුස්සෙනි

කවුස්සු ආදි ශබ්ද විරූපසන්ධිවිධියෙන් ගළපා වරනඟත්.

(6) ලිය ශබ්දය. (අකාරාන්ත ස්ත්‍රීලිඞ්ග.)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	ලිය	ලියෝ
කර්ම.	ලිය	ලියන්
කර්තෘ.	ලිය	ලියන්
සම්ප්‍රදාන.	ලියට	ලියන්ට
අවධි.	ලියගෙන්	ලියන්ගෙන්
සම්බන්ධ.	ලියගේ	ලියන්ගේ
ආධාර.	ලියකෙරෙහි	ලියන්කෙරෙහි
ආලපන.	ලිය, ලියේ	ලියනි, ලියෙනි

(6) නෑදි ශබ්දය. (ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ග)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	නැන්ද	නැන්දලා
කර්ම.	නැන්ද	නැන්දලා
කර්තෘ.	නැන්ද	නැන්දලා
සම්ප්‍රදාන.	නැන්දට	නැන්දලාට
අවධි.	නැන්දගෙන්	නැන්දලාගෙන්
සම්බන්ධ.	නැන්දගේ	නැන්දලාගේ
ආධාර.	නැන්දකෙරෙහි	නැන්දලාකෙරෙහි
ආලපන.	නැන්ද, නැන්දේ	නැන්දලා

නෑදිශබ්දය බහුවචනයේදී ලාකාර යුක්තව වරනැගේ.

(8) බැමිණි ශබ්දය. (ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ග.)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	බැමිණි	බැමිණියෝ
කර්ම.	බැමිණිය	බැමිණියන්
කර්තෘ.	බැමිණි, බැමිණිය	බැමිණියන්
සම්ප්‍රදාන.	බැමිණියට	බැමිණියන්ට
අවධි.	බැමිණියගෙන්	බැමිණියන්ගෙන්
සම්බන්ධ.	බැමිණියගේ	බැමිණියන්ගේ
ආධාර.	බැමිණියකෙරෙහි	බැමිණියන්කෙරෙහි
ආලපන.	බැමිණිය	බැමිණියෙනි

(9) අඹු ශබ්දය. (උකාරාන්ත ස්ත්‍රීලිඞ්ග.)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	අඹු, අඹුව	අඹුවෝ
කර්ම.	අඹු, අඹුව	අඹුවන්, අඹුන්
කර්තෘ.	අඹු, අඹුව	අඹුවන්, අඹුන්
සම්ප්‍රදාන.	අඹුට, අඹුවට	අඹුවන්ට, අඹුන්ට
අවධි.	අඹුගෙන්, අඹුවගෙන්	අඹුවන්ගෙන්, අඹුන්ගෙන්
සම්බන්ධ.	අඹුගේ, අඹුවගේ	අඹුවන්ගේ, අඹුන්ගේ
ආධාර.	අඹුවකෙරෙහි	අඹුවන්කෙරෙහි, අඹුන්කෙරෙහි
ආලපන.	අඹු, අඹුව	අඹුවෙනි, අඹුනි

(10) දූ ශබ්දය. (ඌකාරාන්ත ස්ත්‍රීලිඞ්ග.)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	දූ	දූහු, දූවරු
කර්ම.	දූ, දූව	දූන්, දූවරුන්
කර්තෘ.	දූ, දූව	දූන්, දූවරුන්
සම්ප්‍රදාන.	දූවට	දූන්ට, දූවරුන්ට
අවධි.	දූවගෙන්	දූන්ගෙන්, දූවරුන්ගෙන්
සම්බන්ධ.	දූවගේ	දූන්ගේ, දූවරුන්ගේ
ආධාර.	දූවකෙරෙහි	දූන්කෙරෙහි, දූවරුන්කෙරෙහි
ආලපන.	දූව, දූවේ	දූනි, දූවරුනි

2. සචෙතන හලන්ත ශබ්ද.

(11) මිනිස් ශබ්දය. (හලන්ත පුංලිංග.)

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	මිනිසා	මිනිස්සු, මිනිස්සූ
කර්ම.	මිනිසා	මිනිසුන්
කර්තෘ.	මිනිසා	මිනිසුන්
සම්ප්‍රදාන.	මිනිසාට	මිනිසුන්ට
අවධි.	මිනිසාගෙන්	මිනිසුන්ගෙන්
ආධාර.	මිනිසාකෙරෙහි	මිනිසුන්කෙරෙහි
ආලපන.	මිනිසා, මිනිසෝ	මිනිසුනි

මිනිස් ආදි ප්‍රාණවාචක හලන්ත ශබ්ද සවර සන්ධි විධියෙන් වරනැඟේ.

(12) දෙන් ශබ්දය. (හලන්ත ස්ත්‍රීලිංග.)

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	දෙන්, දෙන	දෙන්නු, දෙන්නූ
කර්ම.	දෙන්, දෙන	දෙනුන්
කර්තෘ.	දෙන්, දෙන	දෙනුන්
සම්ප්‍රදාන.	දෙනට	දෙනුන්ට
අවධි.	දෙනාගෙන්	දෙනුන්ගෙන්
සම්බන්ධ.	දෙනාගේ	දෙනුන්ගේ
ආධාර.	දෙනාකෙරෙහි	දෙනුන්කෙරෙහි
ආලපන.	දෙන	දෙනුනි

3. ආණ ආදි ප්‍රත්‍යයවත් ශබ්ද.

(13) ආණ ප්‍රත්‍යයවත් සිටු ශබ්දය. (පුංලිංග බහුවචනාන්තයයි.)

සිටු+ආණ=සිටාණ+ඕ=සිටාණෝ.

ප්‍රථමා.	සිටාණෝ
කර්ම.	සිටාණන්
කර්තෘ.	සිටාණන්
සම්ප්‍රදාන.	සිටාණන්ට
අවධි.	සිටාණන්ගෙන්
සම්බන්ධ.	සිටාණන්ගේ
ආධාර.	සිටාණන්කෙරෙහි
ආලපන.	සිටාණෙනි, සිටාණනි

(14) අණු ප්‍රත්‍යයවත් පුත්ශබ්දය. (පුංලිඞ්ග බහුවචනාන්තයි.)

පුත්+අණු=පුතණු+ව+ඕ=පුතණුවෝ.

ප්‍රථමා.	පුතණුවෝ
කර්ම.	පුතණුවන්
කර්තෘ.	පුතණුවන්
සම්ප්‍රදාන.	පුතණුවන්ට
අවධි.	පුතණුවන්ගෙන්
සම්බන්ධ.	පුතණුවන්ගේ
ආධාර.	පුතණුවන්කෙරෙහි
ආලපන.	පුතණුවනි

(15) අණි ප්‍රත්‍යයවත් දූශබ්දය. (ස්ත්‍රීලිඞ්ග බහුවචනාන්තයි.)

දූ+අණි=දුවණි, දියණි+ඕ=දුවණියෝ, දියණියෝ.

ප්‍රථමා.	දුවණියෝ, දියණියෝ
කර්ම.	දුවණියන්, දියණියන්
කර්තෘ.	දුවණියන්, දිවණියන්
සම්ප්‍රදාන.	දුවණියන්ට, දියණියන්ට
අවධි.	දුවණියන්ගෙන්, දියණියන්ගෙන්
සම්බන්ධ.	දුවණියන්ගේ, දියණියන්ගේ [හි
ආධාර.	දුවණියන්කෙරෙහි, දියණියන්කෙරෙ
ආලපන.	දුවණියනි, දියණියනි

(4) වර ශබ්දාන්ත ශබ්ද.

(16) වරශබ්දාන්ත පඬි ශබ්දය. (අකාරාන්ත පුංලිඞ්ග.)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	පඬිවරයා	පඬිවරයෝ
කර්ම.	පඬිවරයා	පඬිවරයන්
කර්තෘ.	පඬිවරයා	පඬිවරයන්
සම්ප්‍රදාන.	පඬිවරයාට	පඬිවරයන්ට
අවධි.	පඬිවරයාගෙන්	පඬිවරයන්ගෙන්
සම්බන්ධ.	පඬිවරයාගේ	පඬිවරයන්ගේ
ආධාර.	පඬිවරයාකෙරෙහි	පඬිවරයන්කෙරෙහි
ආලපන.	පඬිවරය	පඬිවරයෙනි

(4) අජීක්‍රියාශබ්ද.

(17) මවන්නා. (පුංලිඞ්ගික.)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	මවන්නා	මවන්නෝ
කර්‍ම.	මවන්නා	මවනනන්
කතෘ.	මවන්නා	මවන්නන්
සම්ප්‍රදාන.	මවන්නාට	මවන්නන්ට
අවධි.	මවන්නාගෙන්	මවන්නන්ගෙන්
සම්බන්ධ.	මවන්නාගේ	මවන්නන්ගේ
ආධාර.	මවන්නාකෙරෙහි	මවන්නන්කෙරෙහි
ආලපන.	මවන්නා	මවන්නෙනි

(18) මවන්නී. (ස්ත්‍රීලිඞ්ගික.)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	මවන්නී	මවන්නියෝ
කර්‍ම.	මවන්නිය	මවන්නියන්
කතෘ.	මවන්නිය	මවන්නියන්
සම්ප්‍රදාන.	මවන්නියට	මවන්නියන්ට
සම්බන්ධ.	මවන්නියගේ	මවන්නියන්ගේ
අවධි.	මවන්නියගෙන්	මවන්නියන්ගෙන්
ආධාර.	මවන්නියකෙරෙහි	මවන්නියන්කෙරෙහි
ආලපන.	මවන්නිය	මවන්නියෙනි

(5) අචේතනා සාධාරණ ශබ්ද.

(19) පාර ශබ්දය. (අකාරාන්තයි.)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	පාර	පාරවල්
කර්‍ම.	පාර	පාරවල්
කරණ.	පාරින්, පාරෙන්	පාරවලින්
සම්ප්‍රදාන.	පාරට	පාරවලට
අවධි.	පාරින් පාරෙන්	පාරවලින්
ආධාර.	පාරේ, පාරෙහි	පාරවල, පාරවලැ

අප්‍රාණිවාචක ශබ්දවල කර්තෘ, සම්බන්ධ, ආලපන, යන විභක්තීහු අප්‍රකටයෝය. ඉඳුමුත් සචෙතන ශබ්දකොට සලකා කියනකල ඒ විභක්තීහුද යෙදෙත්. වෘක්ෂයාගේ යනාද් යෙක් මෙනි.

(20) මඟ (මං) ශබ්දය. (අකාරාන්තයහෝ අනුස්වාරාන්තයයි

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	මඟ	මං
කර්ම.	මඟ	මං
කරණ.	මඟින්	මංවලින්
සම්ප්‍රදාන.	මඟට	මංවලට
අවධි.	මඟින්	මංවලින්
ආධාර.	මඟ	මංවල, මංවලැ

(21) මාලිගා ශබ්දය. (ආකාරාන්තයි)

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	මාලිගා	මාලිගාවල්
කර්ම.	මාලිගා	මාලිගාවල්
කරණ.	මාලිගාවෙන්	මාලිගාවලින්
සම්ප්‍රදාන.	මාලිගාවට	මාලිගාවලට
අවධි.	මාලිගාවෙන්	මාලිගාවලින්
ආධාර.	මාලිගාවේ මාලිගාවෙහි	මාලිගාවල

(22) පෙති ශබ්දය. (ඉකාරාන්තයි)

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	පෙත්ත	පෙති
කර්ම.	පෙත්ත	පෙති
කරණ.	පෙත්තෙන්	පෙතිවලින්
සම්ප්‍රදාන.	පෙත්තට	පෙතිවලට
අවධි.	පෙත්තෙන්	පෙතිවලින්
ආධාර.	පෙත්තේ, පෙත්තෙහි	පෙතිවල

(23) කඩු ශබ්දය. (උකාරාන්තයි)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	කඩුව	කඩු
කර්ම.	කඩුව	කඩු
කරණ.	කඩුවෙන්	කඩුවලින්
සම්ප්‍ර:	කඩුවට	කඩුවලට
අවධි.	කඩුවෙන්	කඩුවලින්
ආධාර.	කඩුවේ, කඩුවෙහි	කඩුවල

(24) ගෙ ශබ්දය. (එකාරාන්තයි)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	ගෙ, ගෙය	ගෙවල්
කර්ම.	ගෙ, ගෙය	ගෙවල්
කරණ.	ගෙයින්, ගෙන්	ගෙවලින්
සම්ප්‍රද.	ගෙට	ගෙවලට
අවධි.	ගෙයින්, ගෙන්	ගෙවලින්
ආධාර.	ගෙයි, ගෙහි	ගෙවල

(6) අචේතන හලන්ත ශබ්ද.

(25) ගස් ශබ්දය. (සකාරාන්තයි)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	ගස	ගස්
කර්ම.	ගස	ගස්
කරණ.	ගසින්	ගස්වලින්
සම්ප්‍රදාන.	ගසට	ගස්වලට
අවධි.	ගසින්	ගස්වලින්
ආධාර.	ගසේ, ගසෙහි	ගස්වල

බොහෝ අචේතන ශබ්දවල බහුවචනයේ වල් ප්‍රත්‍යය ප්‍රථමා කර්ම යන විභක්තිවල අප්‍රකටව තිබේ. නමුත් කරණාදි විභක්තිවල ව්‍යවහාරවන්නේය.

(26) ලින් ශබ්දය. (නාකාරාන්තයි)

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	ලිඳ	ලින්
කර්ම.	ලිඳ	ලිං
කරණ.	ලිඳෙන්	ලින්වලින්
සම්ප්‍රදාන.	ලිඳට	ලින්වලට
අවධි.	ලිඳෙන්	ලින්වලින්
ආධාර.	ලිඳේ, ලිඳෙහි	ලින්වල

38. සර්වනාම.

(27) ම ශබ්දය. (පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග දෙක්හි)

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	මම; මම්	අපි, ඇප්
කර්ම.	මා	අප
කර්තෘ.	මා	අප
සම්ප්‍රදාන.	මට	අපට
අවධි.	මගෙන්, මාගෙන්	අපෙන්, අපගෙන්
සම්බන්ධ.	මගේ, මාගේ	අපේ, අපගේ
ආධාර.	මාකෙරෙහි	අපකෙරෙහි

(28) ත ශබ්දය. (පුංලිඞ්ග)

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	තෝ	තෙපි, තෙප්
කර්ම.	තා	තොප
කර්තෘ.	තා	තොප
සම්ප්‍රදාන.	තට	තොපට
අවධි.	තගෙන්, තාගෙන්	තොපෙන්, තොප[ගෙන්
සම්බන්ධ.	තගේ, තාගේ	තොපේ, තොපගේ
ආධාර.	තාකෙරෙහි	තොපකෙරෙහි

(29) තී ශබ්දය. (ස්ත්‍රීලිඞ්ග)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	තී	තොපි
කර්ම.	තී	තොප
කර්තෘ.	තී	තොප
සම්ප්‍රදාන.	තිට	තොපට [පෙන්
අවධි.	තීයෙන්	තොපගෙන්, තො
සම්බන්ධ	තීගේ	තොපගේ, තොපේ
ආධාර	තී කෙරෙහි	තොප කෙරෙහි

(30) උඹ ශබ්දය. (පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	උඹ	උඹලා
කර්ම.	උඹ	උඹලා
කර්තෘ.	උඹ	උඹලා
සම්ප්‍රදාන.	උඹට	උඹලාට
අවධි.	උඹෙන්,	උඹලාගෙන්
සම්බන්ධ.	උඹේ	උඹලාගේ
ආධාර.	උඹ කෙරෙහි	උඹලා කෙරෙහි

(31) ඒ ශබ්දය. (පුංලිඞ්ග)

	ඒකවචන.	බහුවචන.
ප්‍රථමා.	ඒ, හේ [තොම එතොම, හෙ	ඔව්හු, ඔහු, එව්හු, ඌලා [ඌලා
කර්ම.	ඔහු, උහු, ඌ	ඔවුන්, උන්, එවුන්,
කර්තෘ.	ඔහු, උහු, ඌ	ඔවුන්, උන්, එවුන්,
සම්ප්‍රදාන.	ඔහුට,උහුට,ඌට	ඔවුන්ට, උන්ට, එවුන්ට, ඌලාට

අවධි.	ඔහුගෙන්, උහු ගෙන්, උගෙන්, ඌගෙන්	ඔවුන්ගෙන්, උන් ගෙන් / එවුන්ගෙන්, ඌලා ගෙන්
සම්බන්ධ.	ඔහුගේ, උහුගේ, උගේ, ඌගේ	ඔවුන්ගේ, උන්ගේ, එවුන්ගේ, ඌලාගේ
ආධාර	ඔහුකෙරෙහි / උහුකෙරෙහි / ඌකෙරෙහි	ඔවුන්කෙරෙහි / උන්කෙරෙහි / එවුන්කෙරෙහි / ඌලාකෙරෙහි

(32) ඕ ශබ්දය. (ස්ත්‍රීලිඞ්ගික)

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	ඇ, ඕතොමෝ	ඔහු, ඔව්හු
කර්ම.	ඇ, ඇය	ඔවුන්
කතෘ.	ඇ, ඇය	ඔවුන්
සම්ප්‍රදාන.	ඇට, ඇයට	ඔවුන්ට
අවධි.	ඇගෙන්, ඇගෙන්, ඇයගෙන්	ඔවුන්ගෙන්
සම්බන්ධ.	ඇගේ, ඇගේ, ඇයගේ	ඔවුන්ගේ
ආධාර.	ඇකෙරෙහි	ඔවුන්කෙරෙහි

(33) එ ශබ්දය. (අචේතන)

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	එය, ඒක	ඒවා
කර්ම.	එය, ඒක	ඒවා
කරණ.	එයින්, ඉන්	ඒවායින්
සම්ප්‍රදාන.	එයට, ඊට	ඒවාට
අවධි.	එයින්, එන්	ඒවායින්
සම්බන්ධ.	එහි	ඒවායේ
ආධාර.	එහි	ඒවායේ

(34) මෙ ශබ්දය. (පුංලිඞ්ග)

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	මෙතෙම මේතෙම	මොහු, මොව්හු මෙව්හු, මූලා

ස්ත්‍රී ලිඞ්ග.

	එකවචන.	බහුවචන
ප්‍රථමා.	මෑ, මෝතොමෝ	මොහු, මොව්හු

අචේතන.

	එකවචන.	බහුවචන.
ප්‍රථමා.	මෙය, මේකා	මේවා

මෙහි සෙසු විභක්තිවලදී ඒ ශබ්දය මෙනි.

39. සමාසපද.

160. වෙන් වෙන්වූ ශබ්ද දෙකක් හෝ වැඩි ගණනක් එක ශබ්දයක්සේ ගැළපීමෙන් සෑදෙන පද සමාසපද නම් වේ.

සමාසයෝ අව්‍යය සමාසය, විභක්ති සමාසය, විශෙෂණ සමාසය, අන්‍යාර්ථ සමාසය, ද්වන්ද්වාර්ථ සමාසයයි පඤ්චවිධවෙත්.

(1) අව්‍යය සමාස.

161. අව්‍යය ශබ්දයකින් පරව අන්‍ය ශබ්දයක් ගැළපී සෑදෙන සමාසය අව්‍යය සමාස නම්.

නාම ක්‍රියා ශබ්දයන්මෙන් රූපය වෙනස් නොව නිතරම ප්‍රකෘතියෙන් සිටින ශබ්ද අව්‍යය ශබ්ද නම් වේ. උපසර්ග නිපාත යන දෙවර්ගයම අව්‍යය නම්.

උදාහරණ:—

යත+ලබ=යතලබ, (ලැබිම යම්සේද එසේ)
යත+විදි=යතාවිදි, (විදිය යම්සේද එසේ)
අනු+බල=අනුබල, (බලයට පසු)
දු+දන=දුදන, (නින්දලද්දාවූ ජන)
කු+පුරිස්=කුපුරිස්, (ගැරහුම්ලද්දාවූ පුරුෂ)
උප+වන=උපවන, (සමීපයෙහි වනය)
අ+සුර=අසුර, (සුර නොවන්නෝ)
අ+කුසල්=අකුසල්, (කුසල් නොවන්නෝ)

අව්‍යයන් හා බැඳෙන පදයේ මුලකුර ස්වරයක් වී නම් ඔහු වෙත නකාරාදෙශ වේ. අ+අදර=අන දර යනාදියයි.

(2) විභක්තිසමාස.

162. විභක්ත්‍යර්ථපදයක් පරපදයක් හා ගැළපී මෙන් සෑදෙන සමාසය විභක්ති සමාස නම් වේ.

ශුද්ධ සිංහල.

මීපල්, මිය පල්ලෙන් මෙවත් ප්‍රිවිය පාලනය කරන්නෝ [රජ]. (කර්මවිභක්තිසමාසයි)
පරපුටු, පරවිසින් පුටුයේ මෙවත් අන්‍යයාවිසින් පොෂණය කරනලද්දේ. (කෝකිලහෝ යාවකා), (කර්තෘවිභක්ති)
කිරිබත්, කිරෙන් පිසූ බත්. (කරණවිභක්ති)
බමුණුදන්, බමුණන්ට දියයුතු දන්. (සම්ප්‍රදාන විභක්ති)
සොරබිය, සොරුගෙන් බිය. (අවධිවිභක්ති)
රජපිරිස්, රජුගේ පිරිස්. (සම්බන්ධවිභක්ති)
තැඹිලිතෙල්, තැඹිලියේ තෙල්. (ආධාරවිභක්ති)

සංස්කෘත.

ගොපාල, ගවයන් පාලනයකරන්නේ. (කර්ම විභක්ති)
බ්‍රහ්මදත්ත, බ්‍රහ්මයාවිසින් දෙනලද්දේ. (කර්තෘ විභක්ති)
කච්ඡප, කච්ඡයෙන් පානයකරන්නේ. (කරණ)
ලොකාර්ථ, ලොකයාහට අර්ථය. (සම්ප්‍රදාන)
රාජභය, රජුන්ගෙන්වන භය. (අවධි)
රාජපුත්‍ර, රජුගේ පුත්. (සම්බන්ධ)
නාගරවාසි, නාගරයෙහි වැසි. (ආධාර)

(3) විශෙෂණ සමාස.

163. විශෙෂණ විශෙෂ්‍ය පද ගැළපීමෙන් සෑදෙන සමාස විශෙෂණ සමාස නම් වේ.

ශුද්ධ සිංහල.

නිලඹර—නිල්වූයේද එම අඹරවූයේද නිලඹර.
නරසි—නරවූයේද එම සිහවූයේද නරසී.
මාතොට (මහතොට)—මහවූයේද එම තොටවූයේද මාතොට.
ලියකොමල—ලිය මෙන් කොමල ලියකොමල.
පන්සිල්—සිල් පසක් එක්කොට සලකනලදහු පන්සිල්.

සංස්කෘත.

නිලොත්පල—නිල්වූයේත් එම උත්පලවූයේත් නිලොත්පල.
නරෙන්ද්‍ර—නරවූයේත් එම ඉන්ද්‍රවූයේත් නරෙන්ද්‍ර.
ලඞ්කාද්වීප—ලඞ්කාවූයේත් එම ද්වීපවූයේත් ලඞ්කාද්වීප.

ශ්වේතච්ඡත්‍ර—ශ්වේතවූයේත් එම ඡත්‍රවූයේත් ශ්වේතච්ඡත්‍ර.

පඤ්චේන්ද්‍රිය—ඉන්ද්‍රිය පසක් එක්කොට සලකනලදනු පඤ්චේන්ද්‍රිය.

(4) අන්‍යාර්ථ සමාස.

164. සමාසවූ පදයන්ගේ අර්ථයෙන් පිටත්වූ අර්ථයක් ප්‍රකාශකරන සමාසය අන්‍යාර්ථ සමාස නම් වේ.

ශුද්ධ සිංහල.

දැම්දුරු—දමනලද ඉඳුරෝ යමක්හුවිසින්ද එතෙම දැම්දුරු නම්, මුනි.

තිනෙත්—නෙත් තුනක් ඇත්තේ යමෙකුටද හෙතෙම තිනෙත්, ඊශ්වර.

මත්නේගජ—මත්වූ නොයෙක් ගජන් ඇත්තේ යම්තැනෙකහිද එතැන මත්නේගජ, වනය.

සොහොයුරු—සමානවූ උදරය ඇත්තේ යමක්හටද එතෙම සොහොයුරු.

බරනෙත්—නෙත් දෙලසක් ඇත්තේ යමක් හටද හෙතෙම බරනෙත්, ස්කන්ධකුමාරයා.

සියපත්—පත් (පත්‍ර) සියයක් ඇත්තේ යමක්හටද එතෙම සියපත්, නෙළුම්.

සංස්කෘත.

සහස්‍රරශ්මි—සහස්‍රයක් රශ්මිහු යමක්හටද හෙතෙම සහස්‍රරශ්මි, සූර්යයා.

සහස්‍රාක්ෂ—අක්ෂි සහස්‍රයක් ඇත්තේ යමෙකුටද හෙතෙම සහස්‍රාක්ෂ, ශක්‍රයා.

ශතපත්‍ර—පත්‍ර ශතයක් ඇත්තේ යමක්හටද හෙ තෙම ශතපත්‍ර, නෙළුම්.

ෂට්පද—පද ෂට්කයක් ඇත්තේ යමක්හටද හෙ තෙම ෂට්පද, භෘඞ්ග.

165. අන්‍යාර්ථ සමාසය වනාහි තද්ගුණය අතද්ගුණයයි විභේදවේ.

යම් සමාසපදයකින් ප්‍රකාශවන අර්ථය අන්‍යපදයාගේ ගුණයක් වේද ඒ සමාසය තද්ගුණ නම් වේ. 'ලම්බසවන්' ආදීයෙහි මෙනි.

යම් සමාසපදයකින් ප්‍රකාශවන අර්ථය අන්‍යපදයාගේ ගුණයක් නොවේ නම් ඒ අතද්ගුණ නම් වේ.

(9) දකාරාර්ථ සමාස.

166. දකාරානුසාරයෙන් සම්බන්ධ කළයුතු ශබ්ද දකාරය නැතිව ගළපනුලැබේද ඒ දකාරාර්ථසමාස නම් වේ.

(1) ශුද්ධ සිංහල.

අහසපොළොව—අහසද පොළොවද.
හිරසඳ—හිරද සඳද.
බඹසුරනරෝ—බඹද සුරද නරද.
දෙව්මිනිස්—දෙව්ද මිනිස්ද.

(2) සංස්කෘත.

හස්තපාද—හස්තද පාදද.
සුඛදුඃඛ—සුඛද දුඃඛද.

මෙහි සමූහය ප්‍රමුඛවූ තැන්හි ඒකවචන වේ.—ගිනෑවුම් යනාදිය මෙනි.

අවයව ප්‍රමුඛවූ තැන්හි බහුවචන වේ.—'බඹසුරනරෝ' යනාදීයෙහි මෙනි.

40. ප්‍රත්‍යයාපී නාම.

167. ප්‍රත්‍යයවත්වූ නාම ප්‍රත්‍යයාපීනාම නම් වේ.

නාමයන්ගෙන් පරව ප්‍රත්‍යය යෙදී හැදෙන අන්‍ය නාමද ධාතූන්ගෙන් පරව ප්‍රත්‍යය යෙදී හැදෙන නාමද ප්‍රත්‍යයාපීනාම නම් වේ.

මෙහි නාමයන්ගෙන් හැදෙන අන්‍ය නාමයන්ට තද්ධිතයයි කියාද ධාතූන්ගෙන් හැදෙන නාමයන් ට කිතක [කෘදන්ත]යයි කියාද කියනු ලැබේ. තද්ධිත, කිතක, යනු නාමපදයන්ගේම කොටසකි.

"මග" යන නාමයා කෙරෙන් පරව ඊප්‍රත්‍යය කළ කල්හි "මගි" කියාද, මාත්‍රාවෘද්ධිකළ කල්හි "මැගි" කියාද වේ. මගි හෝ මැගි යනු මග යන තැනැත්තේ යන අපී ඇති තද්ධිත ශබ්දයකි.

"බුජ්" යන ධාතුවෙන් පරව උන් ප්‍රත්‍යයද පිළි පෙරළිද කළ කල්හි "බොජුන්" කියා වේ. බොජුන් යනු බුදිය යුතු දෙය යන අපී ඇති කිතක ශබ්දයකි.

(1) තද්ධිත.

කිරි (ඇත්), කර ඇතියේ කිරි, කර ශබ්දයෙන්.
ගැමි, ගමෙහිවූ තැනැත්තේ ගැමි, ගම් ශබ්දයෙන්.
තොටි, තොටෙහි නියුක්ත තැනැත්තේ තොටි, තොට ශබ්දයෙන්.
නැකති, නකත් දත් තැනැත්තේ නැකති, නකත් ශබ්දයෙන්,
නැවි, නැව් දුවවන තැනැත්තේ නැවි, නැව් ශබ්දයෙන්,
සුද්දී, සුදුවණී ඇති තැනැත්ති සුද්දී, සුදු ශබ්දයෙන්.

නියවත්, සිරිමත් ආදි වත්, මත්, යන ප්‍රත්‍යයන් ගැළපීමෙන් සිඩවන්නාවූ ශබ්දද තද්ධිත සංඥාවට ගැණේ.

වත්, මත්, යන ප්‍රත්‍යයන්ගෙන් ඇති යන අර්ථයක් ප්‍රකාශ වේ. වත් යන්නු අකාරාන්ත ශබ්දයන් කෙරෙන් පරවද මත් යන්නු ඉකාරාන්ත උකාරාන්ත ශබ්දයන්කෙරෙන් පරවද යෙදේත්.

(2) කිතක.

කරණී, (කටයුතු දෙය). කර (කිරීමෙහි) යන ධාතුවු කෙරෙන් පරව ණ්‍ය ප්‍රත්‍යය යෙදී සිඩයි.

කරු, (කරන තැනැත්තේ). කර (කිරීමෙහි) යන ධාතුවෙන්.

ගති, (ගොතනලද දෙය). ගන (ගෙතීමෙහි) යන ධාතුවෙන්.

ගැණි, (ගණින්නා). ගණ (ගිණීමෙහි) යන ධාතුවෙන්.

පැන්, (පියයුතු දෙය). පා (පීමෙහි) යන ධාතුවෙන්.

බෙඩ්, (රකුයා). බි (බියෙහි) යන ධාතුවෙන්.

යදි, (යදින තැනැත්තෝ). යද (අයදීමෙහි) යන ධාතුවෙන්.

වැදි, (විදින තැනැත්තෝ). විද (විදීමෙහි) යන ධාතුවෙන්.

කරන්නා, යන්නා, ආදි අර් ක්‍රියාවාචක ශබ්දද:

කරනු, දෙනු, වළඳනු, නැගුම්, නැමදුම්, යනාදි භාවක්‍රියා ශබ්දද කිතකසංඥාවට ඇත්ලත් ප්‍රත්‍යයාර්ථ ශබ්දයි.

භාවක්‍රියා නම ධාත්වර්ථය [ක්‍රියාවේ වීම] පමණක් හඟවන ශබ්දයි.

වළඳනු යන භාවක්‍රියාවෙන් වළඳන අයවත් වළඳන දෙය වත් නොහැඟේ. වැළඳීමේ පැවැත්ම පමණක් හැඟේ.

භාවක්‍රියාවට නු, ම, යන ප්‍රත්‍යයෝ අභිමතයෙවත්.

41. ආඛ්‍යාතපද.

168. ආඛ්‍යාත නම් කාලකාරකාදියත් හඟවන ක්‍රියාවාචකපදයි.

ධාතුවක් සහ ප්‍රත්‍යයක් සම්බන්ධවීමෙන් ක්‍රියා පදය සෑදේ. ධාතු නම් ක්‍රියාපදයේ මූලයි. ධාතුවට අගින් යෙදී ක්‍රියාපදය සිඬකරන විභක්තිඅක්ෂර ප්‍රත්‍යයෝයි.

'කරති' යනු ක්‍රියාපදයකි. එහි 'කර' යනු ධාතුයි. 'අති' යනු ප්‍රත්‍යයයි. 'කර' යන ධාතුව හා 'අති' යන ප්‍රත්‍යය සම්බන්ධවීමෙන් 'කරති' යන ක්‍රියා පදය සිඬවේ.

'යන්නේ' යනු ක්‍රියාපදයකි. එහි 'යා' යන ධාතු ව හා 'අන්නේ' යන ප්‍රත්‍යය සම්බන්ධවීමෙන් 'ක රන්නේ' යන ක්‍රියාපදය සිඬවේ.

42. අකර්මකධාතු සහ සකර්මකධාතු.

169. ධාතූහු අකර්මකධාතුය සකර්මකධාතුයයි දෙගණයකට බෙදෙත්.

යම් ක්‍රියාවක් කර්තෘවාචක කල්හි කර්මයක් නොගැ නේ නම් ඒ ක්‍රියාවේ ධාතුව අකර්මක වේ. කර්ම යක් ගැනේ නම් ඒ ක්‍රියාවේ ධාතුව සකර්මක වේ.

'මෙහෙකරුවා නිදන්නේය', යන මෙහි නිදන් නේය යන ක්‍රියාව කර්මයක් අපෙක්ෂානොකරන බැවින් එට මුල්වූ 'නිදි' යන ධාතුව අකර්මකයි. නි දන්නේය යන ක්‍රියාවට කර්මයක් උවමනා නොවේ. කර්මයක් නැතිවම ඒ ක්‍රියාව සම්පූර්ණවන හෙයිනි.

මෙහෙකරුවා කුකුළා මැරී, යන මෙහි 'මැරී' යන ක්‍රියාව කුකුළා යන කර්මය අපෙක්ෂාරන බැ

වින් ඒ ක්‍රියාවට මුල්වූ 'මර' යන ධාතුව සකර්මකයි. මැරීමට කර්මවූවකු සිටිය යුතු බැවින් කර්මයක් නැතිව ඒ ක්‍රියාව සම්පූර්ණ නොවේ.

අකර්මකධාතු.—සිට්, නිදි, රඳ, බබල, හඬ, දිව්, යන මේ ආදියයි.

සකර්මකධාතු.—ලබ, සාර, මර, විදි, රක්, දා, යන මේ ආදියයි.

43. විකර්මකධාතු*

170. ප්‍රකෘති විකෘති වශයෙන් කර්මදෙකක් ගැනෙන සකර්මකධාතු විකර්මක නම් වේ.

'රන්කරුතෙම රත්රන් අළුංකරේ' යන මෙහි කෙරේ යන ක්‍රියාවට 'රත්රන්' 'අළු' යන දෙකම කර්මයෝ වෙත්. මෙහි 'රත්රන්' යන්නු ස්වභාවයෙන්ම සිටි බැවින් ප්‍රකෘති කර්ම නමි. 'අළු' යන්නු රත්රනෙහි අමුතු අවස්ථාවක් දක්වන බැවින් විකෘති කර්ම නම් වේ.

කර්තෘපදද කිසිවිටෙක ප්‍රකෘති කර්තෘය, විකෘති කර්තෘයයි, විප්‍රකාර වේ.

'අරක්කු වතුර විය' යන වාක්‍යයෙහි අරක්කු, වතුර, යන දෙකම විය යන ක්‍රියාවට කර්තෘවෙයි. 'අරක්කු' යන්නු ප්‍රකෘති කර්තෘයයිද, 'වතුර' යන්නු විකෘති කර්තෘයයිද සලකනු ලැබේ.

44. ක්‍රියා.

171. ක්‍රියාතොමෝ කර්ත්‍රර්ථයෙහි ත්‍රෛකාලික ක්‍රියාය, ආශිර්වාද ක්‍රියාය, විධි ක්‍රියාය, අසම්භාවනීය ක්‍රියාය, ප්‍රයෝජ්‍ය ක්‍රියාය, පූර්ව ක්‍රියාය, මිශ්‍ර ක්‍රියාය, කර්මාර්ථයෙහි ත්‍රෛකාලික ක්‍රියායයි අෂ්ටවිධ වේ.

---

* මාගධ සංස්කෘත දෙක්හි ගෞණ මුඛ්‍යවශයෙන් ප්‍රකෘති කර්ම දෙකක් ලබන්නාවූ දුහ්, යාච්, යනාදි ධාතු විකර්මක යයි කියත්.

ත්‍රෛකාලික ක්‍රියාව.

172. අතීත, වර්තමාන, අනාගත, යන කාලත්‍රයෙන්ද ප්‍රථම, මධ්‍යම, උත්තම, යන පුරුෂත්‍රයෙන්ද යුත් කර්තෘ අපෙක්‍ෂාකරන ක්‍රියාව ත්‍රෛකාලික ක්‍රියා නම් වේ.

නිෂ්ඨාවූ ක්‍රියාව අතීතයි, නිෂ්ඨානූවූ ක්‍රියාව වර්තමානයි, ආරබ්ධනූවූ ක්‍රියාව අනාගතයි.

කෙළේ, කෙරේ, කරන්නේ, යනු පිළිවෙළින් අතීත, වර්තමාන, අනාගත, යන කාලත්‍රයේ ක්‍රියාවෝ වෙත්.

තශබ්ද ම ශබ්ද දෙකින් පිටත් අන්‍යශබ්දයෙකින් කර්තෘපදය යෙදෙන ක්‍රියාව ප්‍රථම පුරුෂය, තශබ්දයෙන් කර්තෘපදය යෙදෙන ක්‍රියාව මධ්‍යම පුරුෂය, මශබ්දයෙන් කර්තෘපදය යෙදෙන ක්‍රියාව උත්තම පුරුෂයි.

(උෟ) කෙළේ, (තෝ) කෙරෙහි, (මම) කරන්නෙමි, යනු පිළිවෙළින් ප්‍රථම, මධ්‍යම උත්තම, යන පුරුෂත්‍රයෙන්ද අතීත, වර්තමාන, අනාගත, යන කාලත්‍රයෙන්ද යුත් කර්තෘ ක්‍රියාවෝය.

45. ත්‍රෛකාලික ක්‍රියා ප්‍රත්‍යයෝ.

අතීත කාල.

	එකවචන.	බහුවචන.
ප්‍රථම පුරුෂ.	ඉ, ඒ, උ, ඒ	උ, ඌ, හි, හ, හු
මධ්‍යම පුරුෂ.	එහි	හු
උත්තම පුරුෂ.	ඉමි, ඉමි, එමි, එමි	එමු, මු, මෝ, මහ

අ තී ත කා ල.

	ඒකවචන.	බහුවචන.
ප්‍රථම පුරුෂ.	ආ, ඉ, ඊ, ඕ	අත්, ඉත්, එත්, ඔත්, අති, ඉති, එති, ඔති
මධ්‍යම පුරුෂ.	එහි, හි	හු
උත්තම පුරුෂ.	අමි, අම්, ඉමි, ඉම්, එමි, එම්, ඔමි, ඔම්, මි	මු, මෝ, මහ, මිහු, එමු

අ නා ග ත කා ල.

	ඒකවචන.	බහුවචන.
ප්‍රථම පුරුෂ	අන්නේ, එන්නේ, ඔන්නේ, නේ	අන්නෝ, අත් නාහු, නාහු, අන්නාහ, නාහ
මධ්‍යම පුරුෂ.	අන්නෙහි	අන්නාහු [නාමෝ
උත්තමපුරුෂ.	අන්නෙමි, අන්නෙම්	අන්නෙමු, අන්

46. ක්‍රියාවන්ගේ පදසිද්ධිය. (මරධාතුව.)

මරධාතුහු කෙරෙන් පරව අතීතකාල ප්‍රථම පුරුෂ ඒක වචන ක්‍රියා ප්‍රත්‍යයක්වූ ඊයන්න යෙදූ කල්හි මර ඊ කියාවේ. මරයන්නේ රකාරයේ ස්වරය ලොප්කොට ඊ ප්‍රත්‍යය පැමිණවූ කල්හි මරී කියාවේ. මයන්නේ අයන්ට ස්වරවිපර්‍ය්‍යාස යෙන් (මාත්‍රාංශවෘද්ධියෙන් හෝ) ඇයන්නවූ විට මැරී කියා අතීතකාල ප්‍රථමපුරුෂ ඒකවචන ක්‍රියාපදය සිද්ධ වේ.

මරධාතුහු කෙරෙන් පරව අතීතකාල මධ්‍යම පුරුෂ ඒක වචන ක්‍රියා ප්‍රත්‍යයක්වූ එහි යන්නු යෙදූකල්හි මර එහි කියා වේ, යකාරාගම කළ කල්හි මරය් එහි කියා වේ; යයන්නට එයන්න ආරූඪකළ කල්හි මරයෙහි කියාවේ: පිළි විපර්‍ය්‍යාස යෙන් මයන්නේ අයන්න ඇයන්නවී රයන්නේ අයන්න උයන් නැවී මැරුයෙහි කියා අතීතකාල මධ්‍යම පුරුෂ ඒකව වන ක්‍රියාපදය සිද්ධවේ.

මරධාතුහු කෙරෙන් පරව අතීතකාල උත්තමපුරුෂ ඒකවචන ක්‍රියාප්‍රත්‍යයක්වූ එම් යනු යෙදූකල්හි මර එම් කියාවේ. යකාරාගම කළ කල්හි මරය් එම් කියාවේ, යයන්නට එයන්න ආරූඪකල් කල්හි මරයෙම් කියාවේ, පිලිවිපර්‍යාසයෙන් මැරූයෙම් කියා අතීතකාල උත්තම පුරුෂ ඒකවචන ක්‍රියාපදය සිද්ධවේ

ප්‍රත්‍යයන් ගළපා ක්‍රියාවන්ගේ පදසිද්ධිය පූර්වස්වරලොප සන්ධිවිධිය, ස්වරවිපර්‍යාසය, ආගමසන්ධිවිධිය යනාදි ව්‍යාකරණ ග්‍රන්ථවලින් දතයුතුයි.

47. කරධාතුවෙන් සිද්ධවූ කර්තෘපී ත්‍රෛකාලික ක්‍රියා,

අතීත ක්‍රියා.

	ඒකවචන.	බහුවචන.
ප්‍රථම පුරුෂ.	ඌ කොළේ	ඔව්හු කළෝ, කළහ, කළාහු
මධ්‍යම පුරුෂ.	තෝ කෙළෙහි	තෙපි කළහු
උත්තම පුරුෂ.	මම කෙළෙමි	අපි කෙළෙමු

වර්තමාන ක්‍රියා.

	ඒකවචන.	බහුවචන.
ප්‍රථම පුරුෂ.	ඌ කෙරේ, කරයි	ඔව්හු කරත්, කරති, කෙරෙත්, කෙරෙති
මධ්‍යම පුරුෂ.	තෝ කෙරෙහි	තෙපි කරහු
උත්තම පුරුෂ.	මම කරමි	අපි කරමු, කරමෝ, කරම්හ, කරම්හු

අනාගත ක්‍රියා.

	ඒකවචන.	බහුවචන.
ප්‍රථම පුරුෂ.	ඌ කරන්නේ	ඔව්හු කරන්නෝ
මධ්‍යම පුරුෂ.	තෝ කරන්නෙහි	තෙපි කරන්නාහු
උත්තම පුරුෂ.	මම කරන්නෙමි	අපි කරන්නෙමු, කරන්නාමෝ

මහත්මයා අතාවැසියා ලවා බත පිසවයි, මෙහි අතාවැසියා, බත, යන දෙකම කර්මයි.

53. පූර්ව ක්‍රියා.

180. කර්තෘහුගේ පළමු පළමු ක්‍රියා පූර්වක්‍රියා නම් වේ.

එකම කර්තෘකෙනෙක් ක්‍රියා දෙකක් හෝ වැඩි ගණනක් කරන්නේ නම් එහි අවසානක්‍රියාව අපරක්‍රියා නම් වේ. ඊට පළමුකොට කරන ක්‍රියා වෝ පූර්වක්‍රියා නම් වෙත්.

හොරා ගමට ගොසින් සැඟවුණේය, යනමෙහි සොරා යන කර්තෘට ගොසින්ය, සැඟවුණේය, යන ක්‍රියා දෙකක් වේ, එයින් අවසානක්‍රියාව සැඟවුණේය යනුයි. ගොසින් යන ක්‍රියාව ඊට පූර්වයෙන් කළ ක්‍රියාවයි, එබැවින් ගොසින් යනු පූර්වක්‍රියායි.

සොරා ගෙට වැද බඩු ගෙන ගමට ගොසින් සැඟවුණේය. යන මෙහි සැඟවුණේ යනු අපරක්‍රියාවයි; වැද, ගෙන, ගොසින්, යන තුනම පූර්වක්‍රියාවෝය.

පූර්වක්‍රියාවන්ට බොහෝහෙයින් යෙදෙන ප්‍රත්‍ය යෝ නම් අ [ඇ], ආ, ඊ, ඉන්, අලා [ඇලා], ආලා, ඊලා, ඉන්ලා, යන මොහු වෙත්.

උදාහරණ:—

අ, සොරා ඇඳ පැලඳ ඇවිදී.
ආ, වඩුවා ගස කපා ගෙදර ගියේය.
ඊ, මල්කැනෙකැයි සැකී.
ඉන්, තෝ ගමට ගොසින් වර.
අලා, මම සොරු දකලා භයවිමි.
ආලා, දරුවා බත් කාලා නිදන්නේය.

ඊලා, ඇතා ර කීලා ඇවිසුණේය.
ඉන්ලා, මම කොනි **ගොසින්ලා** රැකෙම්ද ?
අවුත්, ගොස්, යනු හලන්ත පූර්වක්‍රියායි.

අප්‍රත්‍යය ඇති සියලු තැන්හි ඇප්‍රත්‍යයමෙන්ද අලාප්‍රත්‍යය ඇති සියලු තන්හි ඇලාප්‍රත්‍යයමෙන්ද සැලකීම පූර්වක ව්‍යවහාරයයි. ඇඳෑ පැලඳෑ දූකැලා යනාදිය මෙනි.

ගෙනා යන පූර්වක්‍රියාව මාගධ ගහ ධාතුවේ ගකාර යට නකාරාදේශවීමෙන්වූ සිංහල **ගන්** ධාතුවෙන් සිඬයි. ගෙනා යන ශබ්දයේ දන්තජ නකාරය සියලුට මහාකවිවරයන්ගේ පද්‍යබන්ධනයන්ගෙන්ද සුප්‍රකාශව පෙනේ.

කාව්‍යශේඛරයෙහි.		බුදුගුණඅලංකාරයෙහි.	
සිහි ඇති වම අස	න	මල් නොගෙන පලදෙ	න
කී දේ ශුහුව දූනගෙ	**නා**	දිඹුල් තුරුසේ ඇව තැ	න
සිතින් තතු විමස	න	කිසි කරුණක් **නොගෙනා**	
මෙබව සරිදූයි කියා දන්ව	න	දනන් සුවපත් කරති නිතියෙ	

ගිරාසන්දේශයෙහි.

තුරු යටියෙන් හුණු පැටිලෙහෙනුන් රැගෙ **නා**
සිතු අටියෙන් පිඹ ඇඟ පිරි මැද සෙවෙ න
මල්ගොටුවෙන් පැන් පොවමින් අතිනති න
සිටි පැටිනන් හෙරණුන්ගෙන් වෙයි හොබ න

54. මිශ්‍රක්‍රියා.

181. අවසාන ක්‍රියාව හා මිශ්‍රව පවත්නාවූ ක්‍රියාව මිශ්‍රක්‍රියා නම් වේ.

'ගොනා තණ කමින් ගියේය', යන මෙහි 'කමින්' යන ක්‍රියාපදය 'ගියේය' යන අවසාන ක්‍රියාපදය හා මිශ්‍රව පැවතුණ බැවින් හෙවත් තණ කෑමද යාමද එකවිට සිඬවූ බැවින් 'කමින්' යනු මිශ්‍රක්‍රියා නම්.

මින, මින්, යන ප්‍රත්‍යයෝ මිශ්‍රක්‍රියාවෙහි බොහෝසෙයින් යෙදෙත්.

48. ආ ශී ර්වා ද ක්‍රි යා.

173. අනාගතාර්ථයක් ප්‍රාර්ථනාකිරීම ආශීර්වාද නාම් වේ.

ආශීර්වාද ක්‍රියා වනාහි අන්‍යශබ්ද, තංශබ්ද, මශබ්ද යන පුරුෂත්‍රයම භජනයකෙරේ, මේ ක්‍රියාවෙහි වා ප්‍රත්‍යය අභිමතයි. වා ප්‍රත්‍යය පුරුෂත්‍රයේ වර්තමාන ක්‍රියා ප්‍රත්‍යයන්ට අයින් යෙදේ.

	ඒකවචන.	බහුවචන.
ප්‍රථම පුරුෂ.	මුළුලොව වැ වේවා	සුදනෝ වැ ඩෙත්වා
මධ්‍යම පුරුෂ.	හිමි ඔබ වැ ජඹෙ හිවා	තොපි රජකර හුවා
උත්තම පුරුෂ.	මම රජවෙම්වා	අපි ජය ගනිමුවා

49. වි ධි ක්‍රි යා.

174. විධානකිරීමෙහි යෙදෙන ක්‍රියාව විධි ක්‍රියා නාම් වේ.

විධානය නම් යමෙකුට කරන නියෝගයකි. ඒ අනාදරයෙන් හෝ ආදරයෙන් හෝ වන්නේය. විධි ක්‍රියාව වර්තමාන අනාගත රූප වෙන් නොව තංශබ්ද අන්‍යශබ්ද දෙක්හි යෙදේ.

තෝ මෙහි වර, මේ පොත මට දෙව, යන මෙහි වර, දෙව යන ක්‍රියාවන්ගෙන් නියෝගයක් ප්‍රකාශ වන බැවින් ඒ විධි ක්‍රියාවෝය. තංශබ්ද ඒකවචනයෙහියි. තොපි වැඩ කරව්, යන මෙහි කරව් යනු තංශබ්ද බහුවචනයෙහි විධි ක්‍රියායි.

මේ කරු වේ පිසන්නේ, ලමයා මෙහි එන්නේ, යන මෙහි පිසන්නේ, එන්නේ, යන ක්‍රියාවෝ අන්‍යශබ්ද විධි ක්‍රියාවෝ වෙත්.

175. විධික්‍රියාව කිසිවෙක ආශීර්වාදාර්ථයෙහි වේ.

ආයු බෝ වන්, සැරදේ මහබා, යනාදියෙහි මෙනි.

50. විධි ක්‍රියා ප්‍රත්‍යයෝ.

තශබ්ද ඒකවචන.	**තශබ්ද බහුවචන.**
අ, ආ, ඊ, උ, අන්, අන්නා ඉන්, අව, උව, ඒව, ඔව	අව්, ඉව්, එව්, ඔව්
අන්‍යශබ්ද ඒකවචන.	**අන්‍යශබ්ද බහුවචන.**
අන්නේ, ඉන්නේ, එන්නේ, ඔන්නේ, ඒ	අන්නෝ, ඉන්නෝ, එන්නෝ, ඔන්නෝ

වර්තමාන ව්‍යවහාරයෙහි ගෞරවාර්ථනොවන තැන ඒක වචනයට **පිය** යන ප්‍රත්‍යයද, ආදරාර්ථ ඒකවචනයට **පන්**, යන ප්‍රත්‍යයද බහුවචනයට **පියව්, පල්ලා**, යන ප්‍රත්‍යයෝද විධික්‍රියාවෙහි යෙදෙත්.

තෝ මෙහි සිටපිය, නුඹ මෙහි සිටපන්, තෙපි මෙහි සිටපියව්, නුඹලා මෙහි සිටපල්ලා, යනාදියෙහි මෙනි.

ගෞරව වශයෙන් කරන විධානයේ අසම්භාවනවූ හෝ භාවාර්ථවූ හෝ ක්‍රියාව අගට කිසිවිටෙක මැනව් යනු යොදනු ලැබේ.

වඩින මැනව්, කරනු මැනව් යනාදියෙහි මෙනි.

නු ප්‍රත්‍යයද විධි ක්‍රියාවෙහි යෙදේ.

ඔහුට යන්ට කියනු. මේ වැඩ මනාසේ කරනු, යනාදියෙහි මෙනි.

"ගනු අවසර එනිරිඳු සිරිපතුල් වැඳ" යනාදි ජේක ප්‍රයොගයෙහිද විධි ක්‍රියාවේ නුප්‍රත්‍යය පෙනේ.

51. අසම්භාවනාක්‍රියා.

176. අනියමාර්ථයෙහිද කාලාර්ථයෙහිද යෙදෙන ක්‍රියාව අසම්භාවනාක්‍රියා නම් වේ.

යම් ක්‍රියාවක්! පුරුෂභෙද වචනභෙද නොමැතිව අනියමාර්ථයක් ප්‍රකාශකෙරේද ඒ අනියමාර්ථ අසම්භාවනක්‍රියා නම් වේ.

"මග රැඳුණ අද තෝ නසී" යන මෙහි "රැඳුණ" යනු අනියමාර්ථයෙහි අසම්භාවනක්‍රියායි. මේ ක්‍රියාවෙන් රැඳීමේ නියමයක් ප්‍රකාශ නොවන්නේය. මග රැඳුණහොත් තෝ නසී යන අර්ථයි.

මේ ක්‍රියාවෙහි බෝහෝසෙයින් තප්‍රත්‍යයද, ත්ප්‍රත්‍යයද අභිමතයි. ත්ප්‍රත්‍යයවත්වූ හොත් යන අනියමාර්ථ ක්‍රියාපදයේ හකාරලොපයෙන් සිඩවූ ඔත් යනුද, ත ප්‍රත්‍යය හා ගැළපීමෙන්වූ තොත්, තත්, යනුද දැනට අසම්භාවන ක්‍රියා ප්‍රත්‍යයන් මෙන් බොහෝකොට ව්‍යවහාරවෙත්.

උදාහරණ:—ඔහු ආවොත් මම නොයමි; උඹ යතොත් මමත් යමි; එහි යතත් මට බැරි නැහැ. යනාදියයි.

ලියහැකි, කියහැකි, යනාදි ක්‍රියාද අනියමාර්ථයෙහි අසම්භාවන ක්‍රියාවෙන් පරවූ හැකි යන නිපාතයාගේ ප්‍රයෝගයි. එහි අර්ථ ලියතොත් හැකිය, කියතොත් හැකිය, යනුයි.

177. යම් ක්‍රියාවකින් අනික් ක්‍රියාවක් සිඩවූ කාලය ප්‍රකාශ වේ නම් ඒ කාලාර්ථඅසම්භාවන ක්‍රියා නම් වේ.

"කියත ඔහු මෙතෙප ල
ආයෙය ඇදුරු ගුත්ති ල,, යන මෙහි කියත යනු කාලාර්ථයෙහි අසම්භාවන ක්‍රියායි. ආයෙය යන ක්‍රියාව සිඩවූ කාලය එයින් හැඟේ.

කාලාර්ථඅසම්භාවනක්‍රියාවට අයින් දී, ම, යන ප්‍රත්‍යයෝද ව්‍යවහාරකෙරෙත්.

ඔහු සිටියදී මම ආමි, ඔහු සිටිද්දී මම ආමි, යන මෙහි අසම්භාවනාක්‍රියාවූ සිටිය, සිටිත්, යන පද යන්ගෙන් පරව දිප්‍රත්‍යය යෙදී තිබේ. සිටිද්දී යනු සිටිත්දී යන්නෙහි තකාරය පරරූපය ගැන්මෙන් සිඩයි.

වැසි වැස්සාම වී වපුරමි, යන මෙහි වැස්සාම යනු කාලාර්ථයෙහිවූ අසම්භාවනාක්‍රියායි. පුරාණ පොත් පත්වල කියත්ම, බබලත්ම, යනාදි වශයෙන් මේ මප්‍රත්‍යය යෙදුණු කාලාර්ථ අසම්භාවනාක්‍රියා ප්‍රකාශ කෙරෙත්. කියත්ම යනු කියන කල්හි යන අර්ථයි.

52. ප්‍රයොජ්‍යක්‍රියාව.

178. අන්‍යයකු ලවා කරවන ක්‍රයාව ප්‍රයොජ්‍ය ක්‍රියා නම් වේ.

මේ ක්‍රියාවෙහි ධාතුවෙන් පරව වප්‍රත්‍යය අසිම තායි. ප්‍රථම, මධ්‍යම, උත්තම, යන පුරුෂත්‍රයෙහිද අතීත, වර්තමාන, අනාගත යන කාලත්‍රයෙහිද, ආශිර්වාද අසම්භාවනා ආදී ක්‍රියා විෂයෙහිද ප්‍රයොජ්‍ය ක්‍රියාව යෙදේ.

මම බත පිසවමි, යනමෙහි පිසවමි යනු ප්‍රයො ජ්‍යක්‍රියායි.

179. ප්‍රයොජ්‍යක්‍රියාවිෂයෙහි අකර්මකධාතු සකර්මක වෙයි, සකර්මකධාතු බහුකර්මකවේ.

දශී පුත්‍රයා හඬවයි, යන මෙහි හඬ යන අකර්මක ධාතුවෙන් සිඩවූ හඬවයි යනු ප්‍රයොජ්‍යක්‍රියාවක් බැවින් ඒ ක්‍රියාවෙන් පුත්‍රයා යන කර්මය ගැනේ.

සකර්මක ධාතුවකින් ප්‍රයොජ්‍යක්‍රියාවවූවිට කර්ම දෙකක් ගැනේ, ක්‍රියාව කරන්නා [ශුඩකර්තෘ] ප්‍රකාශකරන පදයෙන් පරව 'ලවා' යන ප්‍රත්‍යය යෙදේ.

මහත්මයා අතාවැසියා ලවා බත පිසවයි, මෙහි අතාවැසියා, බත, යන දෙකම කර්මයි.

53. පූ ර්ව ක්‍රි යා.

180. කර්තෘහුගේ පළමු පළමු ක්‍රියා පූර්වක්‍රියා නාම වේ.

එකම කර්තෘකෙනෙක් ක්‍රියා දෙකක් හෝ වැඩි ගණනක් කරන්නේ නම් එහි අවසානක්‍රියාව අපරක්‍රියා නම් වේ. ඊට පළමුකොට කරන ක්‍රියාවෝ පූර්වක්‍රියා නම් වෙත්.

හොරා ගමට ගොසින් සැඟවුණේය, යනමෙහි හොරා යන කර්තෘට ගොසින්ය, සැඟවුණේය, යන ක්‍රියා දෙකක් වේ, එයින් අවසානක්‍රියාව සැඟවුණේය යනුයි. ගොසින් යන ක්‍රියාව ඊට පූර්වයෙන් කළ ක්‍රියාවයි, එබැවින් ගොසින් යනු පූර්වක්‍රියායි.

හොරා ගෙට වැද බඩු ගෙන ගමට ගොසින් සැඟවුණේය. යන මෙහි සැඟවුණේ යනු අපරක්‍රියාවයි; වැද, ගෙන, ගොසින්, යන තුනම පූර්වක්‍රියාවෝය.

පූර්වක්‍රියාවන්ට බොහෝසෙයින් යෙදෙන ප්‍රත්‍යයෝ නම් අ [ඇ],ආ, ඊ, ඉන්, අලා [ඇලා], ආලා, ඊලා, ඉන්ලා, යන මොහු වෙත්.

උදාහරණ:—

අ, හොරා ඇඳ පැලඳ ඇවිදී.
ආ, වඩුවා ගස කපා ගෙදර ගියේය.
ඊ, මල්කැනෙකැයි සැකී.
ඉන්, තෝ ගමට ගොසින් වර.
අලා, මම හොරු දැකලා භයවිමි.
ආලා, දරුවා බත් කාලා නිදන්නේය.

ඊලා, ඇතා ර බීලා ඇවිසුණේය.
ඉන්ලා, මම කොහි ගොසින්ලා රුකෙමිද?
අවුත්, ගොස්, යනු හලනත පූර්වක්‍රියායි.

අප්‍රත්‍යය ඇති සියලු තැන්හි ඇප්‍රත්‍යයමෙන්ද අලාප්‍රත්‍යය ඇති සියලු තන්හි ඇලාප්‍රත්‍යයමෙන්ද සැලකීම පුරාතන ව්‍යවහාරයයි. ඇදෑ පැලදෑ දූකැලා යනාදිය මෙනි.

ගෙනා යන පූර්වක්‍රියාව මාගධ ගහ ධාතුවේ හකාර යට නාකාරදෙශවීමෙන්වූ සිංහල **ගන්** ධාතුවෙන් සිඩයි. ගෙනා යන ශබ්දයේ දන්තජ නාකාරය සියලුට මහාකවිවරයන්ගේ පද්‍යබන්ධනයන්ගෙන්ද සුප්‍රකාශව පෙණේ.

කාව්‍යශේඛරයෙහි.

සිහි ඇති වම අස න
කී දේ ශූහුව දූනගෙ **නා**
සිතින් තතු විමස න
තමබව සරිදූයි කියා දන්ව න

බුදුගුණඅලංකාරයෙහි.

මල් නොගෙන පලදෙ න
දිඹුල් තුරුසේ ඇම තැ න
කිසි කරුණක් **නොගෙනා**
දනන් සුවපත් කරති නිතියෙ

ශිරසන්දේශයෙහි.

තුරු යටියෙන් හුණු පැටිලෙහෙතුන් රුගෙ **නා**
සිතු අවියෙන් පිඹ ඇඟ පිරි මැද සෙවෙ න
මල්ගොටුවෙන් පැන් පොවමින් අතිනති න
සිටි පැටිතන් හෙරණුන්ගෙන් වෙයි හොබ න

54. මිශ්‍රක්‍රියා.

181. අවසාන ක්‍රියාව හා මිශ්‍රව පවත්නාවූ ක්‍රියාව මිශ්‍රක්‍රියා නම් වේ.

'ගොනා තණ කමින් ගියේය', යන මෙහි 'කමින්' යන ක්‍රියාපදය 'ගියේය' යන අවසාන ක්‍රියාපදය හා මිශ්‍රව පැවතුණ බැවින් හෙවත් තණ කෑමද යාමද එකවිට සිඩවූ බැවින් 'කමින්' යනු මිශ්‍රක්‍රියා නාමි.

මින, මින්, යන ප්‍රත්‍යයෝ මිශ්‍රක්‍රියාවෙහි බොහෝසෙයින් යෙදෙත්.

182. පූර්වක්‍රියාව විකවිමෙන්ද මිශ්‍රක්‍රියාපීය ප්‍රකාශවේ.

ඒ මිනිහා බැණ බැණ ගියේය, යන මෙහි බැණ බැණ යනු මිශ්‍රක්‍රියාපීයෙහි පූර්වක්‍රියායි.

55. කර්තෘක්‍රියා සහ කර්මක්‍රියා.

183. කර්තෘට භාරවූ ක්‍රියාව කර්තෘක්‍රියා නම් වෙයි. කර්මයට භාරවූ ක්‍රියාව කර්මක්‍රියා නම් වේ.

යම් ක්‍රියාවක් කර්තෘට භාරවේද හෙවත් යම් ක්‍රියාවකින් කර්තෘ කියවේද ඒ ක්‍රියාව කර්තෘක්‍රියා නම් වේ. වඩුවා ගෙය තැනුවේය, යන වාක්‍යයෙහි තැනුවේ යන ක්‍රියාව වඩුවා යන කර්තෘට භාරවන්නේය. හෙවත් තැනුවේ යන ක්‍රියාවෙන් වඩුවා යන කර්තෘ කියවෙයි. එහෙයින් තැනුවේ යනු කර්තෘක්‍රියායි.

ගින්නෙන් වනය දැවිණි, යනමෙහි දැවිණි යන ක්‍රියාව වනය යන කර්මයට භාරවේ. එහෙයින් දැවිණි යනු කර්මක්‍රියායි.

කර්තෘක්‍රියාවේ ප්‍රත්‍යයෝ යට දැක්වූ ත්‍රෛකාලික ක්‍රියා ප්‍රත්‍යයෝමයි. කර්මක්‍රියාවටද ඒ ප්‍රත්‍යයෝම යෙදෙත්, නමුත් අතීතකාල කර්මක්‍රියාවේ ධාතුවටත් ප්‍රත්‍යයටත් අතරට ණප්‍රත්‍යයද පිලිවිපර්‍ය්‍යාසයද මාත්‍රාවෘද්ධියද අභිමතයි. වර්තමාන අනාගත කාලික ක්‍රියාවෝ පිලිවිපර්‍ය්‍යාසයෙන් පමණක් සිද්ධවන්නාහුය.

පදසිද්ධිය:—දැවිණි යනු ප්‍රථම පුරුෂ අතීතකාල එකවචන කර්මක්‍රියායි. දව යන ධාතුවෙන් පරව ඉ යන අතීතකාල ප්‍රථම පුරුෂ එකවචන ප්‍රත්‍යය කළ කල්හි දවඉ කියාවේ. ධාතුවටත් ප්‍රත්‍යයටත් අතරට ණප්‍රත්‍යය කළ කල්හි දවණඉ කියා-

වේ. ණකාරයට අකාරය ලොප්කොට හල්ණකාරයට ඉකාරය පැමිණවූවිට දුවණි කියාවේ. ඉන්පසු ද, ව, යන අක්ෂරයන්ට මාත්‍රාවෘද්ධි හා පිළිපෙරළිකළ කල්හි දූවිණි කියා පදසිද්ධිය වේ. මෙසේම දූවූණෙහි, දූවූණෙමි, යන මධ්‍යම පුරුෂ උත්තම පුරුෂ අතීතක්‍රියා ඒකවචනද ධාතුවටත් ප්‍රත්‍යයටත් අතර ණප්‍රත්‍යය යොදලී මෙන් හා දකාර වකාර දෙදෙනාගේ පිළිවිපර්‍යාසයෙන්ද සිද්ධවන්නේය.

දූවේ යනු ප්‍රථම පුරුෂ වර්තමානකාල ඒකවචන කර්මක්‍රියායි. එහි පදසිද්ධිය මෙසේය. දුව යන ධාතුවෙන් පරව "ඒ" යන වර්තමානකාල ප්‍රථම පුරුෂ ඒකවචන ක්‍රියා ප්‍රත්‍යය කළ කල්හි දුව ඒ කියාවේ. පූර්වස්වර ලොප සන්ධිවිධියෙන් වයන්නට එයන්න ගැළපූ කල්හි දවේ කියා වේ. ඉක්බිති ස්වර විපර්‍යාසයෙන් දයන්නේ අයන්න ඇයන්නවූවිට නොහොත් මාත්‍රාංශවෘද්ධිය කළ විට දූවේ කියා පදසිද්ධිය වේ. දූවෙහි, දූවෙමි, යන මධ්‍යම උත්තම පුරුෂක්‍රියා පදයන්ගේ සිද්ධියද මෙපරිද්දෙන්ම වන්නේය.

දූවෙන්නේ, දූවෙන්නෙහි, දූවෙන්නෙමි, යන පුරුෂත්‍රයේ අනාගත ඒකවචන ක්‍රියාවන්ගේ පදසිද්ධියද එන්නේ, එන්නෙහි, එන්නෙමි, යන ප්‍රත්‍යයන් ගළපා පිළිපෙරළි කිරීමෙන් වන්නේය.

භාවක්‍රියා ශබ්දයාගේත් කාලත්‍රයෙහි පුරුෂත්‍රය සම්බන්ධවූ ප්‍රත්‍යයන්ගේත් අතරට ලබ යන ධාතුව එක්කොටද කර්මක්‍රියාව සිද්ධකරත්. මාවිසින් පොත ලියනලද්දේය; තාවිසින් පොත ලියනුලැබේ; ඔහුවිසින් පොත ලියනුලබන්නේය, යනාදි වශයෙනි.

මේ වාක්‍යයන් කර්තෘක්‍රියාවෙන් කියනකල—මම පොත ලියුවෙමි; තෝ පොත ලියුවෙහි; ඌ පොත ලියන්නේ, යනාදි වශයෙන් යෙදේ. ලබධාතුව යෙද්මෙන් සිද්ධවන කර්මක්‍රියා වර්තමාන සිංහලභාෂාවේ බහුලයි.

56. නිරුත්සාහ ක්‍රියා.

184. කර්තෘහුගේ උත්සාහයක් නැතිව සම්පාදනය වන්නාවූ ක්‍රියාව නිරුත්සාහ ක්‍රියා නම් වේ.

නිරුත්සාහයෙන් සම්පාදනයවන්නාවූ කර්තෘ අර්ථයටද කර්මක්‍රියාවට යෙදෙන ප්‍රත්‍යයෝ අභිමත වෙත්.

සඳ බැබලිණි, සඳ බැබලේ, සඳ බැබලෙන්නේය, යන මෙහි බැබලිණි, බැබලේ, බැබලෙන්නේ යන ක්‍රියාවෝ නිරුත්සාහයෙන් සම්පාදනයවන කාලත්‍රය සම්බන්ධ ප්‍රථම පුරුෂ ඒකවචනයි.

සකර්මක ධාතුන්ගෙන් සිද්ධවූ නිරුත්සාහක ක්‍රියාවල කර්තෘට ස්වයං කර්තෘ ස්වයං කර්මයයි කියනු ලැබේ. කළය බිඳේ. යනමෙහි කර්තෘත් කළයයි කර්මයත් කළයයි.

කර්මක්‍රියාවන්හිද නිරුත්සාහයෙන් සම්පාදනයවන අතීත ක්‍රියාවන්හිද ධාතුවටත් ප්‍රත්‍යයටත් අතරට යෙදෙන ණ ප්‍රත්‍යය මූර්ධජමය. ඒ බව ඡේකප්‍රයෝගානුසාරයෙන් නිශ්චිත වේ.

ගුත්තිලකාව්‍යයෙහි.

දිය දිය ගොස පළකොරෙමින් සපැමිණි
ගිය ගියැ තැන ඉස්වා රන් මුතුමිණි
ගිය ගියැ දිනා නද එනැමෙන් ගෙනැරණි
සිය සිය ගුණයෙන් වෙණනද නිකැමිණි

සැළලිහිණිඅස්නෙහි.

ලප නොමවන් සඳමෙන් සොමි ගුණ ගිහිණි
ඔප වැඩි ගත ගෙල් මැලි සිසු මැලි පැමිණි
සැප සිරි දෙන වැනි රස බැඳැති සිතුමිණි
තොප දැනුමෙන් අප පින්කළ බව දැනුණි

බුදුගුණඅලංකාරයෙහි.

සඟපිරිවර මුනි දැකුමට එතෙ ණේ
ලඟදිව නයි කැල පෙණ කැල පෙනු ණෙ
දඟවන මන පුරඟනා රඟ සැදූ ණේ
ගඟ සුදුරත් පිපි පියුමෙන් සැදූ ණේ

57. ගුණවාචකක්‍රියා.

185. ධාතූන්ගෙන් සිඩවන ප්‍රත්‍යයාර්ථ ශබ්ද යන් අතුරෙන් නාමපදයන්ට විශෙෂණවන් නාවූ ශබ්දයෝ ගුණවාචකක්‍රියා නම් වෙත්.

ඔහු මැරූ, ගොනා, අහසේ බබලනා සඳ, යනා මෙහි මැරූ, බබලනා, යනු මර, බබල, යන ධාතූන්ගෙන් සිඩවූ ගුණවාචකක්‍රියාවෝය.

186. ගුණවාචකක්‍රියාවෝ අතීත වර්තමාන කාලවයෙහි වෙත්.

අතීතකාල ගුණවාචකක්‍රියාවෝ උ, ඌ, ආ, යන ප්‍රත්‍යයන්ගෙන් යුක්තවෙත්. **උදාහරණ**:—දුටු, මැරූ, කළා [වූ,] යනාදියයි.

වර්තමානකාල ගුණවාචකක්‍රියාවෝ අන, න, නා, අන්නා, යන ප්‍රත්‍යයන්ගෙන් යුක්තවෙත්. **උදාහරණ**.—කරන, අදින, යන්නා [වූ], යනාදියයි

187. කිසි ශබ්දයක අතීතකාල ගුණවාචක ක්‍රියාව ඒ ශබ්දයේ අතීතක්‍රියා ප්‍රකෘතියම වේ.

කළ වැඩ, ගිය ගමන, මළ මිනිසා, යනාදියෙහි මෙනි. මෙහි කළ, ගිය, මළ, යන අතීතක්‍රියා ප්‍රකෘතිහු අතීතකාල ගුණවාචකක්‍රියාවශයෙන්ද යෙදෙත්.

කරන, සරන, ආදි ගුණවාචක ක්‍රියාවන්ගේ නකාරයට ඒ ශබ්දයන්ගේ රකාර නිමිත්තකොගෙන මෙකල ඇතම් කෙනෙක් ණකාරාදේශකොට කරණ, සරණ කියා යොදත්.

නමුත් රකාරාදියක් නිසා නකාරයට ණකාරාදේශකිරීමට විධානයක් එළුවියරණෙහි අභිමත නොවේ. මෙහි දනැජ නකාරයම යෙදීම කාව්‍යලක්ෂණ ප්‍රමුඛ පද්‍යබන්ධනයන්ගෙන්ද වෙනත් ස්ථිර ලිපිවලින්ද සුප්‍රකාශ වේ.

කාව්‍යශේඛරයෙහි.		බුදුගුණඅලංකාරයෙහි.	
සතහට පින් **කර**	**නා**	ලොව නරයන් **කර**	**නා**
සතුටු විරිය වඩව	න	මහ පුද ලබන නිතියෙ	න
ඔවුන් ගුණ පවස	න	ධුදුකෙනෙකැත නම්	න
කලට පැසසුම් කුසලි දසවන		පසිඳු මක්කලි ගෝසාලය	න

සැළලිහිණිඅස්නෙහි.

ර ජ කු ල සුපුල් විල රජ හසවන් **සර**	**නා**
පෙ ර ම ල වියාවත් රුසිරෙන් මන නඳ	න
හැ ම කා ල විපුල සව් සැපතින් නොඅඩුව	න
තෙද බ ල විකුම් ගුණ මිණි බරණින් තෙවු	න

188. නිරුක්තසාගරයෙන් සම්පාදනයවන්නාවූ අතීතකාල ගුණවාචකක්‍රියාවන්හි බොහෝසෙසින් 'උණු', 'උණ', යන ප්‍රත්‍යයෝද වර්තමානකාල ගුණවාචකක්‍රියාවන්හි 'එන' ප්‍රත්‍යයද යෙදෙත්.

ගසේ **රැඳුණු** ගෙඩිය, ගෙඩි **පැසෙන** කාලය යනාදියෙහි මෙනි.

මේ 'උණු', 'උණ', යන ප්‍රත්‍යයන්ගේ මූර්ධජණකාරය ජේක ප්‍රයෝගයෙහි සිඩයි.

කාව්‍යශේඛරයෙහි.		බුදුගුණඅලංකාරයෙහි.	
වෙනත සිග **දුසු**	**ණු**	සිහිල් දිය **පිරු**	**ණු**
යකින්යක වෙන් **කිපු**	**ණු**	පිය ගැට පෙළින් **දිලු**	**ණු**
බැම්ණි ගුණ දරු	ණු	බිඟු දුල් **මිසුරු**	**ණු**
නොපිළිවිස කිසි උපන් කරු		වීය තැන තැන පියුම් පොකු	

58. උපසර්ගපද.

189. නාමයක හෝ ක්‍රියාවක මුලින් යෙදී යම් කිසි අර්ථයක් ප්‍රකාශකරන පද උපසර්ග නම් වේ.

උපසර්ගයෝ වනාහි නාමපද හා ක්‍රියාපද මෙන් රූපය වෙනස් නොව නිතරම ප්‍රකෘතියෙන් සිටිත්. සංස්කෘත භාෂාවේ උපසර්ග විස්සක් පමණ වේ. ඔව්හු මිශ්‍රසිංහල භාෂාවේ ව්‍යවහාරවන සංස්කෘත වචනයන්ට මුලින් යෙදෙත්. මේ සංස්කෘත උපසර්ගයන්ගෙන්ද මාගධ උපසර්ගයන්ගෙන්ද බොහෝ සෙයින් බිඳී ආ ශුද්ධසිංහල උපසර්ගයෝද විස්සෙකි. ඔව්හු ශුද්ධසිංහල ශබ්දයන්ට මුලින් යෙදෙත්. උපසර්ග සම්බන්ධවීමෙන් නාමපදයන්ගේද ක්‍රියාපදයන් ගේද අර්ථ වෙනස්වේ. ඒ මෙසේය:—ලද යනු ලබ්ධියට නාමකි. මේ ලද යන ශබ්දයට මුලින් දු යන උපසර්ගය යෙදූකල දුලද කියාවේ. දුලද ශබ්දයෙන් වැරදි ලබ්ධිය යන අර්ථයක් හැඟේ. මෙසේම ගැනීම යන පදයට පිළි යන උපසර්ගය යෙදූකල පිළිගැනීම කියාවේ. පිළිගැනීම යන්නෙන් දෙනලද දෙයක් කැමැත්තෙන් ගැනීම යන අර්ථයක් හැඟේ.

උපසර්ග.		උපසර්ගසහිත පද.	
සංස්කෘත.	**සිංහල**	**සංස්කෘත.**	**සිංහල.**
අති	අති	අතික්‍රාන්ත	ඉකුත්
අධි	අදි	අධිකාර	අදියර
අනු	අනු	අනුඥා	අනුදැනුම්
අප	අප	අපාදාන	අපදන්
අපි, පි	පි	අපිධාන, පිධාන	පියන්
අභි	අබි	අභිධර්ම	අබිදම්, විජම්

උපසර්ග.		උපසර්ගසහිත පද.	
සංස්කෘත.	සිංහල.	සංස්කෘත.	සිංහල.
අව	අව	අවසාන	අවසන්
ආ	අ	ආදර	අදර
උද්	උ	උත්පත්ති	උපත
උප	උව	උපමා	උවම්
දුර්	දු	දුර්ලබ්ධි	දුලද
නි	නි	නිරෝධ	නිරෙද
නිඃ	නි	නිෂ්ක්‍රාන්ත	නිකුත්
පරා	පර	පරාජය	පැරදුම
පරි	පිරි	පිරිවෙණ	පිරිවෙන්, පිරුවන්
ප්‍ර	ප	ප්‍රමාණ	පමණ
ප්‍රති	පිළි	ප්‍රතිපත්ති	පිළිවෙත්
වි	වි	වියෝග	වියෝ
සම්	ස	සම්බන්ධ	සබඳ
සු	සු	සුභාෂිත	සුබැසි

59. නිපාත.

190. නාමපදයන්ටද ක්‍රියාපදයන්ටද පෙරටුව හෝ පසුව හෝ යෙදී යම් කිසි අර්ථයක් ප්‍රකාශ කරන නොහොත් වාක්‍යය අලංකාරකරන පදයෝ නිපාත නම් වෙත්.

නිපාතයෝ උපසර්ග මෙන්ම නිතරම ප්‍රකෘතියෙන් සිටිත්. 'මේ රහස් කටයුතත රජ්ජුරුවන් දතහොත් මාගේ දිවිනැතැයි කීය'. 'ඒ ගෝරිමඬ සිටාණෝ වනාහි කෙසේවූ කෙනෙක්ද යත්'—යන මේ වාක්‍යයන්හි 'හොත්', 'වනාහි', යන පදයෝ නිපාතයෝය. මෙයින් පළමුවෙනි වාක්‍යයේ හොත් යන නිපාතය කාරණකොට එහි ක්‍රියාවේ අනියමාර්ථය සුප්‍රකාශවේ. දෙවෙනි වාක්‍යයේ 'වනාහි'

යන නිපාතයෙන් වාක්‍යය අලංකාරවේ, නමුත් කිසිම අමුතු අර්ථයක් ප්‍රකාශනොවේ. කලී, නම්, යන නිපාතයෝද වාක්‍යය අලංකාර පිණිස හෙවත් පදපූරණය පිණිස යොදත්.

නිතුත්, ව, වැනි, වනාහි, කලී, නම්, විනා, වෙනා, ල, යි, ද, ම, න, කිම්, හොත්, යම්සේ, එසේ, මෙසේ, සහ, අද, එදා, යන මේ ආදිය නිපාත පදයෝය.

60. ක්‍රියාවිශෙෂණ.

191. ක්‍රියාවන්ට විශෙෂණවූ ශබ්ද ක්‍රියාවිශෙෂණ නම් වේ.

අද, ඈත, ඉක්බිති, එතන, එදා, එවිට, කොයි, දැන්, නැවත, නිති, නොයෙක්විට, නොකඩව, පළමු, පසුව, මතු, මෑත, මෙහි, යලි, වහා, යට, කෙසේ, යුහුව, එසේ, වෙසේ, සෙමින්, යම්සේ, ඉවත, යනාදි ශබ්දයෝ ක්‍රියාවන්ට විශෙෂණවනහෙයින් ක්‍රියාවිශෙෂණ නම් වෙත්.

61. නිෂ්පන්න, තත්සම, තද්භව.

192. සිංහල භාෂාවේ ශබ්දයෝ නිෂ්පන්න, තත්සම, තද්භවයයි ත්‍රිවිධවෙත්.

(1) අන්‍ය භාෂාවක් හා සම්බන්ධයක් නැති ලඬකාවේම ප්‍රකට ශබ්දයෝ නිෂ්පන්න නම් වෙත්.

(2) මාගධ සංස්කෘතාදි භාෂාවලට සමානවන සිංහල ශබ්දයෝ තත්සම නම් වෙත්.

(3) මාගධ සංස්කෘතාදි භාෂාවලින් බිදී ආ ශබ්දයෝ තද්භව නම් වෙත්.

සිංහල භාෂාවේ මව් භාෂාව ප්‍රාකෘතවූ දෙශමාගධීයයි. ක්‍රිස්තුවර්ෂයෙන් යට 543 වෙනි වර්ෂයේදී

ලඞ්කාව අත්පත්කොට ගත් විජයරජු සහ පිරිස කථාකළ භාෂාව ඒ ප්‍රාකෘතයයි. ඒ කාලයේදී දෙශමාගධියට සමානවූ තවත් ප්‍රාකෘතභාෂාවෝ ඉන්දියාවේ ව්‍යවහාරවූහ. දෙශමාගධියෙන් ශුද්ධමාගධ හෙවත් පාලිභාෂාවද අන්‍ය ප්‍රාකෘතයකින් සංස්කෘතභාෂාවද ප්‍රභෙදවූ බව කල්පනාකළයුතුයි. ඉන්දියාවේ දැනට ව්‍යවහාරවන්නාවූ හින්දි, බංගාලි, මරාටි ආදී භාෂාවෝද පූරාණ ප්‍රාකෘතභාෂාවලින් භින්නවූවාහුය. එහෙයින් සිංහලභාෂාවෙහි මාගධ සංස්කෘතාදි භාෂාවලට සමාන ධාතුප්‍රකෘති හා ශබ්දප්‍රකෘති බොහෝකොට දක්නාලැබෙත්. ඔව්හු තත්සම නම් වෙත්.

යා (යාමෙහි) යන ධාතුව මාගධ සංස්කෘත සිංහල භාෂාවන්හි සමාන බැවින් තත්සමධාතුප්‍රකෘති නම් වේ.

හස්තින්ට නමක්වූ ගජ ශබ්දය මාගධ සංස්කෘත සිංහල භාෂාවන්හි සමාන බැවින් තත්සමශබ්දප්‍රකෘති නම් වේ.

සිංහල භාෂාවෙහි මාගධාදි භාෂාවලින් භින්නවූ මදවෙනසක් ඇති ධාතුප්‍රකෘති සහ ශබ්දප්‍රකෘති බොහෝය. ඔව්හු තද්භව නම් වෙත්. මාගධ භාෂාවේ වැඩිම යන අර්ථ ඇති 'වඩ්ඪ' යන ධාතුවෙන් සිංහල භාෂාවේ එම අර්ථඇති 'වඩ' යන ධාතුව බිඳී ඇවිත් තිබේ. ඒ තද්භවධාතුප්‍රකෘති නම්වේ. මාගධ රුක්ඛ ශබ්දයෙන් සිංහල රුක් ශබ්දය භින්න වී තිබේ. ඒ තද්භවශබ්දප්‍රකෘති නම් වේ.

මාගධාදි අන්‍ය භාෂාවක් හා සම්බන්ධයක් නැත්තාවූද ලඞ්කාවේම ව්‍යවහාරයට ආවාවූද ශබ්ද ඉතා ස්වල්පයක් සිංහල භාෂාවෙහි දක්නා ලැබේ. ඒ නිෂ්පන්නශබ්ද නම් වේ.

(1) නිෂ්පන්න ධාතුප්‍රකෘති.

නරඹ (බැලීමෙහි), රුකුර (කිරීමෙහි)
ල (දැමීමෙහි), ඉවස (ඉවසීමෙහි)
වන (සැලීමෙහි), හන (හැනීමෙහි)

(2) තත්සම ධාතුප්‍රකෘති.

සංස්කෘත.	මාගධ.	එළු.	අර්ථ.
කෘ	කර	කර	කිරීමෙහි
ගණ	ගණ	ගණ	ගිණීමෙහි
ගර්හ	ගරහ	ගරහ	ගැරහීමෙහි
නට	නට	නට	නැටීමෙහි
නම	නම	නම	නැමීමෙහි
නශ	නස	නස	නැසීමෙහි
තඩ	තළ	තළ	තැළීමෙහි
තප	තප	තව	තැවීමෙහි
දා	දා	දා	දීමෙහි
පා	පා	පා	පීමෙහි
මෘ	මර	මර	මැරීමෙහි
වස	වස	වස	විසීමෙහි
හෘ	හර	හර	හැරීමෙහි

(3) තද්භව ධාතු ප්‍රකෘති.

සංස්කෘත.	මාගධ.	එළු.	අර්ථ.
කථ	කථ	කිය	කීමෙහි
ක්‍රීඩ	කීළ	කෙළ	ක්‍රීඩාකිරීමෙහි
ඛඩ	ඛඩ	කඩ	කැඩීමෙහි
ඛාද	ඛාද	කද	කෑමෙහි
ග්‍රන්ථ	ගන්ථ	ගොත	ගෙතීමෙහි
ග්‍රහ	ගහ(ගණ්හා)	ගන්	ගැනීමෙහි

සංස්කෘත.	මාගධ.	එළු.	අළු.
ඝට්ට	ඝට්ට	ගට	ගැට්මෙහි
චුම්බ	චුම්බ	සිඹ	සිඹිමෙහි
ජෘ	ජර	දිර	දිරිමෙහි
ඥා	ඤා	දන්	දැනිමෙහි
දහ	දහ	දා	දෑමෙහි
ධාව	ධාව	දිව (දුව)	දිවිමෙහි
ධෘ	ධර	දර	දැරිමෙහි
පච	පච	පිස	පිසිමෙහි
වෘත	වත	වට	වැටිමෙහි
පූජ	පූජ	පුද	පිදිමෙහි
පූර	පූර	පුර	පිරිමෙහි
ප්ලුෂ	පලුස	පුලුස	පිලිස්සිමෙහි
ඵල	ඵල	පල	පැලිමෙහි
බන්ධ	බධ	බඳ	බැඳිමෙහි
භාජ	භාජ	බෙද	බෙදීමෙහි
භූ	භූ	වූ	වීමෙහි
භ්‍රස්ජ	භජ්ජ	බද	බැදීමෙහි
මන්ථ	මන්ථ	මතුර	මැතිරිමෙහි
ම්‍රක්ෂ	මක්ඛ	මක	මැකීමෙහි
මූච	මූච	මුස (මුද)	මිදීමෙහි
යාච	යාච	යද	යැදීමෙහි
රක්ෂ	රක්ඛ	රක්	රැකීමෙහි
රුජ	රුජ	රුද	රිදීමෙහි
ලභ	ලභ	ලබ	ලැබීමෙහි
ලිඛ	ලිඛ	ලිය	ලිවීමෙහි
වද	වන්ද	වඳ	වැඳිමෙහි
වර්ණ	වණ්ණ	වන්	වැනීමෙහි
විද	විද	විඳ	විඳිමෙහි
ව්‍යධ	විධ	විද	විදීමෙහි

සංස්කෘත.	මාගධ.	එළු.	අපී.
වෘධ	වඩ්ඪ	වඩ	වැඩිමෙහි
වෘෂ	වස්ස	වස	වැසි වැසිමෙහි
වෙෂ්ට	වෙට්ඨ	වෙළ	වෙළිමෙහි
ශිව	සිව	සිස, ඉස	ඉසිමෙහි
ෂ්ඨා (තිට්ඨ)	ඨා (තිට්ඨ)	සිට	සිටිමෙහි
ශාධ	සාධ	සාද, සද	සැදීමෙහි

(1) නිෂ්පන්න ශබ්ද ප්‍රකෘති.

කොළඹ, පොල්, දෙල්, කුරුඳු, හෙරළි, කෝරළ, හරක්, කොටි, ලිහිණි, ඔරු, යනාදියයි.

(2) තත්සම ශබ්දප්‍රකෘති.

සංස්කෘත.	මාගධ.	එළු.
කමල	කමල	කමල
කුල	කුල	කුල
ගජ	ගජ	ගජ
ගණ	ගණ	ගණ
දින	දින	දින
නර	නර	නර
පර	පර	පර
බල	බල	බල
බාල	බාල	බාල
මත	මත	මත
මරණ	මරණ	මරණ
යුග	යුග	යුග
රස	රස	රස
රණ	රණ	රණ
වන	වන	වන

(3) තද්භව ශබ්දප්‍රකෘති.

සංස්කෘත.	මාගධ.	එළු.
අග්නි	අග්ගිනි, අග්ගි	ගිනි, අග
අද්‍ය	අජ්ජ	අද
අණ්ඩ	අණ්ඩ	අඩ
ආකාශ	ආකාස	අහස්
ආඥා	ආණා	ඇණ
ආර්‍ය	අය්‍ය	අයියා
උච්ච	උච්ච	උස්
උෂ්ණ	උණ්හ	උණු
ඌන	ඌන	උනු (අඩු)
ඛඩ්ග	ඛග්ග	කග, කඩු
කදලි	කදලි	කෙසෙල්
කර්ණ	කණ්ණ	කන්
කර්පූර	කප්පූර	කපුරු
ක්ෂීර	ඛීර	කිරි
ග්‍රාම	ගාම	ගම්
චූර්ණ	චුණ්ණ	සුණු (කුඩු)
ජාල	ජාල	දැල්
තාම්‍ර	තම්බ	තඹ
දන්ත	දන්ත	දත්
දුඃඛ	දුක්ඛ	දුක්
ප්‍රාණ	පාණ	පණ
පර්ණ	පණ්ණ	පත්
පාද	පාද	පා
භක්ත	භත්ත	බත්
මාතෘ	මාතු	මව්
මුඛ	මුඛ	මුව
මාර්ග	මග්ග	මං, මඟ
යක්ෂ	යක්ඛ	යක්

සංස්කෘත.	මාගධ.	එළු.
රාත්‍රි	රත්ති	රැ
රශ්මි	රස්මි	රැස්
වාලුකා	වාලුකා	වැලි
වීථි	විථි	වේ, වීදි
ශඞ්ඛ	සංඛ	සක්
ශත	සත	සිය
ශිඛී	සිඛ	සිඛ්, හිස්
සකල	සකල	සියලු
සමුද්‍ර	සමුද්ද	මුහුදු
සුධා	සුධා	සුහු (හුනු)
සූර්‍ය්‍ය	සූරිය--සුරිය	හිරු
ස්තන	ථන	තන

193: ප්‍රාකෘත භාෂාවන් හා සමානවූද එයින් බිඳී ආවාවූද ශබ්දයෝ සිංහල භාෂාවෙහි පැනෙත්.

1. තත් සම.

ප්‍රාකෘත.	සිංහල.
කි	කි (අව්‍යය)
කුමර	කුමර
ජම්ම	ජම්ම (උත්පත්තිය)
තණ	තණ (තෘණ)
දහ	දහ (දහය)

2. තද්භව.

ප්‍රාකෘත.	සිංහල.
අංධාර	අඳුරු
උවමා	උවම් (උපමාව)
කහාවණ	කහවණු

ප්‍රාකෘත.	සිංහල.
තිසා	තිස්
තෙත්තිස්	තෙතිස්
ථුති	තියු (සතුති)
දණ්ඩී	දැන්
දෙඋල	දෙවොල් (දේවාලය)
පඩිමා	පිළිම
පාව	පව් (පාපය)
පඤ්ඤා	පැණ (ප්‍රඥාව)
බහිර	බිහිරි
බම්හණ	බමුණ (බ්‍රාහ්මණ)
භිංග	බිඟු (බමර)
විඤ්ඤාණ	විනැණ (විඥානය)
විශා	විසි
වෙසවණ	වෙසමුණු (වෛශ්‍රවණ)
සංග	හඟ (අඟ-අං)

194. දෙමළ පූර්තුගීස් ආදී භාෂාවලවචනාන්තසම වශයෙන් හා තද්භව වශයෙනුත් සිංහල භාෂාවට වැටී තිබේ.

(1) දෙමළ.

දෙමළ.	සිංහල.	දෙමළ.	සිංහල.
අච්චු	අච්චු(මුද්‍රණය)	නාරෙ	නාර (කිසක්)
අඩි	අඩි (පාද)	නිලෙ	නිල (ධූරය)
අත්තිවාරම්	අත්තිවාරම්	පදක්කම්	පදක්කම
අප්පා	අප්පා	පන්දු	පන්දු
අම්පලම්	අම්බලම්	පළිංකු	පළිඟු
අලි	අලි	පංකු	පංගු
ආණ්ඩි	ආණ්ඩි	පාඩම්	පාඩම්
ආප්පම්	ආප්ප	පාරු	පාරු

දෙමළ.	සිංහල.	දෙමළ.	සිංහල.
ඉඩම්	ඉඩම්	පාලම්	පාලම්
ඉලවු	ඉලව්	පුතුමෛ	පුදුම
උදව්	උදව්	පෝර්	පොර
උරිමෛ	උරුම	පොලිවු	පොලී
කඩෛ	කඩ	මයිර්	මයිල් (ලොම)
කඩිනම්	කඩිනම්	උමල්	ඔලු
කප්පම්	කප්පම්	මූනෛ	මූන (තුඩ)
කාරුවාඩු	කරවල	මූළු	මුළු
කලුදෛ	කලුදූ	වෙඩි	වෙඩි
කාන්දම්	කාන්දම්	වයල්	වෙල
කත්ති	කැති	සාවල්	සැවුල්
කුඩෛ	කුඩ	සීනි	සීනි
කොඩි	කොඩි	සුංකම්	සුංකම්
නංගෛ	නං, නඟා	සෙල්ලම්	සෙල්ලම්
නම්බු	නම්බු	සූදු	සූදු

(2) පුර්තුගීස් භාෂාවෙන් තත්සමවශයෙන් හා තද්භව වශයෙනුත් සිංහල ව්‍යවහාරයට වැටී තිබෙන වචන.

අච්චාරු	ගාස්තු	පෙරගම්, පෙරනම්
අන්නාසි	ගුදිරි, ගුදිරිකෑම	පෝරක
අල්මාරි	ගොරෝස	බත්දේසි
අල්පෙනෙත්ති	ජනේල	බංකු
අලවංගු	ජනේරු	බාල්දි
අලුකුත්තේරු	තඹාක්ක	බූරු
අලුඹුසු	තාච්චි	බේබදු
අලුගෝසු	තාප්ප	බොංචි
අවාත	තාර	බෝක්කු
ආවා	තැබෑරුම	බෝල
ආයා	තීත්ත	මුද්දර
ඇබැර්තු	තිරිඟු	මේස
ඇස්කිස	තීරුව	රංචු

ඉස්තාල	තුවාය	රත්තල
කඩදසි	තෙස්තමේන්තු	රිප්ප
කබා	තොප්පි	රෙකුලාසි
කබුක්ගල්	තෝම්බු	රේගු
කමිස	දියමන්ති	රේන්ද
කරත්ත	දෞෂි	රෝද
කලිසම්	නත්තල්	රෝස
කස්තාන	නෝනා	ලැස්ති
කසාද	පරාල	ලේන්සු
කාණු	පාන්	විනාකිරි
කාමර	පාප්ප	විස්කෝතු
කුස්තුර	පාස්කු	වීදුරු
කුස්සිය	පින්තුර	සපත්තු
කේජු	පිඟුදු	සබන්
කොරල්	පිරිසි	සරම්ප
කෝන්තර	පෙත්සම්	සාක්කු
කෝප්ප	පෙදරේරු	සාය
ගාඤ්චු	පෙනේර	සුමාන

(3) ලන්දේසි භාෂාවෙන් තත්සමවශයෙන් හා තද්භව වශයෙනුත් සිංහල ව්‍යවහාරයට වැටී තිබෙන වචන.

ඉස්කුරුප්පු	ජූලි	බූදල්
ඉස්කෝප්ප	තරප්පු	බූන්දල
ඉස්තෝප්පු	තුරුම්පු	බෙලෙක්
ඔරලෝසු	තෝල්ක	බොජ්නෙඩි
කක්කුස්සි	දුතම්	බෝතල
කන්තෝරු	නොතාරිස්	රපෝර්තු
කනප්පු	පොල්මඃකාර	රාක්ක
කළුකුම්	පෝච්චි	රාමු
කැරකොප්පු	පෙබරවාරි	ලාච්චු
කුළුඩු (කඩු)	බක්කි	වරිච්චි

කුසිතන්සි	බාච්චි	වෙන්දේසි
කේතල	බාල්ක	ඡූකිරි
කෝකි	බුරුම	සොල්දර
		සෑදල

(4) ඉංග්‍රීසියෙන් බිඳී සිංහල ව්‍යවහාරයට වැටී තිබෙනා වචන.

අක්කර	දීසි	පෝනි
ඉජිනේරු	දුසිම	බූසල්
කවිච්චි	පනේල	රෑඩි
කාස්කුරුප්පු	පර්වස්	ලාම්පු
ක්‍රිමිනෙල්	පවුණ්ඩ	වැයින්
ගවුම්	පැන්ස	වරෙන්තු
ගෑස්	පෑන්සල්	සාප්පු
යාර	පෑන්	සිලිම
තඹලේරු	පිඟුරු	සිවිල්

3 වෙනි කාණ්ඩය.

III. වාක්‍යරචනා.

195. ව්‍යාකරණානුකූල ලෙස වචන ගළපා කාරකසහිත ක්‍රියාර්ථයක් ප්‍රකාශකිරීම වාක්‍ය නම්වේ.

කාරක නම් කර්ම, කර්තෘ, කරණ යනාදියයි. ක්‍රියාර්ථයක් ප්‍රකාශකිරීම නම් යමක් ගැන ක්‍රියාවක් හෝ පැවැත්මක් ප්‍රකාශකිරීමයි. එහෙයින් වාක්‍යය තෙම කර්තෘකාරකය, (අවසාන) ක්‍රියාය, යන දෙකකින් නිතර යුක්තවේ. සකර්මක ක්‍රියාවක් හෙවත් කර්මයක් වුවමනාවන ක්‍රියාවක් විනම් කර්තෘ කර්ම ක්‍රියා යන තුනකින්ද යුක්තවේ.

ගොනා දුවයි, යනු අකර්මක වාක්‍යයකි. එහි ගොනා යනු කර්තෘයි, දුවයි යනු ක්‍රියායි. ගවයෝ පැන් බොත්, යනු සකර්මක වාක්‍යයකි. එහි ගවයෝ යනු කර්තෘය, පැන් යනු කර්මය, බොත් යනු ක්‍රියායි.

62. උක්තකර්තෘ හා අනුක්තකර්තෘ.

196. කර්තෘ ප්‍රථමාවිභක්තිය භජනය කළහොත් උක්තකර්තෘ නම් වෙයි, කර්තෘවිභක්තිය භජනයකළහොත් අනුක්තකර්තෘ නම් වේ.

යම් ක්‍රියාවකින් ඒ ක්‍රියාවේ කර්තෘ කියවේ නම් හෙවත් කර්තෘ අසවල් පුරුෂයෙහි අසවල් වචනයෙන් යුක්තය යන බව හැඟේ නම් එයින් කර්තෘ උක්තවේ.

ගවයෝ තණ කති, යන වාක්‍යයෙහි 'ගවයෝ' යනු කර්තෘයි, 'කති' යනු ක්‍රියායි. කති යන මේ ක්‍රියාව ප්‍රථමපුරුෂ බහුවචනයි. මේ ක්‍රියාවේ කර්තෘද ප්‍රථම පුරුෂ බහුවචන බව ක්‍රියාපදයෙන්ම හැඟේ. ඒහෙයින් කර්තෘ උක්තයයි කියත්. මෙහි ගවයෝ යනු ප්‍රථම විභක්තියෙහි වේ.

ගවයන් විසින් තණ කනු ලැබේ, කිවහොත් කනුලැබේ යන ක්‍රියාවෙන් එහි කර්තෘවූ ගවයන් යනු නොකියැවේ. එහෙයින් ගවයන් යනු අනුක්ත කර්තෘයයි කියත්. මෙහි ගවයන් යනු කර්තෘවිභක්තියෙහි වේ.

63. උක්තකර්මය හා අනුක්තකර්මය.

197. කර්මාර්ථය ප්‍රථමා විභක්තිය භජනයකරන කල්හි උක්තකර්මනම් වේ, කර්මවිභක්තිය භජනයකරනකල්හි අනුක්තකර්ම නම් වේ.

ක්‍රියාවෙන් කියවෙන කර්මාර්ථය උක්තයයි කියනු ලැබෙයි, ක්‍රියාවෙන් නොකියවෙන කර්මාර්ථය අනුක්තයයි කියනු ලැබේ.

කොටියා විසින් ගවයා මරනුලැබී, යනමෙහි මරනුලැබී යන ක්‍රියාවෙන් එහි කර්මයවූ ගවයා කියවෙන බැවින් කර්මය උක්තයි. එහෙයින් මෙහි කර්මාර්ථය ප්‍රථමා විභක්තිය භජනයකෙරේ. කොටියා ගවයා මැරී කිවහොත් මැරී යන ක්‍රියාවෙන් ගවයා යන කර්මය නොකියවෙන බැවින් එහි කර්මය අනුක්තයි. එහි කර්මාර්ථය කර්මවිභක්තිය භජනයකෙරේ.

198. කර්තෘකාරක ක්‍රියාවෙන් කර්තෘ උක්තවේ, කර්මකාරක ක්‍රියාවෙන් කර්මය උක්ත වේ.

ස්ත්‍රිහු ගීතයෝ වඩත්, යන මෙහි වඩත් යන්න කර්තෘකාරක ක්‍රියායි, එහෙයින් එහි කර්තෘවූ ස්ත්‍රිහු යන්න උක්ත වේ.

ස්ත්‍රීන් විසින් ගීතයෝ වඩනු ලැබේ, යන මෙහි වඩනුලැබේ යන්න කර්මකාරක ක්‍රියායි, එහෙයින් එහි කර්මයවූ ගීතයෝ උක්ත වේ.

199. කර්තෘ උක්තකල්හි කර්මය අනුක්තයි, කර්මය උක්තකල්හි කර්තෘ අනුක්තයි.

ස්ත්‍රිහු ගීතයෝ වඩත්, යනමෙහි ස්ත්‍රිහු යන කර්තෘ උක්තයි එහෙයින් ගීතයෝ යන කර්මය අනුක්තයි.

ස්ත්‍රීන් විසින් ගීතයෝ වඩනුලැබේ. යන මෙහි ගීතයෝ යන කර්මය උක්තයි, එහෙයින් ස්ත්‍රීන් යන කර්තෘ අනුක්තයි.

64. කර්තෘපදය හා කර්තෘකාරක ක්‍රියාපදය.

200. කර්තෘපදයද කර්තෘකාරක ක්‍රියාවද සමානපුරුෂ වචන භජනයකෙරෙත්.

දුටුගැමුණුරජ ලඞ්කාද්වීපය එකාබද්ධ කෙළේය.
ඒ ස්ත්‍රී පලඳනාව කර පැලඳ නැඟී ගියාය.
රාජපුරුෂයෝ නුවර බෙර ලැවූහ.
"තොපගේ පලඳනාවක් මම නොගනිමි"

201. පුරුෂවාචක කාරකයන් නිසා යෙදෙන අර්ථක්‍රියාවට පුරුෂවාචක ප්‍රත්‍යයද ස්ත්‍රීවාචක කාරකයන් නිසා යෙදෙන අර්ථ ක්‍රියාවට ස්ත්‍රීවාචක ප්‍රත්‍යයද යෙදෙත්.

"දින්පිටියා ඇගේ නාම නොදන්නේ අනික් නාමක් කීය."

"යෙර තැනැත්තී කියන්නී 'ස්වාමීනි සාප්පුමක් ඇතුළේ ලා වටකෙළෙම්'යි කීව."

202. එකාර්ථ නාමපද දෙකක් ද, ත්, යන නිපාතයකින් සම්බන්ධවූකල්හි බොහෝසෙයින් ක්‍රියාව බහුවචනයෙන් වන්නීය.

ගොනාත් අශ්වයාත් වෙලේ තණ කති.
ස්වාමියාද මෙහෙකරුවාද ගමට ගියෝය.

203. එකාර්ථ නාමපද දෙකක් හෝ වැඩිගණනක් හෝ 'හෝ' යන නිපාතාර්ථයෙන් සම්බන්ධවූ කල්හි ක්‍රියාව එකවචනයෙන් වන්නීය.

එළුවෙක් හෝ බල්ලෙක් හෝ එහි නොසිටියේය.
ඌවත් මමවත් අද ගමට යමි.

204. පුරුෂයෝ ප්‍රථම, මධ්‍යම, උත්තම, යන පිළිවෙළින් වාක්‍යයන්හි යෙදෙත්. ක්‍රියා තොමෝ අගින් සිටි පුරුෂයේ බහුවචනයෙන් වන්නීය.

ඌත් තෝත් මමත් ශාස්ත්‍ර උගත්තෙමු.
ඌත් තෝත් ශාස්ත්‍ර උගත්තහු.
ඌත් මමත් ශාස්ත්‍ර උගත්තෙමු.
තෝත් මමත් ශාස්ත්‍ර උගත්තෙමු.

205. සමූහවාචක නාමපදයන් හා යෙදෙන ක්‍රියාව එකවචනයෙන්ද බහුවචනයෙන්ද විකල්පවශයෙන් වන්නීය.

"එපවත් ඇද් ලොල්සහගණ පැරද්."
"දෙමළ සේනාව ඒ ඒ දිග දුවන්ට වන්හ."
"එසගගණ මේලෙසින් පැවසූ."
"එවෙත් සිව්යෝ නොයෙක් දුසූ සෙත්."

206. ප්‍රකෘතියෙන් බොහෝදෙනෙකුන් වාච්‍යවන ශබ්දයන් හා සමග යෙදෙන ක්‍රියාව එක වචනයෙන් යෙදේ.

"මහදෙනෙන් කෙලෙසුන් වැනසී."
"මහජනතෙමේ ඔබ පුතු මැරුවමැනවයි රජහට කීය."

207. කෙනෙක්, අයෙක්, යන නාමයන් හා යෙදෙන ක්‍රියාව බහුවචනයෙන් වන්නීය,

"කෙනෙක් වැනසෙති හැඟි හුල්වල."
"අයෙක් පවසති ඔහුගෙ වෙසෙසක්"

208. වහන්සේ යන ගෞරවාර්ථ නාමපදය හා යෙදෙන ක්‍රියාව බොහෝසෙයින් බහුවචනයෙන් වන්නීය.

"මහබෝසතාණන්වහන්සේද ගොස් එකත්පස්ව උන්හ."

209. ප්‍රකෘතියෙන් බහවර්ථවූ ජාතිවාචක ශබ්දය හා යෙදෙන ක්‍රියාව බොහෝසෙයින් එකවචනයෙහි වන්නීය.

"සුරන් බුදුරැස් ලොව වසාසිටි."
"දිවි පබසර කැලුම් එකවිට."

210. ගෞරව පිණිස යොදනලද බහවර්ථප්‍රත්‍යය ඇති එකාර්ථනාමයන් හා යෙදෙන ක්‍රියාවද බහවර්ථප්‍රත්‍යයෙන් යුක්තවන්නීය.

"රජ්ජුරුවෝ තිමෙන්ද මහෞෂධ පණ්ඩිතයෙනි තිහ."
"කාන්ද පණ්ඩිතයෝ පලස පලාපැසෙක ලාලා හැවූහ."

211. අර්ථයෙන්ද ප්‍රත්‍යයෙන්ද බහුත්වය නොහඟවන නාමය හා යෙදෙන ක්‍රියාව කිසිවිටෙක ගෞරව පිණිස බහවර්ථප්‍රත්‍යය ගනී.

"අමරා දේවීත් නොකිපිම 'කෑද යහපත් නොවි නම් කැවුම් කැවමැනවැයි ස්වාමීනි' කියා අතට දුන්හ."

212. ක්‍රියා ප්‍රත්‍යයෝ කිසිවිටෙක නාමපදයන් අගට යෙදී වූ ධාතුව පිළිබඳ ක්‍රියා අර්ථය ප්‍රකාශ කෙරෙත්.

"තෝ කාවරෙහිදැයි යකින්න විචාළසේක."
"යකින්නකිමි ස්වාමීනි කිව."

65. කර්මාර්ථපදය සහ කර්මක්‍රියා.

213. කර්මාර්ථපදයද කර්මකාරක ක්‍රියාවද සමාන පුරුෂවචන භජනය කෙරෙත්.

ව්‍යාඝ්‍රයන් විසින් මිනිස්සු මරන ලදහ.
මා විසින් සෙර තැනැත්තී දක්නාලැබී.
සතුරන් විසින් තෝ මරනුලබන්නෙහි.
රජු විසින් අපි මුදනුලබන්නෙමු.

උ ප ග්‍ර න්ථ ය.

ශුද්ධකොට ලිවීම පිණිස දෙනලද
දෝෂසහිත වාක්‍ය.

(මෙහි වාක්‍ය අගට යොදනලද ඉලක්කම්වලින් එහි දෝෂ ප්‍රකාශවන සූත්‍ර දතහැකිවේ.)

1. මත්ස්‍යයෝ ජලයේ සන්වාරයකෙරෙත්. 66
2. වනයේ තෘන පක්ෂීාදිය මලානිකාවිය. 68
3. ශරීරයෝ නස්නා සවභාව ඇත්තේය. 200
4. ඒ විලෙහි රාජහංසයෙක් වෙසෙත්. 200
5, ඉන්දියාවට මහත් දුර්භික්ෂයක් පැමිණිය. 23
6. බිසව්තොමෝ මූලාව ඇව්දිනේ ඒ ගමට ආවා. 201
7. හසනිතෙම සිවලුන් විසින් මරනලද්දේය. 213
8. ජයවර්ධනපුර යනු කෝට්ටේට නමකි. 23
9. බලලත් කොටියත් රූපාකාරයෙන් සමානවන්නේය. 202
10. නිස්වලබව ශූවණැත්තන්ගේ ගුණාංගයකි. 99
11. සිංහයා සත්වමාන්සකා ජීවත්වන්නෙකි. 67
12: තොපි කොතන සිට ආවේද ? 200
13. ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ නොආවෝය. 203
14. බ්‍රාහමනයෝ කුලධර්මය රක්ෂාකෙරෙත්. 69
15. පිරුණු කලයේ දිය නොසෑලේ. 184&87
16. රජ්ජුරුවෝ ඒ බව අසා කිපියෝය. 210
17. බල්ලෙක්ද මිත්‍රයෙක්ද මා සමග ගියේය. 202
18. මා විසින් කෙවිළන්ගේ කථාව අසන ලද්දේය. 95
19. උෂ්ණ රටවල වෘක්ෂයෝ මනාසේ වැඩේ. 200
20. මගේ වත්තේ වැට ඔව්හු බින්දේය. 200
21. සිරිවඩ්ඩණනම් සිටානකෙනෙක්වූහ. 122
22. හෙතෙම විනා මේ වැඩ කවරකුට කළහැකිද ? 130
23. ඇතම් කෙනෙක් මාගේ ගුණ ප්‍රකාශකරයි. 207

24. ඔහුගේ මරනය ලත්විය. 68&67
25. සිංහයා විසින් බල්ලෝ මරනලද්දේය. 213
26. අද හින්දුවරුන්ගේ සාන්වත්සරික මඞ්ගල්‍ය දවසකි. 67
27. මම ධම්මණීතිය මන සේ උගතිමි. 71
28. දුර්ජනයන් කෙරෙහි කවර විශ්වාසයක්ද ? 70
29. හෙතෙම කිසි දුෂ්කර්මයක් නොකෙළේය. 72
30. මම මගේ සතුරෝ නිසා රටහැර ආමි. 139
31. මව්පියෝ කළ වරදට දරුවෝ පලවිඳිත්. 142
32. දරුවෝ සමග දෙමහල්ලෝ ගමට ගියෝය. 143
33. "තී හොරෙක්දැ"යි ඒ ස්ත්‍රියගෙන් මම ඇසිමි. 119 (2)
34. එළුබෙදුවක් ගුහාවට වැදුණේය. 120 *(3)*
35. මේ පාරවල්වල නිතරම හොරු හැසිරෙත්. 159 (24)
36. මගේ පොත තිබුන තැනම තිබෙන්ට ඇරපන්. 184
37. මම මගේ මිත්‍රයෝ සැටුව ගමට යමි. 143
38. මනුෂ්‍යයෝ කරමලෙන් ආශ්වාස ප්‍රාශ්වාසකරත්. 18
39. මැනියෝ ශොකයට පැමිණ අඩමින් සිටියා. 127&210
40. ගිනිකඳු අසල උණුදිය උල්පත් දක්නාලැබේ. 82.
41. වෙසක්මාසය ගෙඩිපැසෙණ කාලය වන්නේය. 188
42. මේ අසල තනබිම් බොහෝය. 78.
43. පස්දුම්කෝරලය කඳුසහිත පලාතකි. 88
44. ඌ වළට ගොස් එද්දී මැව්වලක වැටුණේය. 97
45. මම කලුපාට ගොනෙක් මිලට ගතිමි. 97
46. යාපනය දෙමලුන්ට අයත්වූ කාලය නිශ්චයකොට කිය නොහැකිය. 87&99
47. පේදුරුත් උඹත් අද පාඨශාලාවට ගියේද ? 204
48. මමත් ලමයත් නුවරසිට ආවෙමි. 204
49. උඹත් ජේම්සුත් හෙට පාඨශාලාවට යන්ට ඕනෑ. 204
50. එලුව නම් ශුද්ධසිංහලයි. 83
51. පෘථිවිය ගොලාකාර වස්තුවකි. 89
52. නුඹ කරණ වැඩේ ඉවරද ? 186
53. මේ පලාතේ නරියෝ ගැවසෙත්. 130
54. තොපි ගවයෝ නොමරව්. 138

KOLLUPITIYA PRESS COLOMBO.